
# THE WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY

ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව

July 2002



# රුහුණු විරුවන් සමරා රජගහ නුවරක් වූ මාතර...



පිරිත් සජ්ජායනයට මොහොතකට පෙර...



පිරිත් සජ්ජායනය ශ්‍රවනය කරන රණවිරු ඥතීන්...



පිරිත් සජ්ජායනයෙන් පසු පිරිත් නූල් බඳිමින්...



දානය සඳහා ස්වාමීන් වහන්සේලා වැඩම කරවීම...



ස්වාමීන් වහන්සේලාට දානය පිරිනමන අවස්ථාවක්...



දකුණු පලාත් රණවිරු සංගමය පිහිටු වීමෙන් අනතුරුව සංවිධායක
කමිටුවට පත්වූ රණවිරු පියෙක් සභාව අමතමින්...

# THE WHITE HACKLE

JULY 2002, VOLUME 09 NO. 03 33RD ISSUE




***1 ශ්‍රීලපාහ සිංහල අවුරුදු අසිරිය***

පිටුව 6

***1 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදව 52 වන සංවත්සරය***

පිටුව 11





***ආබාධිත රණවිරුවන්ට පරිත්‍යාග***

පිටුව 24

## Headlines


වීර වික්‍රම විභූෂණය 3

මත්පැතට දියවී යන තරුණ්‍යය 4

මාතර වෙහෙරහේන විහාරස්ථාන පුණ්‍ය භූමියේ සිට වයිට් හැකල් සහරාව ට 5

ඇන්ටෙනාවක් සවිකිරීමේදී සැලකිය යුතු කරුණු 7

පාබල බණ්ඩ සාමූහික පුහුණු පාඨමාලාව "ඩී"කණ්ඩායම 10 ශ්‍රීලපාහ 8

වයිට් හැකල් සහරාව දයකත්වය ලැබූ අයවලුන් 14

51 වන සේනාංක බක්මහ උළෙල ජයග්‍රහණය 6 ශ්‍රීලපාහ සතු වූ වගයි 17

ආබාධිත සෙබලුන්ගේ මෙහෙවරක් 19

10 වන ශ්‍රී ලංකා පාබල හමුදව පැවැත්වූ සිංහල අලුත් අවුරුදු උත්සවය 22

හල් අරඹේ සිට 28

යුධ හමුද අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා ශුරතාවය 2002 වසර 30


**කවරයේ කථාව :**

රණවිරු ඥතීන්ගේ සහභාගීත්වයෙන් මියගිය රණවිරුවනට සෙත් පැතීමේ උත්සවය - මාතර වෙහෙරහේන විහාරස්ථානය -

PRINT WELL - 244 DAM STREET, COLOMBO 12.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

THE WHITE HACKLE
SRI LANKA
LIGHT INFANTRY MAGAZINE

**Col of the Regt.**
Maj Gen SHS Kottegoda WWV, RWP, RSP,USP, ndc

**Centre Commandant**
Col R.M.D. Rathnayaka RWP, RSP, psc

*The White Hackle, Staff*

Editor-in Chief - Co RMD Rathnayaka RWP, RSP, psc

Assistant Editor - Lt Col S C Karunarathne RSP, SLLI

Associate Editors - Lt Col C Wimalasiri SLLI
Lt Col SWMTB Hulugalle SLLI
Capt THS Aravinda, RWP, RSP SLLI

Chief Consultant - Maj Gen. SHS Kottegoda WWV, RWP, RSP, USP, ndc

Honorary Consultants - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd), (Reg Force)
Brig AER Abeysinghe KSV (Rtd) (Vol Force)

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry.

Manuscripts of interest to the Regiment are invited. Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 855204 or 855356 - 60 Extn. 7380 or 7404.

Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry.

Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94.

Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the Thirty Three issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien" "I Serve". Let 'WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල්' සඟරාවේ තිස් තුන්වන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක. තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල්' සඟරාවේ ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සඟරාව' ශ්‍රී ලංකා යුධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන ජ්‍යෙෂ්ඨතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් ත්‍රෛමාසිකව පළ කරනු ලබයි.

මෙම ජ්‍යෙෂ්ඨ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාදිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල්' සඟරාව වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල්' සඟරාවේ පළ කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය වන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදාවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

Feedback,
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.

# වීර වික්‍රම විභූෂණය





ලුතිතන් (උපා) පීඩීජ්ආර් නානායක්කාර ඩබ්ඩබ්වී ශ්‍රීලපාහ

සක්‍රිය සේවයේ යෙදී සිටිය දී ස්වේච්ඡවෙන් ඉදිරිපත් වී සතුරාට මුහුණ පා සිය සගයන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ හෝ සිය බලසේනාවේ කාර්‍යය අරමුණු මුදුන්පත් කර ගැනීම පහසු කරවීමේ අභිප්‍රායෙන්, ආත්මාරක්ෂාව ගැන නොතකා තමා විසින්ම කරනු ලබන වික්‍රමාන්විත වූ ද අභීත භාවය, ප්‍රදර්ශණය කෙරෙන්නා වූද, සෛනික ස්වභාවයේ උත්කෘෂ්ඨ ක්‍රියා අරබයා හෝ දියෙහි ගිලීමට හෝ, ගින්නට ගොදුරු වූ ජීවිත බේරා ගැනීමේ දී ද, අන්තරාය ගැන හෝ නොතකා, හුදු දයා පරවශම උත්කෘෂ්ඨ ක්‍රියාවක නොහොත් ක්‍රියාදමයක යෙදෙන්නා වූ ද, මෙහි මින් මතු නිර්ණය කොට දක්වෙන රෙගුලාසි වල සඳහන් වන නියමයන් හා කොන්දේසි අනුව යුද්ධ හමුදාධිපති හෝ නාවික හමුදාධිපති විසින් යෝග්‍ය යැයි නිර්දේශ කරනු ලබන්නා වූ ද, ශ්‍රී ලංකා ජනරජයේ යුද්ධ, නාවික හා ගුවන් හමුදාවන්හි ස්ථිර හා ස්වේච්ඡා බලසේනාවල නියුක්ත සෑම තරාතිරමකටම අයත් සියළුම පුද්ගලයන්ට මෙම පළදනාව ප්‍රදානය කළ යුත්තේ ය.

පළදනාව පිරිනැමීම අතිගරු ජනාධිපති තුමියගේ අත්සන සහ නිල මුද්‍රාව යටතේ කෙරෙන කැඳවීම් නියෝගයක් අනුව පැවැත්වෙන විශේෂ සම්මාන පිරිනැමීමේ උත්සවයක දී අතිගරු ජනාධිපති තුමිය විසින් පෞද්ගලිකව ම සිදු කළ යුතු ය.

පළදනාව පිරිනමනු ලැබූ අයවළුන්ගේ නම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළදනා ලැබූ සියළු දෙනාගේ ම නාම ලේඛණයක් අතිගරු ජනාධිපති තුමියගේ විධානය යටතේ පවත්වා ගෙන යා යුතු ය.

වීර වික්‍රම විභූෂණය ලාභියකුට ම තම නමට පසුව 'ඩබ්ලිව් ඩබ්ලිව් වී' යන සංකේතය පාවිච්චි කිරීමට හිමිකම් ඇත්තේ ය.

වීර වික්‍රම විභූෂණ පදක්කම් ලාභී:-

1997 ජූනි මස 10 වන දින එල් ටී ටී ඊ ත්‍රස්තවාදීන් විසින් 55 වන සේනාංක මූලස්ථානයට සහ එහි කාලතුවක්කු ස්ථානගතකර තිබූ ස්ථානයට ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම අවස්ථාවේ දී එහි සේනාංක මූලස්ථාන කාර්ය මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ නිලධාරී ආරක්ෂක මුරයන් පමණක් ස්ථානගතව සිටි අතර, 500 ක ගෙන් පමණ සමන්විත ත්‍රස්ථවාදීන් පිරිසක් කාලතුවක්කු මෝටාර් සහාය ඇතිව මෙම ප්‍රහාරය එල්ල කරන ලදී. මෙම ත්‍රස්තවාදී ප්‍රහාරය දහවල් 0230 සිට එදින 1830 දක්වා කාලය තුළ අඛණ්ඩව පැවැති අතර, මෙම ප්‍රහාර හමුවේ සහායක හට පිරිස් පැමිණෙන තෙක් එම කඳවුර බේරා ගැනීම සඳහා තම පුද්ගලික අවි උපයෝගී කර ගනිමින් ත්‍රස්තවාදීන් සමග සටන් කිරීමට එහි සිටි කාර්ය මණ්ඩලයට සිදුවන ලදී. තව ද මෙම සේනාංක මූලය වටනියාව ඉදිරි ආරක්ෂක වලල්ලට නුදුරින් පිහිටා තිබුණි. සේනාංක මූලය විනාශ කිරීම මෙම ප්‍රහාරය එල්ල කළ ත්‍රස්තවාදීන්ගේ අරමුණ විය. මෙම ප්‍රහාරයේ අවසාන අවස්ථාව වන විට සේනාංක මූලස්ථානය තුළ තුවාල ලත් නිලධාරීන් / සෙනින් 20ක් පමණ සිට ඇතත්. සහායක හට පිරිස් පැයිණෙන තෙක් ප්‍රතිප්‍රහාර එල්ල කරමින් සේනාංක මූලස්ථානය ආරක්ෂා කර ගැනීම ඔවුන්ගේ එකම අභිලාශ විය. මේ අවස්ථාවේ පදක්කම් ලාභී නිලධාරී විසින් කැපී පෙනුන නායකත්වයක් සතුරා අභිමුඛයේ පෙන්වන ලදී. ශාරීරික හා මානසික ධෛර්යය නිසා සේනාංක මූලස්ථානය වටා තිබූ ආරක්ෂක පවුරේ ස්ථානගතව සිටි ත්‍රස්තවාදීන් වෙත ක්ෂණිකව ප්‍රහාරයක් එල්ල කිරීමට තම හට පිරිසට අණදුන් අතර, එම මොහොතේ මෙම නිළදරිගේ ආත්ම ආරක්ෂාව ගැන තැකීමක් නොකරන ලදී. පසුව ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද සුළු අවි ප්‍රහාරයකට ලක්ව මෙම නිලධාරිගේ දෑත් තුවාල වන ලදී. මෙම නිලධාරී සිදුකල නිර්භීත ක්‍රියාව හුදෙක් 55 වන සේනාංක මූලස්ථානය 1997 ජූනි මස 10 වන දින ත්‍රස්තවාදීන් ගෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණ ඇතිවය.

මෙමම හාරදූර කටයුත්ත මැනවින් තේරුම් ගෙන 55 වන සේනාංක මූලස්ථානය බේරා ගැනීමේ අරමණ ඉටු කර ගැනීමේ අභිප්‍රාය පෙරටු කර තම හට පිරිසට අණදෙමින් සහායක හට පිරිස් පැමිණෙන තෙක් මහත් කැපවීමෙන් සහ අධිෂ්ඨානයකින් යුතුව තම ජීවිතය පරදුවට තබා සටන් කල මෙම නිලධාරී හට 'වීර වික්‍රම විභූෂණ' පදක්කම පිරිනමන ලදී.

# මත්පැනට දියවී යන තාරුණ්‍යය

මත්පැන් භාවිතය අද සීග්‍රයෙන් ව්‍යාප්ත වී ඇති ගැටළුවක් බවට පත්වී තිබෙන්නේ ඊට නතුව තරුණ පරපුරේ වර්ධනයේ වේගයක් දක්නට ලැබෙන නිසාය. නිරන්තරයෙන් මත්පැන් ලබා ගැනීමත්, මත්පැන් ශරීර ගත වීම නැවතු විට එම පුද්ගලයා ශාරීරික හා මානසික වශයෙන් දුර්වලතාවයන්ට පත්වීම හා එම දුර්වලතා මග හරවා ගැනීමට නැවත මත්පැන් ශරීරයට ලබා ගැනීමට, ඇබ්බැහි වීම මූලික ලක්ෂණයක් ය.

මේ ආකාරයෙන් මත්පැනට ඇබ්බැහි වූවෝ ඊට දැඩි ගිජු බවක් දක්වන අතර, දවසේ යම් කාලසීමාවක්, එනම් නිශ්චිත වේලාවක් තුළ මත්පැන් භාවිතා කරති. එය මත්පැනට ඇබ්බැහි වූවන්ගේ දින චර්යාවේ අනිවාර්ය අංගයක් බවට පත්වී ඇති අතර, ඇතැම් විට එම කාල සීමාවන් තුළ මත්පැන් ශරීරගත නොවූවහොත් එමගින් ශාරීරික වශයෙන් හා මානසික වශයෙන් යම් යම් අවපාතනයන්ට ගොදුරුවීමේ ප්‍රවණතා වැඩි වේ. එසේ පානය කරන මත් පැන් ඉතා ඉක්මනින් රුධිර සංසරණයට එකතු වී පරිවෘර්තිය ක්‍රියාවලියට භාජනය වී පෙනහලු මාර්ගයෙන් ඉන් කොටසක් ඉවත් වේ.

අධික ලෙස මත් පැනට ඇබ්බැහි වූවන්ගේ ශරීර එක්තරා ප්‍රමාණයකින් ඊට ඔරොත්තු දීමේ ශක්තිය ගෙඩනැගී ඇති අතර, ඔවුන්ගේ රුධිරයෙන් මත් පැන් ඉවත් වූ විට ඔවුනට විවිධ රෝගාබාධ ඇති වේ. වෙව්ලීම, ඇඟ හිරිවැටීම් හා ඇඟ පණ නැතිවීම, කරකැවිල්ල, ඔක්කාරය, දහඩිය දැමීම, අධික රෝග ලක්ෂණ වේ. ඔවුන් නැවත මත්පැන් භාවිතා කිරීමෙන් පසු මේ රෝග ලක්ෂණ නැති වී යයි.

මත්පැන් භාවිතයෙන් සිදුවන අනෙකුත් අහිතකර ප්‍රතිඵල රාශියකි. ශාරීරික, මානසික ආබාධ මෙන්ම සමාජයීය වශයෙන් සිදුවන ගැටළු ද ඉන් ප්‍රධාන වේ. මත්පැනට ඇබ්බැහි වූවෝ කිසි විටෙකවත් මනා සෞඛ්‍යමත් භාවයකින් යුක්ත වූවෝ නොවෙති. මොළය, අක්මාව ,සහ වෘෂණ කෝෂවලට මත් විෂ බෙහෙවින් බලපාන අතර, එමගින් සිදුවන ආබාධ බොහෝ වේ. මත්පැනට ඇබ්බැහිවූවන්ගෙන් 10% 15% ක් සිරෝශියා රෝගයෙන් පෙළෙන බව අද ඔප්පු වී තිබේ. එපමණක් නොව ඔවුන් පෝෂණය ගැන අඩු සැලකිල්ලක් දක්වන හේතුවෙන් විටමින් සහ පෝෂණ ඌණතාවයෙන් ද පෙළෙති. ලිංගික වශයෙන් සිදුවන ආබාධ මෙන්ම පෞරුෂයේ හීන බව ආදිය ද ශාරීරික වශයෙන් සිදුවන ආබාධ ලෙස හැඳින්විය හැක.

මානසික වශයෙන් සිදුවන ආබාධයන් අතර, බොහෝ විට අමතක වීම සිහිමද ගතිය කලහකාරී බව සහ නොසන්සුන් බව අධිකව දැක්විය හැකිය. මොලයේ ඇති සියුම් පටකයන්ට හානි පැමිණීම මෙයට ප්‍රධාන හේතුව වන අතර, මෙමගින් මානසික වශයෙන් අවපාතයන්ට ගොදුරුවන අවස්ථා ද නැතිවා නොවේ.

සමාජයීය වශයෙන් ද ගැටලු බොහෝමයක් මත්පැනට ඇබ්බැහි වූවන් මගින් හට ගෙන ඇති බව සුලභ කරුණකි. ලිංගික අපචාර, දූෂණ, වංචා මෙන්ම හදිසි අනතුරු ආදීන්ට බොහෝ විට හේතු වන්නේ මත්පැනට ඇබ්බැහි වීමයි. ලිංගික අපචාර සහ දූෂණ සිදුකිරීමේ දී මත්පැන් භාවිතයෙන් පසුව එවැන්නකට යොමු වී ඇති අවස්ථා බොහෝ ය. හදිසි අනතුරු අවස්ථාවල දී බොහෝ විට මත් පැන් භාවිතය හේතු සාධක වී ඇත.

පවුල් සංවිධානය තුළ ඇති වන ගැටලු හා ආර්ථිකය කඩා වැටීමට ද මත් පැන් ප්‍රබල හේතුවක් වී තිබේ. මෙමගින් බොහෝ විට අපහසුතාවයන්ට පත් වන්නේ දූ දරුවන් ය. මත්පැන් භාවිතය හේතු කොට ගෙන පවුලක මව්පියන් කලහා කිරීමේ දී එමගින් දැඩි ලෙස පීඩා විඳින්නේ දරුවන් ය. ඔවුන්ගේ පෝෂ්‍ය හීනවීම සමාජයීය වශයෙන් ඉදිරිපත් වීමේ ප්‍රවණතාවය අඩුවීම ආදී ගැටලු රාශියකට ඔවුන් මැදි වේ.

එමෙන්ම තරුණ පරපුර මත්පැනට නැඹුරු වීම වැඩි ප්‍රවණතාවයක් දක්නට ලැබීම අද මුහුණ පා ඇති තවත් ගැටලුවකි. තාරුණ්‍ය රටක ජිවනාලිය වන අතර, මත්පැනට දියවී යන තාරුණ්‍යය, රටක සංවර්ධනයට මෙන්ම පැවැත්මට සිදුකරන්නේ දැඩි හානිකර තත්ත්වයකි. එය මුදලින් කිසිදු ලබා ගත නොහැකියි.

පොතපත ඇසුරෙන්
සෙ/306877 කෝප්‍රල් වික්‍රමසිංහ එන්
3 ශ්‍රීලපාහ පාලන කණ්ඩායම
ගුවන් සංක්‍රමික බලසේනාව

## රණවිරුවන් වෙත කෙරෙන සුහද ඇරයුමකි

රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය ක්‍රීඩා අරමුදල සහ ආබාධිත රණවිරුවන්ගේ සුභසාධන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන සම්පත්වල හිඟතාවය මඟහරවා ගැනීම පිණිස නුදුරු අනාගතයේ දී පැවැත්වීමට බලාපොරොත්තු වන නාට්‍ය සංදර්ශන, ලොතරැයි දිනුම් ඇදීම්, හා සංගීත සංදර්ශන මාලාවක් සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අප සැම සාදරයෙන් අපේක්ෂා කරමු.

"හදවතින් අප යුධබිමේ ඔබ තනිකලේ නැත කිසිදිනේ"

ස්තූතියි

රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ
පනාගොඩ

# මාතර වෙහෙරහේන විහාරස්ථාන පුණ්‍ය භූමියේ සිට වයිට්හැකල් සඟරාවට .

## රණවිරු ඥාතීන්ගේ සහභාගීත්වයෙන් මියගිය රණවිරුවනට සෙත් පැතීමේ උත්සවය මාතර වෙහෙරහේන විහාරස්ථානය - 2002 . 04 . 05 සහ 06 දිනයන්හි.

රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදව යටතේ පාලනය වන ශ්‍රීලපාහ ඒකකයත් සමගින් ක්‍රියාන්විත රාජකාරියෙහි නිරතව සිටියදී මියගිය / අතුරුදහන්වූ වීරෝධාර රණවිරුවන් සිහිපත් කරමින් පැවැත් වීමට තීරණය කොටගත් දනමය පිංකම් මාලාවේ මංගල අඩියර වශයෙන් දකුණු පලාතට ආවේණික වන පරිදි එම පලාතේ ජීවත්ව සිට මියගිය / අතුරුදහන් වූ වීරෝධාර රණවිරුවන් 504 දෙනෙකු සිහිපත් කරමින් ඔවුන්ගේ සිය ඥාතීන් මාතර වෙහෙරහේන පුරාණ රජමහා විහාරස්ථානය වෙත ගෙන්වා 2002.04.05 වන දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශණයක් පවත්වා පසුදින දහවල් සපිරිකර සංඝගත දක්ෂිණාවක් සංඝයා වහන්සේලා 50 ස් නමක් විෂයයෙහි පිරිනැමීම ඉතා සාර්ථක අයුරින් පවත්වන්නට යෙදුනු වග මේ අයුරින් හෝ හෙළිදරවු කිරීමට අවස්ථාවක් සැලසීම මමද ලද භාග්‍යයක් කොට සළකමි.

නිවහල් දේශයක් ගොඩ නැංවීමේ උදරතර හැඟීම් වලින් යුතුව අභිමානී වූ සිතුවිලි හදවතෙහි පෙරදරි කොටගත් මෙම වීර සෙම්පතියන් එද යුධ බිමට තිළිණ කල එම දයාබර දෙමව්පියන්ගේ මනසේ මොන තරම් නම් වූ ජාතික හැඟීමත් ජාතික භක්තියක් රැඳී තිබෙන්නට ඇද්ද යන්න හා මෙම මව් භූමිය රැක ගන්නට එඩිතරව පෙරට පැමිණ යුධ බිමේ සියළු දුක් ගැහැට විඳදරා ගනිමින් තම ජාතියට සිදුවන විනාශකාරී වූ අපරාධයන් වලක්වා ලන්නට දිරිය විරිය ඇති කර ගනිමින් තම ජීවිතයට ඇති ආශාවද පසෙක ලා මෙම රණ වීරයින්ගේ සිත් වලද මොන තරම් නම් වූ අදහස් හා සිතුවිලි සමුදයක් රැඳී තිබෙන්නට ඇද්ද යන්න මෙම පිංකම් මාළාව සදහා සහභාගී වූ රණවිරු දෙමව්පිය නෑ හිතවතුන්ගේ පෙනුමෙන්, දුටු අංග ලක්ෂණ වලින් හා ඔවුනගේ මුවින් පිටවුන වේදනාකාරී හැඟීම් තුලින් සටහන්ව තිබූ බව ම විසින් ද සටහන් කරනුයේ ඉතා වේදනාවෙනි. කම්පාවෙනි. එය තව තවත් විග්‍රහ කර සටහන් තබන්නට හැකියාවක් ඇති මුත් 'වයිට් හැකල්' සගරාවේ කතෘතුමාගේ සහ එම කාර්‍ය මණ්ඩලයේ පහසුව තකා එම වැකි පෙල කෙටියෙන් නිමා කරන්නයි මගේ අදහස.

සුවහසක් වූ බෞද්ධ සිංහල ජනගහයෙන් පිරිපුන් මේ දේශය එද රැක ගන්නට දුටුගැමුණු වළ ගම්බා වැනි වීර නරේන්ද්‍රවරුන් විසින් දරු උත්සාහයන්ගේ ප්‍රතිඵළයන්ද මේ අවස්ථාව තුල මා හට සිහිපත් කළ යුතුව ඇති අතර, එහිදී මූලික වශයෙන් කිව හැකි වන්නේ දුටුගැමුණු එළාර ද්වන්ද සටන පිළිබඳවයි. එමගින් මෙම දේශයට අති විශාල ගෞරවයක් මෙන්ම ස්වකීය නිදහස් භූමියක නිවහල් භාවය පිලිබිඹු වී ඇති බව සටහන් තබන්නෙමි. එලෙස වූ දරුණු ආක්‍රමණයක් දේශයේ සිංහල ජාතියට එල්ල වෙද්දීත් එය රැක ගත් වීරෝධාර රණශූරයින් අද ද අප මනසේ රැඳී තිබෙනුයේ කුමන සාධකයක් පදනම් කරගෙන ද යන්න දූත් ඔබ මනැස ට ද එක්ව ඇතැ යි මා සිතමි. එද එලෙස අසිපත්, දුණු හෙල්ල, ඊතල වලින් කරන ලද සටන් වෙනුවට එම තත්වය හාත්පසින්ම වෙනස් මෙන්ම ස්වයංක්‍රීය අවි ආයුධ වලින් හා විනාශකාරී බෝම්බ හා ගුවන් ප්‍රහාර, ශෙල්වෙඩි, මිසයිල එක්කාසු වූ තාක්ෂණයෙන් දියුණු වූ ලෝකයක් තුල මාරාන්තික වූ යුද්ධයක් කිරීමට අප විරුවන් හට සිදු වීම ඇත්තෙන්ම පුදුමයට කරුණක් නොවනු ඇත.

මෙලෙස තාක්ෂණයෙන් දියුණු වූ ලෝකයක ප්‍රකෝපකාරී යුද්ධයක නියැලී අති බිහිසුණු වූ සටනක් කිරීමට තරම් ශක්තිමත් බළයක් සහ ජාතික හැඟීමක් ලබාදුන් අප දෙමව්පිය ගුරු බවතුන් හට නිරායාසයෙන්ම මෙම අවස්ථාවේදී ගරුකල යුතුව ඇත. එසේ එම කරුණු කාරණා සියල්ල පිළිබිඹු වන අයුරින් පෙන්වා දෙමින් සියළු බෞද්ධ චාරිත්‍රවලට මුල්තැන දෙමින් තම දයාබර පුතනුවන්ගේ, තම සෙනෙහෙබර ස්වාමී පුරුෂයාගේ, සදදරණීය සොහොයුරාගේ වියෝවෙන් වේදනාවට සහ කම්පාවට පත් ව සිටින දයාබර දෙමව්පියන්, සෙනෙහෙබර බිරින්දවරුන්, සහෝදර සහෝරියන් ඥාතීන් මෙම පුණ්‍ය කර්මය පැවැත්වෙන ස්ථානය වෙත කැදවා මෙලෙස පිංකමක් සිදු කිරීම එම වීරෝධාර රණවිරුවන් හට පිං පිණිස වනවා මෙන්ම ඉහත කී නෑද හිතමිතුරන්ගේ මනසට යම් පමණින් හෝ සහනයක් වනවා නොවනු මානය. එසේම එය විශාල පරිශ්‍රමයකින් යුතුව පවත්වන්නට යෙදූ, රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු අධිපති තුමන්, සේනාවිධායක තුමන්, ඇතුළු සියළුම නිලධාරී සෙසුනිළයන් හටත්, වෙහෙරහේන රජමහා විහාරස්ථානයේ ගරුනායක ස්වාමිපාදයානන් වහන්සේටත්, අනෙකුත් ගරුතර මහා සංඝරත්නයටත්, දයක කමිටුවටත්, ප්‍රදේශවාසී බෞද්ධ බොදු බැති සැමටත්, නන් අයුරින් සහාය දුන් සියළු දෙනාටත් අති විශාල ගෞරවයක් මෙන්ම ආඩම්බරයක් වනු ඇත. එදින එම විහාරස්ථානයේ පැවැත්වුන මෙම පිංකම හුදෙක්ම රට ජාතිය ආරක්ෂා කිරීමෙහිලා අනගිභවනීය යුග මෙහෙවරක් ඉටු කරමින් සිටියදී රුදුරු ත්‍රස්ථවාදීන්ගේ වෙඩි ප්‍රහාරයන්ට ලක් වී මියගිය වීරෝධාර රණවිරුවන් වෙනුවෙන් යන වග සනිටුහන් වෙද්දී දීර්ඝ කාලයක් තිස්සේ වැසි වලින් තොරව තිබූ මුලු දකුණු පලාතම තෙත්පැහැ ගන්වමින් 2002. 04.04 ව දින සවස් වරුවේ ඇදහැලුන වර්ෂාව තුලින් අපට කියා පෑවේ දෙවියන්ගේ ආශිර්වාදය ද මේ සඳහා ලැබෙන බවක් යැයි පැහැදිලිවම කිව හැකිය. එපමණක්ම නොව එම ප්‍රදේශය පුරාවටම තිබූ තුරුලතාවන් නිසොල්මනේම පිරිත් සංජ ජායනාවට සවන් දෙනවාක් මෙන් නිසොල්මන්ව තිබෙද්දී මා සිත වෙලා ගත්තේ මෙම අසරණ දෙමව්පියන්ද දරුවන් පමණක් නොව විකසිත වූ පරිසරයද මෙම මහගු අවස්ථාව ඉතා උසස් අයුරින් සැමරූ බවයි.

එසේම මෙලෙස සෑම අයුරින්ම අර්ථවත් අන්දමින් පිංකම් මාළාව පැවතෙද්දී බොහෝමයක් දෙමව්පියන්, බිරින්දවරුන්, දූ දරුවන්, සහෝදර සහෝදරියන් ගේ දෙනෙත් වලින් කදුළු කැට බිඳු වැටෙනු දකීමෙන් හැඟීම්බරවූ අවස්ථාවක් බවට පරිවර්ථනය වූයේ අප දෙමව්පිය ඥාති හිතවතුන් හා සමාන වූ අසරණ පිරිසක් යන හැඟීම මසිත ද වෙලාගත් බැවිනි. ඔවුන්ගේ අදහස් වශයෙන් ප්‍රකාශ වූයේ ද මෙවැනි විචිත්‍රවත්, වර්ණවත් පිංකමක් මෙම විහාරස්ථානයේ පැවැත්වුන පළමුවන අවස්ථාව බවත්, මෙයට එක්කාසු විය යුතු නව යෝජනා කිහිපයක්ද තිබෙන බවත්ය.

අවසන් වශයෙන් මෙම මහගු අවස්ථාව නිමා කරමින් මියගිය රණවිරුවන් හට අමා මහ නිවන් සුව ප්‍රාර්ථනා කරමින් ස්වකීය දේශයටත් මුලු මහත් සිංහල ජාතියටත් නිදහස හා නිවහල් භාවය උදා වේවායි ප්‍රාර්ථනා කරන්නට ද වූයේ ඉතා භක්තියෙනි. මෙවන් පිංකම් සිදු කිරීමෙන් ලබන්නා වූ පුන්‍යකර්මයන් තුලින් ඒ හැම සියළු දෙනාටම නිදුක් නීරෝගී සුව සහ දීර්ඝායු හිමි වේවායි මම ද ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමි.

සේ/304017 කෝප්‍රල් පියසේන
සේනාධීර ඒඩබ්ජී
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදව
රණවිරු සුභ සාධක අංශය.පනාගොඩ කඳවුර. හෝමාගම.

# 1 ශ්‍රීලපාහ සිංහල අවුරුදු අසිරිය

හෙල සිරිතට විරිතට මුල්තැන දෙමින් ඉපැරණි සම්ප්‍රදායානුකූලව පවත්වනු ලබන 1 ශ්‍රීලපාහ අවුරුදු උත්සවය මෙවරත් අණදෙන නිළධාරිගේ ප්‍රධානත්වයෙන් පුල්ලිඅඩිඉරක්කම් කඳවුරේදී 2002 අප්‍රේල් මස 14 වන දින පවත්වන ලදි. මෙදින අණදෙන නිළධාරිතුමා විසින් නැකතට ලිප ගිණි මොලවා කිරි උතුරුවා වැඩ අල්ලා සියලුම නිළයින් නියෝජනය වන පිරිදි උදසන ආහාර අනුභව කලේ ජෝතිෂ්‍යයට අනුවය.

ඉන් අනතුරුව ඇරඹුණු සිංහල අවුරුදු උත්සවයේ විවිධ ජන ක්‍රීඩාවන් විදහා පාමින් මුල් තැනක් ගත් ක්‍රීඩාවන් අතර,ඉදිකටුවට නූල දැමීම, දෙහි ගෙඩිය හැන්ද මත තබාගෙන දිවීම, කොට්ටා පොර ගැසීම , ග්‍රීස් ගහේ නැගීම, කඹ ඇදීම, අත් පන්දු තරගය, කනා මුට්ටි බිඳීම, පිහිණුම් තරගය, ගම හරහා දිවීම, හා සංගීත පුටු තරගය විය. එම උත්සවයේ පැවැත්වූ ක්‍රීඩා අතුරින් කාගේත් සිත් ගත් ක්‍රීඩාව වූයේ පොර පොල් ගැසීමේ ක්‍රීඩාව හා විකට ඇඳුම් තරගයයි.

අවුරුදු උත්සවය පැවැත්වෙන අතර තුරදී සියලුම නිළයන් සඳහා පිලියෙල කර තිබූ දිවා ආහාරය කඳවුරු භූමියේ තුරු සෙවනේ ඉදිකර තිබූ විශේෂ ස්ථානයක සිට අණදෙන නිළධාරි ඇතුලු සියලුම නිළයන් විසින් ඉතා සතුටින් භුක්ති විඳිනු ලැබීය. දීර්ඝකාලයක් සිට පැවති අධික ක්‍රියාත්විත රාජකාරි තත්වයෙන් මිදී සන්සුන්ව තිබෙන මෙවන් සාමකාමී වාතාවරණයක් තුල සියලුම නිළයින්ගේ විනය, එක්සත්භාවය ,පක්ෂපාතත්වය, මිත්‍රත්වය, ඔප් නැංවූයේ කදිම ආදර්ශයක් මෙම අවුරුදු උත්සවයෙන් පිළිඹිබු කරමින්ය.

දිවා ආහාරයෙන් පසු පැවති අවුරුදු උත්සවයේ ඉතිරි ක්‍රීඩා ඉසවු අතර, විකට ඇඳුම් තරගය පැවැත්වෙද්දී සියලු දෙනාගේ මුවින් නැගුනු සිනහව නවතාගත නොහැකි වූයේ උද්වේගකාරී අන්දමින් එම තරගය පැවත්වූ නිසාය.

සියලු තරග අවසානයේ අණදෙන නිළධාරි, දෙවන අණදෙන නිළධාරි, ඇතුලු නිළධාරි අණදෙන වරුන් සමග රෙජිමේන්තු සැරයන් මේජර් විසින් තරග ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රධානය කරන ලදි. එහිදී බළඇණියේ රාජකාරි කරනු ලබන සියලුම සිවිල් සේවක මහතුන් උදෙසා විශේෂ අවුරුදු ත්‍යාග පිරිනැමීමද තවත් සුවිශේෂී අවස්ථාවක් විය. මෙම මනරම් අවුරුදු උත්සවය අවසානයේ බළ ඇණි ගීතය හා ජාතික ගීය අණදෙන නිළධාරි ඇතලු සියලුම නිළයන් විසින් ගායනා කල අවස්ථාව වන විට පුල්ලිඅඩිඉරක්කම කඳවුර වෙත සැඳෑ අඳුර ගලා එමින් තිබුනි.


බුද්ධි අංශය 1 - ශ්‍රීලපාහ



දෙහි ගෙඩිය හැන්ද මත තබාගෙන දිවීම



කඹ ඇදීම



කොට්ට පොර තරගය


පසුගිය කලාපයෙන්..


# ඇන්ටෙනාවක් සවිකිරීමේදී සැලකිය යුතු කරුණු

1. ඇන්ටෙනාවක් සහ සම්ප්‍රේෂණ කුළුණු අතර හැකිතාක් දුරට බාධක මග හැරෙන ආකාරයට සවිකරන්න.
2. රූපවාහිනී යන්ත්‍රයට සුදුසු ඇන්ටෙනා වයරය සවි කරන්නන.
   300Ω වයරය හෝ 75Ω වයරය
3. සම්බන්ධතාවයන් බුරුල් නොවන පරිදි හොඳට සවි කරන්න.
   එසේ නොවුනහොත් රූප අපහැදිලි වීමට පුළුවන.
4. ඇන්ටෙනාව යකඩ බටයක සවි කරන්නේ නම් අඩියක් පමණ පහළින් සවි කරන්න.
5. ඇන්ටෙනාව නිවැරදි දිසාවට සවි කරන්න.
6. මල්ටි චැනල් ඇන්ටෙනාවක් සවි කරන්නේ නම් රොටේටරියක් සවි කරන්න.එවිට අවශ්‍යතාවය අනුව දිසාව වෙනස් කර ගත හැක.
7. අඩු ගෙන් (GAIN) එකක් ඇති, මළ බැඳුණු වයර් සවි නොකරන්න.
8. හැකිතාක් දුරට VHF සහ UHF සේවාවන් සඳහා ඇන්ටනා දෙකක් සවි කරන්න.
9. විදුලි රැහැන් ඇත්නම් ඊට ඈතින් සවි කරන්න.
10. මහා මාර්ගයට ලං වන සේ සවි නොකරන්න. වාහනවල එන්ජින් බලපෑම ඇතිවීමට ඉඩ ඇත.
11. ඇන්ටෙනා දෙකක් සවි කිරීමේදී ඒ අතර පරතරය අඩි 3ක් පමණ තබන්න.
12. ඩයිපෝලය තුළට වතුර කාන්දු නොවන ආකාරයට සවි කරන්න.

රූපවාහිනී සේවා සහ විකාශන මධ්‍යස්ථාන

1. **රූපවාහිනිය**
   VHF චැනල් 5 පිදුරුතලාගල - දිවයිනටම
   VHF චැනල්10 කොකාවිල් - උතුරු පලාත
   VHF චැනල් 8 මහනුවර - කඳුකරය (මධ්‍යම)
2. **ITN සේවය**
   VHF චැනල් 12 යටියන්තොට - දිවයිනටම
   VHF චැනල් 12 නායබැද්ද - බණ්ඩාරවෙල
   VHF චැනල් 9 දෙනියාය -දකුණු පලාත
3. **TNL සේවය**
   VHF චැනල් 3 පිලියන්දල - පොල්ගහවෙල
   VHF චැනල් 4 දෙනියාය - නුවරඑළිය
   UHF චැනල් 21 කොළඹ
   UHF චැනල් 26 රත්නපුර - මහනුවර
4. **සිරස**
   UHF චැනල් 23 - පිදුරුතලාගල - මුළු දිවයිනටම
   UHF චැනල් 27 - දෙනියාය
5. **ස්වර්ණවාහිනී**
   VHF චැනල් 31 කොළඹ - බස්නාහිර පළාත
   VHF චැනල් 33 මහනුවර සහ මාතලේ
6. **ETV**
   UHF චැනල් 35 කොළඹ
7. **ඩයිනාවිෂන්**
   UHF චැනල් 28 කොළඹ ලෝක වෙළඳ මධ්‍යස්ථානය
   කොළඹ සිට මීගමුව - අවිස්සාවේල්ල - බලපිටිය දක්වා පැහැදිලි රූප ලබා ගැනීමට හැකිය.




මතු සම්බන්ධයි

සාසෙ වීරසිංහ ඩබ්එම්ඩ්එස්වීරක්
තූර්ය වාදක අංශය - රෙරම ශ්‍රීලපාහ

# පාබල ඛණ්ඩ සාමූහික පුහුණු පාඨමාලාව "ඩී" කණ්ඩායම 10 ශ්‍රීලපාහ

සොල්දදුවන් යුධමය වාතාවරණයෙන් මිදී සිටින සෑම අවස්ථාවකදීම යුද්ධය සඳහා පුහුණුවීම් වල යෙදවීම යුද්ධ හමුදවක් සතු ප්‍රධාන කාර්‍යයකි.

එම ආදර්ශ පාඨය පෙරදරි කරගෙන 10 ශ්‍රීලපාහ 'ඩී' කණ්ඩායම බෝගොඩ ගුවන් සංග්‍රාමික පුහුණු පාසලෙහි පුරා දින 42 ක් මුලුල්ලෙහි පැවති ඛණ්ඩ සාමූහික පුහුණු පාඨමාලාව සාර්ථකව හදරා 2002.02.18 දින නැවත සිය බළඇණිය වෙත පැමිණියහ. 2002 .01.07 දින 216 බළසේනාධිපති ලුතිනන් කර්නල් එච්එම්ආර් කේ වන්නිනායක,ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති ආරම්භක දේශනයේ දී සාමකාමී වාතාවරණයක් රටේ පවතින විට මෙවැනි ආකාරයේ පාඨමාලාවක ඇති කාලෝචිත බවත්, පාඨමාලාවේ ඇති වැදගත්කම යන ආදී වශයෙන් මාතෘකා කිහිපයක් යටතේ ඔහු තම දේශනය ඉදිරිපත් කළහ. ඔහුගේ එම දේශනය සෙබලාගේ චිත්ත ධෛර්‍ය ඉහල මට්ටමකට ගෙන ඒමට හැකි වූ බව මෙහිදී සඳහන් කල යුතුය.

වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ අදහසක් අනුව තෝරා ගත් උපදේශක නිලධාරි/සෙසුනිල පිරිසකට මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේදී පුහුණුවක් ලබාදී ඔවුනගේ උපදේශකත්වය යටතේ ප්‍රථම වරට පවත්වන ලද මෙම ඛණ්ඩ සාමූහික පුහුණු පාඨමාලාව සඳහා ඇතුලත් වීමේ භාග්‍ය අප කණ්ඩායමට මෙන්ම 3 ගරේ, 3 (සෙච්) ගැහෙබටත් ලැබීම ඉතා අගය කොට සලකමි. මන්දයත් අප ඒකකය ගත් කල විවිධ ඒකකයන්ගෙන් පැමිනි නි/ සෙසුනිලයින්ගෙන් සැදුම්ලද්දක් බැවින් ඔවුන්ගේ හැකියාවන්, දක්‍ෂතාවයන් කොපමණ මට්ටමක දැයි දන ගැනීමට මගක් නොතිබින. අවුරුද්දක් යන තුරුම යුධ වාතාවරණය නිසා කණ්ඩායම් වශයෙන් හෝ බළඇණියක් වශයෙන් අපට පුහුණුව සඳහා අවස්ථාවක් ද නොලැබිණ. නැවත ස්ථාපනය කර වසරක පමණ කාලයකට පසු ලැබුණු මෙම අවස්ථාව අගය කරන්නේ ඒ නිසාය.

පාබල කණ්ඩායම් වලටම උචිත වූ බංකර් විනාශ කිරීම, සතුරු කඳවුරු අත්පත්කර ගැනීමේ සරඹය, භූමියේ උපක්‍රමශිලීව ගමන් කිරීම, ජීව වෙඩි තැබීම්, සිතියම් කියවීම, මූලික යුධ උපක්‍රම, ප්‍රතිවිප්ලව සටන් ක්‍රම, බාධක තරණය, ශාරීරික යෝග්‍යතාවය පවත්වාගෙන ගැනීම ආදී කරුණු ඇතුලත් විෂය නිර්දේශ මාලාවකින් පාඨමාලාව සමන්විත විය. එමෙන්ම දේශන වලින් පමනක් සමන්විත නොවී මෙම පාඨමාලාව වර්තමාන යුධ ක්‍රමයට ගැලපෙන පරිදි ප්‍රායෝගික පුහුණුවීම්ද අන්තර්ගත කොට තිබීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එමෙන්ම උපදේශකයින්ගේ සිත් ගන්නා සුලු ඉගැන්වීමේ රටාවක් ඔවුන් යුධ බිමේදී ලබා තිබූ අත්දැකීම් ඒ ඒ විෂයට අනුකූලවන පරිදි ඇතුලත් කොට සෙබලුන්ට ඉදිරිපත් කිරීම මගින් සිසුන්ගේ රුචිකත්වයක් ,අවධානයක් තමා උගන්වන දේ පිළිබඳව යොමුකර තබා ගැනීමට මෙම උපදේශයින් නිරන්තරයෙන්ම උත්සාහ දරුහ. එසේම සෑම අභ්‍යාසයක් අවසානයේම පවත්වනු ලැබූ පසුකථනය (DEBRIEF )මගින් සෙබලුන්ට , ඔවුන් විසින් කරන ලද වැරදි අඩුපාඩු මෙන්ම හොද දේවල්ද උපදේශයින්ගෙන් අසන්නට ලැබීම මගින් ඉදිරි පුහුණු වීම් සහ අභ්‍යාස වලදී එවැනි අඩුපාඩුකම් මග හරවා ගැනීමට හැකියාව ලැබුණි.

පුහුණුව ලබන සෙබලුන්ට තමා පිළිබඳ ආත්මවිශ්වාසය ඇතිවන ආකාරයෙන් සංවිධානය කර තිබූ දිවා රාත්‍රී කොම්පාසු සංචාර ඉතා අගය කොට සැලකිය හැකිය. එසේම පොලව මතුපිට සහ පොලව අභ්‍යන්තරයේ සිට සතුරා නිරීක්ෂණය කරන අන්දම ප්‍රායෝගිකව ඔවුන් ඉදිරිපත් කර පෙන්වීම ඉතා චමත්කාර ජනකය. මෙම පොලව අභ්‍යන්තරයේ සිට සතුරු නිරීක්ෂණය කරන අන්දම අප සෙබලුන්ට අලුත් අත්දැකීමක් විය.

නායකත්වය සෙබලුන් තුල නිරන්තරයෙන්ම දියුණු කිරීම සඳහා ආරාධිත දේශක වලින්ද ප්‍රායෝගික පුහුණුවීම් වලදී පෙල අණදෙන්නන් සහ ඛණ්ඩ අණදෙන්නන් වශයෙන් ඔවුනට කටයුතු කිරීමට අවස්ථාව සලසා දීම මගින් සෙබලුන්ගේ ස්වයං නායකත්වය ඔප්නංවා ගැනීමට අවස්ථාව සැලසුහ. යුධමය හෝ සාමකාමී තත්වයක දී සොල්දදුවාගේ උසස් චිත්ත ධෛර්‍යයට හේතුවන්නේ ඔවුන්ගේ නායකයින් හා ඔහු ලබන පුහුණුව සම්බන්ධව ඔහු තුල ඇතිවන විශ්වාසයයි. මෙම සාමූහිකත්වය ඔප්නැංවීම සඳහා තුඩුදුන් හේතුවක් වන්නේ ආධුනික සෙබලාගේ සිට නිලධාරි අණදෙන දක්වාම පාඨමාලාව අවසාන වනතෙක් සාමූහිකව පුහුණුවීම්වල යෙදීමයි. සෙබලුන්ගේ චිත්ත ධෛර්‍ය විශ්වාසය සහ දරාගැනීමේ හැකියාව වර්ධනය කිරීමට සංවිධානය කර තිබූ17.5



16 කිමී වේගවත් පා ගමනේ අවස්ථාවක්



අවසන් දේශනයට පසු. උපදේශක නිලධාරි / සෙසු නිල සමග සුහද සාදරයකට පෙනී සිටිමින්....

කි.ග්‍රෑම් බරක් සහිතව කිෟමී12ක් සහ කි.මී16ක් වේගවත් පාගමන මෙම පුහුණුවීමේඅන්තර්ගත කර තිබීම කැපීපෙනුණි. එමෙන්ම ශාරීරික අභ්‍යාස සඳහා අලුතින් හඳුන්වා දී තිබූ දරා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂනය ( ENDURANCE TRAINING TEST ) සෙබලුන්ට නව අත්දැකීමක් වූයේය එසේම ප්‍රගුණ වෙඩිකරු පාඨමාලා හැදෑරූ උපදේශකයින්ගේ අධීක්ෂනය යටතේ පැවැත්වූ විවිධාකාර ඉරියව් වලින් යුතු වූ වෙඩි තැබීම් මගින් සොල්දාදුවන්ගේ වෙඩි තැබීමේ හැකියාවන් තවත් ඔප්නැංවීමට හැකිවීම ද ඒ සඳහා විශාල පතරොම් ප්‍රමාණයක් එක් අයකුට ලබාදීම ද මෙම පුහුණුවීමේ තිබූ තවත් එක් ලක්ෂණයකි. මෙම පුහුණු පාඨමාලාව ප්‍රථම වරට පවත්වනු ලැබූවක් නිසා විවිධ අඩුපාඩුකම්, අපහසුතා මධ්‍යයේ පුහුණුවීම් කරගෙන ගිය බව කිව යුතුය. විශේෂයෙන් අභ්‍යාස සඳහා අඩු කාලයක් ලැබීම ද සඳහන් කල යුතුය. කෙසේ නමුත් අප සොල්දාදුවන් එවැනි අපහසුතා මධ්‍යයේ වූවද මෙම පුහුණුව සාර්ථකව නිම කලහ. ආසේවු (වන්නි) මාණ්ඩලික නිලධාරි වරුන්ද , බලසේනාධිපතිවරුන්ගේද, බලඇණි අණදෙන නිලධාරි වරුන්ගේද නිරීක්ෂණ සංචාරයන් සොල්දාදුවන්ගේ චිත්ත ධෛර්‍ය වර්ධනය වීමට සහ පාඨමාලාව සාර්ථකව කරගෙන යාමට මහත් රුකුලක් විය.

මෙම පුහුණුවීම් වල පරමාර්ථය වූයේ අවි හැසිරවීම, භූමි උපක්‍රම හා යුධමය තත්වයන්ට මුහුණ දීමට දක්ෂ නිපුන, මනා ආත්ම විශ්වාසයකින් හෙබි විනය ගරුක සෙබලුන් බිහි කිරීමයි. එනම් සොල්දාදුවකු ඕනෑම කාලගුණික, දේශගුණික තත්වයන් හා ඕනෑම භූමි ප්‍රදේශයක දිගු කාලයක් දිවා හා රාත්‍රී යන දෙකෙහිම ඉතා අසීරු යුධමය තත්වයන්ට මුහුණ දීමට මානසික හා කායික ශක්තියකින් හෙබි සොල්දාදුවන් බිහි කිරීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සෙබලුන් වශයෙන් අප ලද එම පුහුණුව අගය කොට සලකමි. 2002 . 02 .12 දිනෙන් නිම කෙරුනු වන අභ්‍යාසයන් සමගම එදිනම පැවති 216 බලසේනාධිපති තුමාගේ අවසන් දේශනයෙන් පසුව පුරා දින 42 ක් තිස්සේ පැවති බණ්ඩ සාමූහික පුහුණු පාඨමාලාව අවසන් වූහ.

**නි/55274**
**2/ලුතිනන් ඩීඑස් සූරියආරච්චි.**
**ශ්‍රීලපාහ**
**'ඩී' කණ්ඩායම 10 ශ්‍රීලපාහ**

2001.04.22 දින අලිමංකඩ ප්‍රහාරයෙන් අතුරුදහන් වූ සෙ/307870 ලාකෝ සම්පත් ජ්ඩී රණවිරුවාට උපහාරයක් වේවා!

# මා පුතු අද කොහි ද?

සහස්‍රයේ දුරුතු මහේ
අලිමංකඩ කඳවුර වෙත
පිය නැගූ මගේ ම ලොකු පුතුනේ
සහස්‍රයට ඔබ අතින් ලියවුණු
මෙවැනිම සංකල්පනාව
පුතුට බලන්න බැරිවිය
මම එය බක්මහේ බලා අඩා වැටුන බව
අද වගේ මතකයි
ඔබ ගියේ රට රකින්නයි
එද අලිමංකඩ සත කැලෑවේ
උන් කුරුල්ලන් අද කොහි ද?
රුදුරු බෝම්බයෙන් උන්
මරුවා සමග ගිහින් ද?
ඔබ එන මග බලා ඉදිමි
මම දකින්නේ හීනයක් ද?
අනේ රන් කුරුල්ලනේ

ඔබවත් පියාඹා ඇවිත්
මගේ පුතා කොහි ඉන්නවා ද
මට කියාපල්ලා
මගේ සිත දැවුරුද්දම
අඩා වැටුනේ ඔබ අද එයි
හෙට එයි කියාය
නැත ඔබ ආවේ
මා මග බලා ඉන්නේ
කවද ඔබේ හුරතල් මූණ
බලා ගන්නවා ද
කඳවුරේ කිසිම අයෙක්
පුතු සමග ගිය අය නැත
කාගෙන් ඔබ ගැන අසම් ද ?
කාගෙන් ඔබ ගැන සොයම් ද?
කවුරුන් හෝ මට පිළිතුරු දෙන්න
දෙවියනි!

මෙයට ඔබගේ ආදර අම්මා
ජ්. පද්මා

# "ජයග්‍රහකයා සහ පරාජිතයා අතර ඇති වූ වෙනස"

ජයග්‍රාහකයා පිලිතුරක් සොයයි
පරාජිතයා ගැටලු සොයයි
ජයග්‍රාහකයාට සැලසුමක් ඇත
පරාජිතයාට නිදහසට කරුණු ඇත
ජයග්‍රාහකයා ඔබට උපකාරි විය හැකි බව පවසයි
පරාජිතයා මාගේ රාජකාරියක් නොවන බව පවසයි
ජයග්‍රාහකයාට හැම ගැටලුවකටම පිලිතුරක් ඇත
පරාජිතයාට හැම පිළිතුරකමට ගැටලුවක් ඇත
ජයග්‍රාහකයා ඉතා අපහසු වූවත් කළයුතු දේ කිරීමට ඉදිරිපත් වේ
පරාජිතයා අපහසුවට ගැටලු ඉදිරිපත් කරයි
ජයග්‍රාහකයා යමක් වැරදිනම් නිවැරදි කිරීමට උත්සහ දරයි
පරාජිතයා යමක් වැරදුනොත් එය කල් දමයි.

**ලුතිනන් වීඑන්පී චන්ද්‍රකුමාර ශ්‍රීලපාහ**
**ලුතිනන්**
**'බී' කණ්ඩායම 7 ශ්‍රීලපාහ**



සංගීත පුටු තරගයට සහභාගී වූ කුඩා දරු දැරියන්

# රෙම ශ්‍රීලපාහ බක් මහා උළෙල - 2002



ලිස්සන ගහ ජයග්‍රහනය කල අවස්ථාව



කඹ ඇදීමේ තරගයට ආරම්භක සංඥාව නිකුත් කිරීමට සැරසෙන රෙජි අධිපතිතුමා



අවුරුදු උළෙල නරඹන ජ්‍යෙෂ්ඨ නිළධාරීන් ඇතලු පිරිසෙන් කොටසක්

## රෙම ශ්‍රීලපාහ රෙ සැමේ තනතුර භාරදීම්/භාර ගැනීම්...



සෙ/11533 බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්ඩබ්පී ආර්එස්පී රෙජි. රෙ.සැ.මේ. තනතුරෙහි රාජකාරිය භාර ගැනීමට පෙර විරාගත පොල්තෙල් පහන දල්වමින්...



බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්ඩබ් ආර්එස්පී රෙ.සැ.මේ. තනතුරෙ රාජකාරිය භාර ගැනීම සඳහා සිය අත්සන තබමින්...




බනි 1 ආර්එම් කරුණාරත්න වි නව රෙ.සැ.මේ. බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්ඩබ්පී ආර්එස් හට රෙජිමේන්තු සැරයන් මේ තනතුරෙහි සංකේතය වූ යෂ් (කේන්මලක්කා) භාර දෙමින්...


# 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 52 වන සංවත්සරය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පෞඪ ඉතිහාසයකට උරුම කම් කියන 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදවේ 52 වන සංවත්සරය වසර 2002 වූ මැයි මස 12 දිනට යෙදී ඇත. වර්ෂ 1950 ජූනි මාසයේදී 1 වන බළඇණිය ලංකා පාබල හමුදව යනුවෙන් නම් කරන ලදි. මෙම බළඇණියේ ප්‍රථම නියෝග පළවන කොටස 1952 ක් වූ මැයි මස 12 දින පලකරන ලද බැවින් එදින බළඇණියේ සංවත්සර දිනය වශයෙන් සලකනු ලැබීය. 19 වන ශත වර්ෂයේ අගභාගය තෙක් දිවෙන පාබල හමුදවේ ඉතිහාසය තුල වේල්ස් කුමාර ෆීල්ඩ් මාර්ෂල් අති උත්තම රාජවංශික ඇල්බර්ට් එඩ්වඩ් (පසුව V11 එඩ්වඩ් රජු) විසින් 'ඉච් ඩියන්' (සේවය කරමි) යන ඔහුගේ ආදර්ශ පාඨය සහ නිළ සළකුණ රෙජිමේන්තු ලාංඡනයට ඇතුලත් කිරීමට අවසර දීම මහත් අභිමානයෙන් සිහිපත් කළ යුතු වේ.

ලංකාද්වීපය මහා බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක්ව පැවති සමයේ ලංකා හමුදවේ ගෞරවණීය කර්නල් පදවිය සඳහා බ්‍රිතාන්‍යයේ රාජකීය පවුලේ සාමාජිකයින් පත් කිරීම එවකට පැවති සම්ප්‍රදය විය. 1948 දී ලංකාව නිදහස ලැබීමෙන් පසු ලංකා යුධ හමුදවේ ආරම්භයත් සමග පහත නම් සදහන් ලාංකීක නිලධාරීන්ගේ අණදීම යටතේ මෙම බළඇණිය ශ්‍රී ලංකාද්වීපයේ භෞමික අඛණ්ඩතාවය හා ඒකීයභාවය උදෙසා අධිෂ්ඨානශීලීව රාජකාරී කර ඇත.

ලුතිනන් කර්නල් එච්ඩබ්ජී විජේකෝන් ඕබීර්.ඊඩී
කර්නල් ඒ එම් මුතුකුමාරු ඕබීර්.ඊඩී.එඩීසී. අයිඩීසී
ලුතිනන් කර්නල් බීආර් හයින්
කර්නල් ඒ ආර් උඩුගම එම්බීර්
කර්නල් එම්ජ් ජයවීර
ලුතිනන් කර්නල් ඊටී ද ඉසෙඩ් අබේසේකර
ලුතිනන් කර්නල් ඒපී ආර් ඩේවිඩ් පීඑස්සී
ලුතිනන් කර්නප් එම් වී අතුකෝරල පීඑස්සී
කර්නල් සීඒඑම් එන් සිල්වා
ලුතිනන් කර්නල් එස්එම්ජ් ජයවර්ධන පීඑස්සී
ලුතිනන් කර්නල් ටීඑම් රජුඩීන්
ලුතිනන් කර්නල් එම්ටීඩබ් පොන්නම්පෙරුම
ලුතිනන් කර්නල් යූඒ කරුණාරත්න පීඑස්සී
ලුතිනන් කර්නල් ඒඑම්යූ සෙනෙවිරත්න
ලුතිනන් කර්නල් ඒකේ ජයවර්ධන පීඑස්සී
ලුතිනන් කර්නල් සීඑල් විජේරත්න පීඑස්සී එම්බී අයිඑම්
ලුතිනන් කර්නල් සීජේ රණවීර
කර්නල් ටීටීආර් ද සිල්වා ආර්ඩී ආර්ඩබ්පීආර්එස් සී පීඑස්සී
ලුතිනන් කර්නල් එච්ඩබ් හේවාආරච්චි ආර්ඩබ් ආර්එස්සී
මේජර් ආර්එන්ජී ද අල්විස් ආර්එස්ඩී
මේජර් එම්එම්අයි මුණසිංහ ආර්එස්සී

ලංකා යුද්ධ හමුදවේ ප්‍රථම ලාංකික හමුදපති වශයෙන් 1955 පෙරවාරි මස 09 වන දින මෙම බළ ඇණියේ අණදෙන නිලධාරි ලෙස දෙවන වරට කටයුතු කල මේජර් ජනරාල් ඒඑම් මුතුකුමාරු ඕබීර්.ඊඩී.එඩීස්.අයිඩීසී. පත්වූ අතර එම නිළධාරී ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ 50 වන සංවත්සර උළෙලේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වීමද මෙම බළ ඇණිය ගෞරවයට පාත්‍ර වූ තවත් විශේෂ අවස්ථාවකි.



බළඇණියේ ගෞරවණීය සේවයට උපහාර 1954 අප්‍රේල් 21 වන දින ගාලුමුවදෙර පිටියේදි දෙවන එළිසබෙත් රැජින විසින් බළඇණියේ කීර්තිමත් සේවයට උපහාර වශයෙන් රාජණී වර්ණ ප්‍රදනය කරන අවස්ථාව

වර්ෂ 1920 දී එක් ස්වේච්චා බළඇණියක්ව පැවති ලංකා පාබල හමුදවට වර්ණ දැරීමේ හිමිකම v වන ජෝර්ජ් මහ රජතුමා විසින් අනුමත කරනු ලැබ තිබුනු බැවින් හා එම බළ ඇණිය යටතේ එවකට පැවති ලෝක සංග්‍රාමයන්ට සහභාගී වූ හා ඊට පෙර සිට ලංකා පාබල හමුදව යටතේ රාජකාරි කල නිලධාරින්, බලලත් නිලධාරින්, ජ්‍යෙකොනොනිත් හා කණිෂ්ඨ කොනොනින්ගෙන් මෙම බළඇණිය සමන්විත වූ බැවින් එම ස්වෙච්චා බළඇණියට ප්‍රධානය කර තිබූ වර්ණ වල හිමිකම මෙම බළඇණිය වෙත ද ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමක ප්‍රථිඵලයක් ලෙස මීට වසර 48 කට පෙර එනම් 1954 අප්‍රේල් මස 21 දින ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බළසේනාවට අයත් මෙම බළඇණිය වෙත ප්‍රථම වරට II එළිසෙබත් රැජින විසින් රාජිණී වර්ණ සහ රෙජිමේන්තු වර්ණ ප්‍රධානය කරනු ලැබීය. අනතුරුව වර්ෂ 1978ක් වූ ඔක්තෝම්බර් මස 10 දින අතිගරු ජනාධිපති ජේආර් ජයවර්ධන මැතිතුමන් වෙතින් ජනාධිපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ ලැබීමේ ගෞරවයද මෙම බළඇණිය සතුවිය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ව්‍යාප්තියත් සමග ආරම්භ වූ ගැමුණු හේවා බළඇණි ය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, විජයබා පාබල රෙජිමේන්තුව, සන්නද්ධ බුද්ධි බළකාය ආදී රෙජිමේන්තු සහ ශ්‍රීලපාහ නිත්‍ය බළඇණි සියල්ලම නගා සිටුවීමේ දී මෙම බළඇණියේ නිලධාරින්/සෙසු නිළයන් ලබා දීමට ක්‍රියා කර ඇත.

මෙම බළඇණියේ ප්‍රථම මංගල වස්තුව ලෙස 1954 වර්ෂයේදී තණමල්විල ප්‍රදේශයෙන් තිත් මුවෙකු අල්ලාගෙන පුහුණු කිරීමට කටයුතු කර ඇත. එම තිත්මුවාගේ අකල් මරණයෙන් පසු බළඇණියේ මංගල වස්තුව ලෙස 1961 ජනවාරි මස 02 දින දෙහිවල සත්ව උද්‍යානයෙන් ලබාගත් ඇත් පැටවාට කණ්ඩුල I යනුවෙන් නම් තබන ලදි. ඒ අනුව බළඇණියේ සම්ප්‍රදයික වස්තුව වශයෙන් කණ්ඩුල ඇත් පැටවා බළඇණිය සහභාගි වූ රාජ්‍ය උත්සව සම්මාන පෙළපාලි නියෝජනය කරමින් බළඇණියේ කීර්තිය ඔප් නැංවීමට දයක විය.

මෙම බළඇණියේ අණදෙන නිලධාරිව සිටි එවකට මාණ්ඩලික ප්‍රධාන තනතුර හෙබවූ බ්‍රිගේඩියර් එම්ජ් ජයවීර විසින් 1974 ජනවාරි 30 වන දින උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබූ බළඇණි කෞතුකාගාරයත්

වර්ෂ 1974 ඔක්තෝම්බර් මස 08 වන දින එවකට යුද්ධ හමුදපතිව සිටි ලූතිනන් ජනරාල් ඩීඑස් ආටිගල එම්ඕවී. අයිඩීසී. පීඑස්සී විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලද බුදු මැදුර ද මෙම බළඇණියේ පෞරාණික බව හා ඓතිහාසික වටිනාකම සුරකිමින් මෙම බළඇණිය විසින් නඩත්තු කරන ලදුව එය දනට පාබල හමුද රෙජිමේන්තුව විසින් නඩත්තු කරමින් එහි ඓතිහාසික බව සුරකිමින් පාබල හමුදව සතු දයාදයක් ලෙස ආරක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ඓතිහාසික වටිනාකමින් යුතු බළ ඇණි කෞතුකාගාරය සහ බුදු මැදුර ඉදි කිරීමේදී එවකට අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි කල ලූතිනන් කර්නල් එච්වී අතුකෝරාල පීඑස්සී විසින් පුරෝගාමීව කටයුතු කර ඇති බව ද මෙහිලා සදහන් කරමි. තවද ශ්‍රී ලංකා පාබල හමුද ඉතාහාසය තුල දෙස් විදෙස් නම රන්දූ ජාත්‍යන්තර තලයේ ක්‍රීඩකයන් රැසක් බිහි වූ අතර මේජර් ජනරාල් බීආර් හයින්, කපිතාන් කේටීඑන් පෙරේරා ශ්‍රීලපාහ, කපිතාන් ඒ ප්‍රේමචන්ද්‍ර, ශ්‍රීලපාහ ලූතිනන් එච්කේ කරුණාරත්න ශ්‍රීලපාහ, කෝප්‍රල් පෙරේරා එච්ආර්, කෝප්‍රල් ගුණසේකර එස්එච්ජේ ආදීන් ඒ අතුරින් සුවිශේෂ දස්කම් දක්වූ ක්‍රීඩකයන් වේ. එමෙන්ම බළඇණියේ නිළධාරින් බොහෝ දෙනෙකු යුද්ධ හමුද සේවයෙන් පසුවද රාජ්‍ය තාන්ත්‍රික තනතුරු හොබවමින් දේශයට ගෞරවණීය සේවයක් කල බව සිහිපත් කරමි.

ජාතිවාදය උත්සන්න කල ත්‍රස්තවාදී අරගලය, ජාතික ආපදවකට පෙරලිමත් වර්ගවාදී ත්‍රස්තවාදීන් ප්‍රථම වරට 1983 ජූලි 23 දින යාපනය තිරුණවේලි ප්‍රදේශයේදී යුධ හමුදව සමග ඇතිවූ ගැටුමෙන් ලූතිනන් ඒපීඑන්සී ද වාස් ගුණවර්ධන ශ්‍රීලපාහ සමග සෙසු නිළයින් දෙලොස් දෙනෙකු ජීවිතක්ෂයට පත්කරමින් ආරම්භවූ එල්ටීටීර් යුද්ධය වසර ගනනාවක් දිග්ගැස්සෙමින් පැවති අතර මෙම යුද්ධමය වාතාවරණය මැඩපවත්වා සාමය උද කරලීම වස් ඉන්දීය රජය විසින් දියත් කරන ලද සාම ක්‍රියාදමය සාර්ථක කර ගැණිම පිණිස 1987 වර්ෂයේ ජූලි මාසයේ ලංකාවට පැමිණි ඉන්දීය සාම සාධක හමුදව වෙත යාපනය කොටුව ප්‍රදේශය භාරදීමෙන් අනතුරුව, බළඇණියේ හඨ පිරිස් එවකට දකුණු ප්‍රදේශයේ පැවති සන්නද්ධ අරගලය මැඩ පැවැත්වීම සදහා කොළඹ, ගාල්ල , මාතර, හම්බන්තොට ආදී ප්‍රදේශ වල



අණදෙන නිලධාරි විසින් සම්මාන මුරය පිළිගැනීම



අණදෙන නිලධාරි සඳහා සූදනම් කර තිබූ සම්මාන පෙළපාලිය



සම්මාන පෙළපාලිය අණදෙන නිලධාරි විසින් පරීක්‍ෂා කිරීම

ස්ථානගතව අභ්‍යන්තර ආරක්‍ෂක රාජකාරි සහ විශේෂ ක්‍රියාන්විතයන්හි නිරත විය.

ඉක්බිත්ව 1990 වර්ෂය වන විට නැවත නැගෙනහිර පලාතේ මඩකලපුව දිස්ත්‍රික්කය මූල්කරගෙන ස්ථානගත වූහ. එහෙත් එවකට පැවති සාම ක්‍රියාවලිය බිඳලමින් 1990 ජුනි මස 10 දින දෙවන ඊළාම් යුද්ධය ආරම්භ වීමත් සමගම මෙම බළඇණිය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ස්ථානගතව ක්‍රියාන්විත රාජකාරියේ නිරතවිය. එහිදී වර්ගවාදී යුද්ධයේදී අභීත යුධ සෙන්පතියෙක් ලෙස ක්‍රියාකල ත්‍රිකුණාමලය 22 වන බළසේනාධිපතිව සිටි මේජර් ජනරාල් සීඑල් විජේරත්න ආර්ඩබ්පී.ආර්එස්පී.එම්අයිඑම් 1990 දෙසැම්බර් මස 18 වන දින ත්‍රස්තවාදී බිම් බෝම්බයකට අසුව ජීවිතක්ෂයට පත්විය. ඒ අනුව ත්‍රස්තවාදී ප්‍රහාරයක් හේතුවෙන් මියගිය ශ්‍රී ලංකා පාබල හමුදවේ ජ්‍යෙෂ්ඨතම නිළධාරියා ලෙස එම ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ නම ඉතිහාසයට එක්විය.

මෙම බළඇණිය සමග ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටි නිළධාරින් සහ සෙබු නිළයින් බොහෝ දෙනෙකු සංග්‍රාමික භූමියේදී ස්වකීය ජීවිත ආරක්‍ෂාව පිළිබඳව නොසිතා තම බළඇණියේ අරමුණ මුදුන්පත් කර ගැනීමේ පරමාභිලාශය පෙරදැරිව සතුරා අභිමුවෙහි කරන ලද වීර වික්‍රමාන්විත ක්‍රියාවන් උදෙසා පදක්කම් හා ප්‍රසාද ලැබූ අතර ඔවුන් අතුරින් පහත නම් සඳහන් නිළධාරින්/සෙබු නිළයින් 1986 වර්ෂයේදී පවත්වනු ලැබූ ශ්‍රීලංකා යුද්ධ හමුදවේ ප්‍රථම වීර පදක්කම උළෙලේ පදක්කම්/ප්‍රසාදලාබීන්ව බළ ඇණියට ගෞරවයක් අතකර දුන්හ.

**වීර වික්‍රම විභූෂනය**

සෙ/11547 කෝප්‍රල් ඒකනායක එච්එම්

**රණ වික්‍රම පදක්කම**

සෙ/50913 කපිතන් ආර්එම්ඩී රත්නායක.ශ්‍රීලපාහ

සෙ/50989 කපිතන් ඒකේඩීජේපී සිරිවර්ධන. ශ්‍රීලපාහ

සෙ/60092 2/ලුතිතන් කේසී ගුණවර්ධන,ශ්‍රීලපාහ


**රණ ශූර පදක්කම**

නි/50919 කපිතන් එම්ජ් පීරිස්. ශ්‍රීලපාහ

නි/60058 ලූතිතන් ඩීඑම්එස් සේනානායක.ශ්‍රීලපාහ



1 ශ්‍රීලපාහ ඒකකයේ මියගිය නි/සෙනීන් හට පිං පැමිණවීම සඳහා සූදනම් කර තිබූ දානය පිළිගැන්වීමට ධාතු කරඬුව ප්‍රමබ සංඝයා වහන්සේ අණදෙන නිලධාරී විසින් වැඩම කරවීම



අණදෙන නිලධාරී ඇතුලු නිලධාරී / සෙනීන් විසින් සංඝයා වහන්සේ වෙත දානය පිරිනැමීම



ඒකකයේ සියලුම නිලධාරී / සෙනීන් සහභාගී වී දිවා ආහාරය ගැනීම

සෙ/10977 සැරයන් විජේසිංහ ජීඩබ්ජී
සෙ/11087 සැරයන් විජේසිංහ ටී
සෙ/11426 කෝප්‍රල් නානායක්කාර ඒකේ

**ජනාධිපති ප්‍රශංසාසිංසනය**

නි/50946 2/ලුතිනන් එල්බී තල්ගහගොඩ ශ්‍රීලපාහ
සෙ/11200 සැරයන් තිලකරත්න එච්එල්
සෙ/11092 කෝප්‍රල් ජයසේන කේ
සෙ/11116 කෝප්‍රල් පෙරේරා ඒඑල්එල්
සෙ/11339 කෝප්‍රල් රණතුංග කේජී
සෙ/11438 ලාකෝ නාබෘ එන්එම්
සෙ/11914 ලාකෝ ටී ඊ
සෙ/11937 ලාකෝ ජයන්ත ඒඑස්

අණදෙන නිළධාරි 21 දෙනෙකුගේ අණදීම යටතේ මෙම පනස් දෙවසර තුල සංග්‍රාමික භූමියේදී ලත් ජයග්‍රහණයන් අතර 1993 පූනරීන් කදවුර වෙත එල්ල කරන ලද දැවැන්ත එල්ටීටීඊ ත්‍රස්තවාදී ප්‍රහාරය ජීවිත පූජාවෙන් මැඩ පවත්වා කදවුර රැකගැනීම සබැදිව සදහන් කිරීම එම සටනේදී මියගිය හා අතුරුදහන් වූ මෙන්ම ත්‍රස්තවාදීගේ ග්‍රහණයේ සිටින හා ත්‍රස්තවාදී ග්‍රහණයේ සිට නිදහස් කරනු ලැබූ මෙම බළඇණියට අයත් නිළධාරී හා සෙසු නිළයන් දිරිගන්වමින් අභීත නායකයින් ලෙස ක්‍රියාකල එවකට අණදෙන නිළධාරීව සිටි ලුතිනන් කර්නල් වීටීආර් ද සිල්වා ආර්ඩබ්පී.ආර්එස්පී ශ්‍රීලපාහ සහ දෙවන අණදෙන නිළධාරීව සිටි මේජර් ඩීයූ ද ලැනරෝල් ආර්ඩබ්පී ශ්‍රීලපාහ මෙම බළඇණියේ සියළුම නිළයින්ගේ ගෞරවයට පාත්‍රවූ අතර ඒ වෙනුවෙන් ලුතිනන් කර්නල් වීටී ආර් ද සිල්වා ආර්ඩබ්පී.ආර්එස්පී ශ්‍රීලපාහ අතිගරු ජනාධිපති තුමන්ගේ නියමය පරිදි කර්නල් නිළයට උසස් කරනු ලැබීමද සුවිශේෂ සිදුවීමකි. සිය 52 වන අභිමානවත් සංවත්සරය සමරන මෙම බළඇණියේ නිළධාරි /සෙසු නිළයින් 465 ක් පමණ දේශයේ ඒකීයභාවය සහ අඛණ්ඩතාවය ඉටුකල හා ඉටුකරන්නාවූ සියළුම නිළධාරීන් සෙසු නිළයින් හා සිවිල් සේවක මහතුන් හට බළඇණියේ ප්‍රණාමය පුද කරන අතර, ඒ තුලින් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව වෙත දේශයේ සාමය හා ඒකීයභාවය රැකීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

**ක්‍රියාමූලය 1 ශ්‍රීලපාහ**

# වයිට් හැකල් සඟරාව දායකත්වය ලැබූ අයවලුන්

**දකුණු පළාත**

**වසරක දායකත්වය රු. 280.00**

| | |
|---|---|
| ඒ. ජී. සිරිසේන | ඔබවත්ත, හැල්දූව අහංගම |
| එන්ජී ගුණපාල | කන්ද කදුරුහේන, තංගල්ල |
| කේ. කේ. මල්ලිකා | ගැඩිසල 02, කුන්දුප්පකන්ද - අගුලුගහ |
| ඩබ්. කේ. සෝමලතා | තැඹිලිගහවත්ත - කහව |
| ඩී. බී ජානක | අංගහවත්ත, ආනන්ත - පොඩිකටුපන |
| පී. ගුණතුංග | කනත්තගොඩවත්ත - ගෝනාපීනුවල |
| පි. ඩී. යසරත්න | නකව ජනපදය - ඇත්කඳුර |
| එච්. ඩී. ගුණවතී. | කහගෙදරත්ත - තලල්ල උතුර- කැකනදුර |
| ඊ. පී. සෝමදාස | සිතිමෝදර - නාකුලුගම - හොලුකොඩරල |
| ජී. සුහදස | කිනකැටිය, ඇත්කඳුර, ඇල්පිටිය. |
| ආර්පී. කරෝලිස් | අත්තනයාය -මදුමුලන |
| ඩබ්. සිරිසේන | "සමන්", පල්ලෙජුලම්පිටිය - ජුලම්පිටිය |
| ඩබ්ඩී ඇඩ්වින් සිංසෝ | ගමගේ බේකරිය බාරේ, අම්බට, කහදුව |
| ඩබ්. හේමලතා | 30/6, කොකාවල, වඳුරඹ |
| ඊ. එඩ්වින් | දළුවැල්ලේගදර, වැල්ලව, අකුරැස්ස |
| ඩබ්. කේ. ගුණවතී | ලයනල්වාස, රඹලියගේ වත්ත, 2 අදියර, වල්ලිවල, වැලිගම |
| අයි. ජී. බන්දුසේන | පරවත්ත, මලභා, කඹුරුපිටිය. |
| කේ. ජී. චන්ද්‍රානි | මංඩගලපාර, ලුනව, අම්බලන්තොට |
| ජී. වී. ඇල්පිසිංසෝ | ප්‍රාර්ථනා, අරහේන, කපුගම, දෙවිනුවර |
| ජී. සේමාවතී | ආරියරත්න ස්ටෝර්ස් බාරේ, ගොඩවුන, පිටිගල |
| බී, ඥනවතී | දිවුලකඩහේන, තෙලිජ්ජවිල, මාතර |
| ජේ. ඇසිලින් | නො. 30, බණ්ඩාරනායක මාවත, කැකනදුර, මාතර |
| ඒ. සෝමාවතී | 30/19, කොකාවෙල, වඳුරඹ |
| එච්. ආර්. සයිමන් | ප්‍රියරත්න මාවත, මහවෙල, කටුදම්පේ, දෙඩංදූව, මාතර |
| ඩී. එස්. උපාරිස් | පාලිත සෙවන, මැදගෙදර, කදුරපොකුණ, තංගල්ල |
| පී. ජී. උදුලාවතී | නො. 05, ආදදෙල ජනපදය, වතුගෙදර |
| කේ. දිසානායක | අන සෙවන, මැදසෙවුවිල, කඹුරුගමුව |
| එම්. ඩී. ලීලාවතී | "ඉසුරු" බද්දේගම පාර, උලුවිටිකේ, ගාල්ල |
| කේ. වේලික්නෝනා | මැදවල, බූස්ස, ගාල්ල |
| එම්. ජී. ගුණසිරි | අංක 20, කුලතිලකවත්ත, මැදමුලන |
| නෙලුම් ප්‍රියන්ති, | වලංදෙණිය, බෝපගොඩ, අකුරැස්ස |
| ඩබ්. කේ. කුසුමාවතී | 49 කණුව, පල්ලියගොඩ, මාමඩල |
| එස්. කේ. පී. සුජීව පුෂ්පකුමාර | වෙරලුගහහේන, ගැටමාන උතුර |
| කේ. ජී. මල්කාන්ති | නො. 216, යාය 17, කලප්පනය, අඟුණකොලපැලැස්ස |
| ලීලාවතී කේරලේආරච්චි | රුබසිංහ වත්ත, වල්පිට, තෙලිජ්ජවිල |
| කේ. එච්. ඇග්නස් | සිරිසඳ, නැගෙනහිර කුඩාවැල්ල - වැල්ලගොඩ |
| ඩබ්. ගුණසේකර | බෝගහකොටුව රිකිල්ලපාර, ගගුලන්දෙණිය |
| එම්. මාලනී | අහංදිය, රනංම, ගාල්ල |
| ජී. ඩබ්. සිරිසේන | පූංචිදූව, කුඩුවැල්ල, පෝද්දල, ගාල්ල |
| ඊ. ජී. සෝමපාල | පැල්ලේවත්ත, ගල්පොත්තයාය, දිවුලම්පිටිය. |
| ඒ. එම්. ලයනල් | අංක 9, පද්ධාලෝකමගම, කිතලගම, බට/තිහගොඩ |
| පීරිස් උයන්ගොඩ | කොස්තබලහේන, විජයසිරිපුර. අංක 24, වලස්මුල්ල |
| ඩබ්. ඒ. අමරපාල | 30/7, කොකාවෙල, වඳුරඹ, ගාල්ල |
| එම්. ඒ. සිරියාවතී | උඩුමුල්ලගොඩැල්ල, දන්දෙණිය රත්මලේ, මාතර |
| ආර්. සුමනාවතී | කිරටුවගෙදරවත්ත, බැන්ඩියපොල |
| එච්. කේ. ජයසේන | පැදමැල්ල, ගොනාමුල්ල |
| ඩබ්. ඒ. දයානී රුක්මාලි | මානානහේන හංදිය, ඇල්පිටිය, පිටිගල පාර. |

| | |
|---|---|
| එස්. සමරවිතාරන | පොල්කොලතැන්න, බෙරලපනාතර |
| එච්. ඩී. සුනීතා ජයසිංහ | දියපිටගල්ලන, නවදගල, ඇල්පිටිය |
| කමලා පතිරණ | 214/25, බොරාල පාර, වැල්ලවත්ත, වැලිගම |
| ඩී. එම්. ජිනදස | තල්රාමීගොඩ, ගහලන්දෙණිය, කටුවන |
| අයි. ඩී. විල්සන් | ගාමිනි කඩේබාරේ, කහදූව |
| කේ. පී. සිරියාවතී | 208/6, වටලන්වත්ත, ගෝනාපිනූවල |
| කේ. ඩී. ධර්මදස | පියනසාගල, බද්දේගම |
| ඒ. එම්. සෝමසිරි. | නො. 70, ජනඋදනගම,බතීගම, තිහගොඩ |
| කේ. පියරත්න | ජනක නිවස, ඉහළ මලිදූව, බොල්කන්ද, අකුරැස්ස |
| ඩබ්. ජී. සංජීව | බදූවත්ත, මැලැල්ල, වැලිගම |
| එල්. ඇක්මන් සොයිසා | නූරුවල, බලපිටිය |
| එම්. කේ. නන්දදස මාරසිංහ | කැටගොඩ පාසල අසල, වඩුගම |
| එෆ් ප්‍රේමාවතී | නැගෙනහිර හිත්තැටිය,උස්වත්ත, මාතර |
| කේ. පද්මිනී | නො 507, දඩල්ල, ගාල්ල |
| ඒ. එල්. ජේම්ස් | වලකුඹුරගෙදර, කිරින්ද, පුහුල්වැල්ල |
| ඩී. එම්. රොබට්න් | බේකරිය බාරේ, බෙරලතැලිටිය ඌරුගස්මංහන්දිය |
| පී. ඒ. භද්‍රා තිලන්ති | නො. 78, මිහිඳු මාවත, අලුත්ගම පාර, ඇල්පිටිය |
| ජී. උබේසේන ද සිල්වා | 30/7, ඩලගම පාර, රන්දෙඹේ, අම්බලන්ගොඩ |
| ඩබ්.ඩී. විමලසේන | දික්ඇල්ල, බටපොල |
| පී. පී. ලියනගේ | නො. 211, පැලගස්කැටිය, උනන්පිටිය |
| කේ. ලීලාවතී ද සිල්වා | නො. 46/03, මහමුදලි මාවත, දඩල්ල, ගාල්ල |
| ඩබ්. පී. ප්‍රේමදස | ප්‍රදීප් ප්‍රජාජාල යාය, කිරම, මාතර |
| ඒ. ආරියවතී | 114/2, ගලගම බටහිර, නාකුලුගමුව, බෙලිඅත්ත |
| එච්. ඒ. සිසිලියානා | ගල්ලමුල්ල කඩේබාරේ, නබඳව, යක්කලමුල්ල |
| එච්. එම්. වී. විජේවර්ධන | කොන්දෙණිය, කොස්ලුප්ප, දික්වැල්ල |
| එච්. කේ. සුවාරිස් | 'ශාන්ති' කොකාවෙල කැකනදුර |
| එච්. එච්. ගුණසීලී | රණවිරු, ප්‍රියදර්ශන මාවත, කල්කැටිය උනවටුන |
| එම්. එච්. කරෝලිස් | අංක 219/4, ආචාරියගම, හුංගමපාර, අහුණකොලපැලැස්ස |
| බී. ගුණදස | නො. 244, කුඩාගම්මන 10 වැලිගත්ත |
| ඩබ්. ඒ හෙන්ද්‍රික් | කටවැවේගෙදර, හිඟුරුමුලන. වීරකැටිය |
| පී. ජී. ගුණපාල | අංක 27, අයෝජනගම, දෙඹගොඩ, අහංගම |
| එච්. ජී. එල්. එදිරිසූරිය | සූරියසෙවන, මාමඩල, අම්බලන්ගොඩ |
| ටී. වී. කේ. එච් ඇග්නස් | උපතැපැල් කාර්යාලය බාරේ, ජදූර, අගුණකොලපැලැස්ස. |
| ඒ. කේ. සිපින්නෝනා | ගාල්ල පාර, වතුරුගම, අහුන්ගල්ල |
| ඊ. එම්. විලියම් | බඳුන්ගොඩ, වලහන්දූව |
| කේ. ලිසිනෝනා | හංඩේවත්ත, පඤ්ඤලෝක මාවත, ගිංතොට |
| ඩබ්. සීලවතී | වටරුක බටහිර, ගිංතොට, ගාල්ල |
| ඩබ්. එම්. සිරිසේන | මැලගේවත්ත, කඹුරුපිටිය |
| එම්. කේ. පියදස | සාගර ස්ටෝර්ස් බාරේ, ගල්පොත්ත ඉ/කෝඩලඉමදූව |
| ජී. රුවන් පතිරන | මැදවත්ත, පල්ලේමුලන, මැදමුලන, වීරකැටිය |
| ජී. ජී. අප්පුහාමි | කුඩාගම්මන අංක 38, රම්ඩීන් තැන්න, කාවන්තිස්සපුර, තිස්සමහාරාමය |
| කේ. ප්‍රේමාවතී | කාන්ති සෙවන, මහගොඩ, දෙරපෙ, අගුලුගහ |
| ඩබ්. වී. විජේසේන | වෙලේගෙදර, ගහකොලදෙණිය, යක්කලමුල්ල, ගාල්ල |
| එච්. කේ. ලීලා පියශීලී | හෝඩන්ගෙදර, ඇල්දෙනිය, ගැටමාන |
| යූ. ජී. ජේම්ස් | නයාමුල්ල, උඩලමත්ත, ගාල්ල |
| ඒ. වයි. දයාරත්න | දෙබොදූව, මීරිස්තැන්න, බෙන්තොට |
| ඩබ්, ශාමෙල් අප්පුහාමි | 'මුදිතා' බෙලෙන්ගමුව, මුරගල, කිරලපින |
| ජී. ජී. දයාවතී | මහගංගොඩ, අලුත්වල, අම්බලන්ගොඩ |
| කේ. ජී. කාරියවසම් | සිරිනිවස, ආනන්ද මාවත, කිතුල්පිටිය, ගාල්ල |
| පියසේන රත්නායක | 'පියකරු' දිවුල්ගොඩ, දික්වැල්ල |
| ඩී. රංජනී | කංකානම්ගේ වත්ත, වත්තේගම දකුණ, දික්වැල්ල |
| කේ. එච්. කුමාරදස | හරංග, වීරපාන, ඕපාත, ගාල්ල |
| ඒ. ඊ. සිල්වා | ලතාවාස, හපුගහටතාට, බලපිටිය. |
| ඩී. අජිත් ප්‍රසන්න | රංජිත් විලා - වලගහවත්ත, කුඹුරුගල |
| කේ. ඩී. ධර්මදස | ගාල්ලගේ නිවස, අගලිය බද්දේගම |
| ඩබ්. ඒ. කේ. සීටිං | වල්පිට උග්ගස්හේන |
| පී. ඩබ්. ගුණපාල | පැල්වත්වත්ත, උනැල්ල, පාලටුව, මාතර |
| ජේ. සිරිසේන | ආදර්ශ ගම්මානය, පුවක්දන්ඩාවල, බෙලිඅත්ත. |
| ඩී. ගලප්පත්ති | ආලෝග්එගොඩ, දන්තැටිය, තංගල්ල |
| පී. ටී. ප්‍රියන්ති | නො. 11 කුරුඳුවත්ත, එලකැටිය, අහංගම |
| ඊ. එස්. ප්‍රියංකා | කුසුම්, දෙඩම්ගොඩදූව, ගාල්ල |
| පී. ආර්. ඕපනායක | කොන්ගොඩවත්ත, මීගොඩ, වංචාවල |
| ඒ. එස්. සෝමාවතී | බෝනකවෙල- ඌරගස්මංහන්දිය |

**වසර දෙකක් සඳහා සාමාජිකත්වය ලැබූ අයවලුන් රු. (560.00)**

| | |
|---|---|
| වී. ජී. ඇක්මන් | හැඩිමින්න - මඩවල |
| ආර්. ඒ. ඩී. ඇඩ්වින් | දික්දෙහිපෙනවත්ත, මුලටියන හංදිය, මාතර |
| එච්. ජී. ආරියදස | 361, වෙලගාවහේන, කිරිවැල්දෙල, දෙනියාය |
| බී. ජී. අන්දිරිස් | විජේතුංගපුර, කුඩා නිව, බෝපාගොඩ, අකුරැස්ස |
| එච්. ඒ. ඩේවිඩ් | පරගහහේන, පනාකඩුව, රොටුඹ, ඌරුබොක්ක |
| එච්. වී. එල්. එමිනෝනා | ගොඩැල්ලවත්ත, උඩලමත්ත, ගාල්ල |
| කුසුමාවතී | බෝවෙල, වලස්මුල්ල, පස්කඩේගෙදර, මාතර |
| කේ. කේ. කල්‍යාණවතී | රතගපලාල මාවත, ගුරුසිංහගොඩ, අම්පෙගම |
| පී. ඒ. ඇලිස් | බෙරවකනන්ත පහල අගලිය, අකුරැස්ස |

**වසර 03 සඳහා සාමාජිකත්වය 840.**

| | |
|---|---|
| එස්කේඑස්. පොඩිනෝනා | බී/48, දවුලාන, වංචාවල |
| ඩී. පී. ජේ. පතිරණ | 'චින්තන' සමරපාල විදුහල පාර, පරගහවත්ත, අකුරැස්ස |

# SOME FACTS ABOUT SOME TERRORIST ORGANIZATIONS IN ASIA

**LIBERATION TIGERS OF TAMIL EELAM (LTTE)**

Operates in : Sri Lanka (20,000 members)
Motivation : Fighting the Sinhala majority for separate state - Eelam.
Links : The al-qaeda in Afghanistan, narcotics dealers in Mayanmar, the Abu Sayyaf and the Moro Islamic Liberation Front in the Philippines. Has 30 offices worldwide and strong links in India.

**JAISH -E- MOHAMMAD**

Operates in : Pakistan (6000 members) and India (600 members)
Motivation : fight "Oppression" against Muslims in Kashmir.
Links : Strong Links with the Al-Qaeda network.

**HARKAT - UL- MUJAHIDEEN**

Operates in : Pakistan (8000 members) and India (1000 members)
Motivation : Liberate Kashmir from India
Links : Links with the Al-Qaeda network

**UNITED LIBERATION FRONT OF ASSAM (ULFA)**

Operates in : North - East India (2000 members)
Motivation : to establish a sovereign socialist Assam state.
Links : Reportedly set up training camps in Bhutan and Myanmar, has ties with groups in Pakistan, Afghanistan, Bangladesh and the LTTE.

**ABU SAYYAF**

Operates in : Philippines (1000 members)
Motivation : Stet up a separate Islamic state in Mindanao
Links : The A;-Qaeda, LTTE, known to have sent men for training to Pakistan and the Middle East and bought arms from latter.

**LASHKAR JIHAD**

Operate in : Indonesia (10'000 members)
Motivation : Muslim rights in the Maluku Islands.
Links : Strongest links said to be with Moro terrorists fighting the Philippine government. In the region, it also has ties with the Al-Qaeda, the Abu Sayyaf and the Malaysian Mujahideen group. Connections with Saudi Arabian, Jordan and Yemen have also surfaced.

**UIGHUR SECESSIONIST GROUPS**

Operates in : Xinjiang province of China
Motivation : To re-establish the East Turkistan Republic that existed between 1933 and 1945-49
Strength : Not certain, one estimate said about 300 were training in Afghanistan before September 2001.
Links : Links with the terrorists in Afghanistan, Pakistan, Central Asian Republics, Turkey and the Middle East.

This is quoted from the "Sunday Time" newspaper which is published in Singapore)

LT. THARINDU WEERASINGHE - 2 SLLI
21 SLNG
216 BDE
GAJASINHAPURA, CHEDDIKULAM.

# That's how to be a winner

To be the best that you can be
Have faith in your ability
Live joyfully and honestly
That's how to be a winner.

Take time to listen and to share,
Be patient, generous, and fair
Treat others with respect and care...
That's how to be a winner.

See beauty everywhere you go,
Appreciate the strengths you show,
And seek out ways to learn and grow...
That's how to be a winner

Expect good things to come to you,
Believe there's nothing you can't do,
Make each day count your whole life through.....
That's how to be a winner

**Maj INK Dewage RSP SLLI**
**RHQ SLLI**

# 51 වන සේනාංක බක්මහ උළෙල ජයග්‍රහණය 6 ශ්‍රීලපාහ සතුවූ වගයි.

පාබල රෙජිමේන්තු 6 වන සාමාජිකයා වන අප බළඇණිය ආරම්භයේ සිටම සෑම අතින්ම ඉදිරියෙන් සිටින බැව් සදහන් කරනුයේ මහත් ආඩම්බරයෙනි. ඉතා දක්ෂ නිලධාරි/සෙසු නිළයින් ගෙන් සමන්විත අප, බළැඇණියක් වශයෙන් උසස් මූලස්ථාන බොහොමයක ගෞරවාදරයට පාත්‍ර වී ඇත. ඒ සදහා වත්මන් අණදෙන නිළධාරි මේජර් ඒඑල්එස්කේ පෙරේරා ආර්එස්සී ශ්‍රීලපාහ ගේ උත්සාහය හා මග පෙන්වීම ඉතා අගේ කොට සැලකිය හැක. ඒ වෙනුවෙන් අනෙකුත් නිළධාරි/සෙසු නිළයින් ගෙන් ලද දයකත්වය හා සහයෝගය ඉතා උසස් මට්ටමක පවතින බව සදහන් කිරිමට කැමැත්තෙමි.

අප බළඇණිය ආරම්භයේ පටන්ම ක්‍රියාන්විත රාජකාරින් හිදී නොයෙකුත් ජයග්‍රහණයත් ලැබුවා මෙන්ම ක්‍රීඩා කුසලතාවයන් හිදී ද නොයෙකුත් දක්‍ෂතා පෙන්නුම් කර ඇත. ලැබෙන සුළු විරාමයෙන් උපරිම පල නෙලා ගන්නා අතර සෑම විටම උත්සාහ දරනුයේ පුහුණුවීම් තුලින් තම හැකියාවන් වර්ධනය කර ගැනීම වෙනුවෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අද උතුරු නැගෙනහිර කුරිරු යුද්ධයට මුහුණ දී ලබාගන්නා ලද ජයග්‍රහණයන් කාගේත් පැසසුමට ලක්ව ඇති බවත් ඒ වෙනුවෙන් හිටපු හා වත්මන් අණදෙන නිළධාරි තුමන් ඇතුළු අනෙකුත් නිළධාරීන්ගේ මගපෙන්වීම හා උනන්දුව මහත් පිටුවහලක් වී ඇති බවත් විශේෂයෙන් සදහන් කළ යුතුය. යුද්ධයට පමණක් සීමා නොවූ 6 වන ශ්‍රී ලංකා පාබළ හමුදව ක්‍රීඩා කුසලතාවයන්ගෙන් හෙබි නිළධාරි/සෙබළ කැලකගෙන් සමන්විත බළඇණියක් බව බොහෝ කලක සිට ප්‍රචලිතය. ඒ බැව් 51 සේනාංකය වෙතින් පවත්වන ලද බක්මහ උළෙල තුලින් මනාව පිළිබිඹු විය. දනට පාසයූර් කොලොම්බුතුරෙයි අරියාලෙයි යන ප්‍රදේශයන්හි කලපු තිරයේ ඉදිරි ආරක්‍ෂක වලල්ලේ රාජකාරියන්හි නිරතව සිටින අප බළඇණිය බක්මහ උළෙල සදහා සහභාගි වූයේ මහත් උද්යෝගයෙන් යුතුව බැව් සදහන් කළ යුතුය.

51 වන සේනාංකය සහ 512 බසේමු යටතේ රාජකාරි කරනු ලබන සියලුම බළඇණිවලට අයත් නි/සෙනින්ගේ ඒකාකාරී ජීවිතයට නව පනක් දෙමින් 2002.04.16 දින බක්මහ උළෙල පැවැත්වීමට සේනාංකාධිපති තුමන්ගේ අදහස විය. ඒ වෙනුවෙන් වූ සියලු කටයුතු සිදුවෙමින් තිබියදී සිංහල හිංදු අළුත් අවුරුදු උදව එලඹිණි. දූ දරුවන් සහෝදර සහෝදරියන් නෑදෑ හිතමිතුරන් සමගින් අප අවුරුදු චාරිත්‍ර ඉටුකිරීම සෙබලුන් වන අපට ඉඩප්‍රස්ථා සීමිත වුවද සහෝදර සෙබළුන් සියලුදෙනා එක්ව අලුත් අවුරුදු උදව විචිත්‍රවත් අන්දමින් සමරන ලදි. ඉන් අනතුරුව අප්‍රේල් 16 වන දින පවත්වන ලද බක්මහ උළෙල සදහා බළඇණි ඒකරාශි විය. මෙහිදී බක්මහ උළෙලක අසිරිය විදහා දක්වමින් ජන ක්‍රීඩා ඇතුළු තවත් විශේෂාංග රැසකගෙන් සමන්විත 51 වන සේමු බක්මහ උළෙල ආරම්භ වූ අතර එහිදී ජයග්‍රහණ රැසකගේ බලාපොරොත්තු සහිතව ඒ සදහා අප බළඇණිය සහභාගි විය. දනට අප රැදී සිටින යුධ මානසිකත්වය මොහොතකට අමතක කල සෙබළුන් මහත් උද්යෝගයකින් හා උනන්දුවෙන් යුතුව ඒ සදහා සහභාගී විය. පාබළ බළඇණියක කාර්යක්‍ෂමතාවන් හා හැකියාවන් විදහා දක්වමින් විශේෂාංගරැසකගේ ජයග්‍රහණයන් අප බළඇණිය සතු කර ගන්නට මෙම සෙබලුන් හට හැකියාවක් ලැබුණි.

බක්මහ උළෙල වෙනුවෙන් පවත්වන ලද සියලුම තරග අතුරින් බොහොමයක් පලමු දෙවන හා තෙවන ස්ථානයන් මෙම ඒකක විසින් දිනා ගත් අතර එම තරග හා ලබාගන්නා ලද ස්ථානයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| කඹ ඇදීමේ තරගය | - ප්‍රථම ස්ථානය |
| ලිස්සන ගහ නැගීම | - ප්‍රථම ස්ථානය |
| අත්පන්දු තරගය | - ප්‍රථම ස්ථානය |
| එල්ලේ තරගය | - ප්‍රථම ස්ථානය |
| බාධක දිවීම | - ප්‍රථම ස්ථානය |
| අලියට ඇහැ තැබීම | - ප්‍රථම ස්ථානය |
| බනිස් කෑම | - ප්‍රථම ස්ථානය |
| සැගවුන අමුත්තා සෝරීම | - ප්‍රථම ස්ථානය |
| කනාමුට්ටි බිදීම | - ප්‍රථම ස්ථානය |
| සංගීත පුටු තරගය | - ප්‍රථම ස්ථානය |
| විකට ඇඳුම් තරගය | - ප්‍රථම ස්ථානය |
| සෙමින් බයිසිකල් පැදීම | - ප්‍රථම ස්ථානය |
| ලොකුම හැඩීම | - ප්‍රථම ස්ථානය |
| හොදම සිනහව | - ප්‍රථම ස්ථානය |
| පාපැදි තරගය | - දෙවන හා තෙවන ස්ථානය |
| ගම හරහා දිවීම | - තෙවන ස්ථානය |

සියලු විශේෂාංග අතුරින් විශේෂ අංගයක් වූ විකට ඇඳුම් තරගයේදී ඒකක විසින් රූපවාහිනී තිරයක් මතින් ඉදිරිපත් කරන ලද ලොව කුඩාම මිනිසාගේ නිර්මාණය වෙනුවෙන් සුවිශේෂී ස්ථානයක් හිමි විය. එය 51 සේනාංකාධිපති තුමාගේ මෙන්ම බළසේනාධි පති වරුන්ගේද අනෙකුත් ඒකක අනි වරුන් ඇතුලූ සියළුම නිළයින්ගේ ප්‍රසාදයට ලක් විය. එය නරඹන්නන්හට විශ්මය හා හාස්‍යජනකත්වය දනවන දසුනක් විය.

තවද බක්මහ උළෙලේ විශේෂ අංගයක් වූ ඒකක කුටි අතුරින් මෙම ඒකකය වෙතින් තනන ලද කුටිය යාපනය කොටු පවුර මූර්තිමත් වන අයුරින් නිර්මාණය කරන ලද්දකි. එය අනෙකුත් කුටි අතරින් කැපීපෙනෙන ලද්දක් විය. ඒ සදහාද විශේෂ ස්ථානයක් හිමි වූ අතර එහි සියලු ගෞරවය කපිතන් කේපීඑල් අමුණුපුරේ ආර්එස්සී ශ්‍රීලපාහ ඇතුලූ කණ්ඩාමක් සතු විය. එමගින් මෙම ඒකක නි/සෙනින්ගේ කලා හැකියාවන් පිළිබිඹු විය.

සියලු අංගයන් අවසානයේ ත්‍යාග ප්‍රධාන උත්සවය පවත්වන ලද අතර එහිදී පාබළ බළඇණියක ප්‍රෞඩත්වය හා අභිමානත්වය ලෙලදෙන්නට විය. එය ඒකක අනි ඇතුලූ අනෙකුත් සියලු නිළයින්ගේ සිත් සතුටු කරවන්නක් විය. ත්‍යාග ප්‍රධානෝත්සවයෙන් අණතුරුව සියළුම නිළයින් ප්‍රීති ඝෝෂා මැද සතුටින් විසිර ගියහ.

සෑම අතින්ම අති දක්‍ෂ නි/සෙසුනිළයින් පිරිසක් සිටින ශ්‍රීලපාහ පාබළ හමුදවේ ඉදිරි ගමනට මාගේ සුභාශිංසනය.

**ලුතිනන් එම්ටීඅයි ගුණවර්ධන ශ්‍රීලපාහ**
**විධායක අධිකාරි 6 ශ්‍රීලපාහ**

ජායාරූප 18 වන පිටුවේ දක්වා ඇත




යාපනය කොටු පවුරේ ආකෘතිය



එකක කුවිය ඉදිරිපිට තනා තිබූ පැරණි කාලතුවක්කුවේ ආකෘතිය 51 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ටීවීආර් ද සිල්වා ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ පරීක්ෂාවට ලක් වෙමින්



කඹ ඇදීමේ තරගයේ එක් අවස්ථාවක්



අත්පන්දු ක්‍රීඩා තරගයේ එක් අවස්ථාවක්



පොල් අතු විවීමේ තරගයේ එක් අවස්ථාවක්

# මල

'මල' ලස්සනය පිවිතුරුය සුවදය. මල් වර්ග දහස් ගණනකි. මල් වලට නොයෙකුත් නම් ඇත. මල් වලින් ලස්සනම මල රෝස මලය. මල් වලින් පැණි අරන් ඔබරුත් යති. ඒ මල ලස්සන නිසාය. මල් සමහරු තලා පෙලා දමති. මලට වුවත් මල පනිනවා ඇත. ඒත් මල ඒ බව නොපෙන්වයි. වැඩක් වැරදි වුවහොත් මලයේකයි කියා සමහරු කියති. ඒ ඔහු මල පැනපුබව නොඅගවාය. මල්ලිලා මල් වැටුනු ගවුම්වලට ආසාය. ඒ නංගිලාට තෑගි දෙන්නටය. තවත් සමහර මල්ලිලා මල්වතුගානේ පෙම් කරති. මල්ලිලාට මල් මල් වයසේ නිසා එය ගානක් නැත. ජරාවක් කෑවොත් මලපහ කරයි. කාපු දේ මතක් වී මල පූලියයි කියන්නේ එවිටය. වැඩිපුර කේළම් කියන්නේ මල්ලිලාය. නංගිලා එවිට මල්ලිලාට මල්ල යැයි කියති. මළගෙවගල්වල ගිහින් මල්ලිලාට ඉන්නට බැරිය. ඒ මලපනින වැඩ කරන නිසාය. මාමලා මල්ලිලාට වැඩිය කැමති නැත. මලට රේණුසේ ඔබ ලග ඉන්නම් කියා මල්ලිලා කියති. එහෙත් මල්ලිලා යනවා නංගිලාවත් නොදනිති. මල ගැන මම දන්නේ පුංචි කාලේ මල්ලි මට කියාදුන් සිංදුවක් නිසාය. මල් ලස්සනයි හොද හොද පාටයි කීවාට ගද මල්ද ඇත. අවලස්සන මල්ද ඇත. ඒ කිඩාරම් මල්ය. මලගැන කිව්වා ඇතිය. වැඩිය ඒ ගැන ලිව්වොත් කියවන අයට මලපනින නිසා මෙතකින් මල ගැන කීම නතර කරමි.

ලිව්වේ-
සෙ/2 ආර්01344
කාසෙ තරංගි ලියනගේ
මූලස්ථානය - 2 ශ්‍රීලයුකාබ
රණසේවාපුර, අනුරාධපුරය.

# දඟකාරකම

'නිවාඩුවක් දමා හනික
නුඹ එන්නේ මා සොයා
ඇවිලුන ගිනි දල් නිවා
මා සනසයි නුඹ සද
දෙඅතට අරන් මගේ මුහුණ
සිපගනී මා නීල නුවන්
ඒ අතරෙ හොර රහසේම
මාගේ දෙතොල් නුඹ සිප ගනී
කෝ මම තේ හදන් එන්න
එපා ඕන නෑ කියා
යලිත් වරක් මා මුව සිප
හිනාවෙන්නේ ලෙංගතුකමින්
පරන පුරුදු විලසින්ම
කථා කරයි නුඹෙ දෙනුවන්
ලැජ්ජාවෙන් මා මිරිකී
මා පනිනවා ඉක්මනටම
තේ මුට්ටිය ලිප තබන්න
දන්න නිසා නුඹෙ දගේ.'

7 ශ්‍රී.ල.පා.හ
සෙ 15805 ලා/ කෝ. ද සිල්වා බීඑච්ආර්යූ ගේ
ආදරණීය බිරිද තයනා කේ කාරියවසම්
දෙඩන්දුව.

# ආබාධිත සෙබලුන්ගෙන් මෙහෙවරක්

ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් දැනට රෙජිමුල ශ්‍රීලපාහ වෙත ඇතුළත් කර සිටින සෙනීන් ගෙන් කොණ්ඩා කැපීම සහ ඇඳුම් මැසීමට හැකියාවක් ඇති ආබාධිත සෙබළුන් යොදවා ඇඳුම් මැසීමේ සහ කොන්ඩා කැපීමේ (සැලූන්) ආයතනයක්, සෙබළුන්ගේ ප්‍රයෝජනය සඳහා 2002 අප්‍රේල් මස 01 වන දින රෙජිමුබ ශ්‍රීලපාහ වෙතින් පනාගොඩ කඳවුරේ දී ආරම්භ කරන ලදී.

එම ආයතනය ශ්‍රීලපාහ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ආර්ඕඑම්ඩී රත්නායක ආර්ඩබ්පී ආ්එස්පී පීඑස්සී විසින් 2002 අප්‍රේල් මස 01 දින පෙරවරු 1137 ට යෙදුණු සුභ මොහොතින් විවෘත කරන ලද අවස්ථාව දැක්වෙන ඡායාරූප පහත පළකර ඇත.



මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී විසින් පීත්ත පටිය කපා ඇඳුම් මැසීමේ සහ කොණ්ඩා කැපීමේ ආයතනය විවෘත කිරීම රෙජිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරි මේජර් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ ද පසෙකින් සිටියි.




මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එරස්පී පීඑස්සී විසින් ඇඳුම් මැසීමේ ආයතනයේ නාමපුවරුව නිරාවරණය කිරීම .

බුද්ධි අංශය - රෙජිමුබ ශ්‍රීලපාහ





නි/62225 කපිතාන් එච්වීඒ සෝමවීර ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ 2002.06.06 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී සමන්ති මෙනවිය සමග විවාහ වන ලදී.

2002 ජූනි මස 17 වන දින කපිතන් එච්ඩීටී ජයකොඩි ශ්‍රීලපාහ අයි එස් විජේකෝන් මෙනවිය සමග නුවර ඩේවෝන් රෙස්ට් හෝටලයේදී අතිනත ගන්නා ලදී.





නි/63049 කපිතාන් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ 2002 ජූනි මස 07 වන දින බිලූ ස්කයි හෝටලයේදී මධූ මෙනවිය සමග විවාහ වන ලදී.

නි/62237 කපිතාන් ජේපීඩීසීපීඑල් ඩයස් ආර්එස්පී ශ්‍රීලපාහ 2001 සැප්තැම්බර් මස 21 වන දින හලාවත රෝයල් ලෝටස් ශාලාවේදී කාංචනා දිල්රුක්ෂි හේරත් මෙනවිය සමග විවාහ වන ලදී.



නි/62545 කපිතාන් අයි පී ජයසිංහ ශ්‍රීලපාහ 2002 මැයි මස 02 දින බේරුවල ෆාම් ගාර්ඩ්න් හෝටලයේදී ඉනුෂා මෙනවිය සමග විවාහ වන ලදී.

# මංගල සීනු...



නි/3731 ලුතිතන් ටීඑන්පී චන්ද්‍රකුමාර ශ්‍රීලපාහ 2002
මාර්තු මස 07 වන දින පානදුර ෆිනින්ෂියුලා හෝටලයේදී
ඩබ්ඩී ලක්රාණි විතාන මෙනවිය සමග විවාහ වන ලදී.



නි/63714 ලුතිතන් ඩබ්එස් වීරසිංහ ශ්‍රීලපාහ 2002 මැයි මස 22 වන දින
හික්කඩුව නිපෝන් හෝටලයේදී පූර්නිමා මෙනවිය සමග විවාහ වන ලදී.



සෙ/302039 සැරයන් කුමාරසිංහ ඒපී 2001 ඔක්තෝබර් මස 18 වන දින දිගන
විලේජ් හෝටලයේදී චන්දිමා තුෂාරි නන්දසිරි මෙනවිය සමග විවාහ වන ලදී.





සෙ/14ඩී00697 සාසෙ
ආරියරත්න ටීඩී යන
සෙනී 2002 ජනවාරි
මස 18 වන දින
කොට්ටාපිටියේ විවාහ
රෙජිස්ටාර්
කාර්යාලයේදී නාලනී
වික්‍රමසිංහ මෙනවිය
සමග විවාහ වන ලදී.


සෙ/303844 කෝප්‍රල් ජයවික්‍රම ජීඑස් යන කොනොනි
2002 ජනවාරි මස 28 වන දින දිගන බංඩාරගම
විවාහ රෙජිස්ටාර් කාර්යාලයේදී කමනි සුජීවා
ප්‍රියදර්ශනී මෙනවිය සමග විවාහ වන ලදී.

# 10 වන ශ්‍රී ලංකා පාබළ හමුදුව පැවැත්වූ සිංහල අලුත් අවුරුදු උත්සවය

වර්ෂ 2002 ක් වූ අප්‍රේල් මස 07 වන දින පෙරවරු 0700 පැයට ඇරඹුණු මහා මැරතන් ධාවන තරගයත් සමග 10 ශ්‍රීලපාහ ඒකකය ස්ථානගත ඕමන්ත කඳවුරු භූමියේදී මහා බක්මහ සැණකෙලිය ආරම්භ විය. එදින ඒකකයේ අණදෙන නිලධාරි තුමාවන මේජර් එච්එච්කේ ගුණරත්න ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් ජාතික ධජය ඔසවා විරාගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දල්වා උදවූ සුභ මොහොතේ දී අණදෙන නිළධාරි තුමාගේ අලුත් අවුරුදු පණිවුඩය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු ආරම්භ කරන ලදි. සැණකෙළි උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීජේ රණවීර ආර්ඩබ්පී ආර්එස්සී යූඑස්පී පැමිණි අතර,අනෙකුත් ආරාධිත අමුත්තන් ලෙස 563 බළසේනාධිපති කර්නල් අයිජ්පී ඉද්දමල්ගොඩ ආර්එස්පී, 562 බළසේනාධිපති කර්නල් එස් ආර් මානවඩුගේ ආර්එස්පී අයිපී සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිළධාරින් ඇතුලුව වෙනත් ඒකක අණදෙන නිළධාරින් සමගින් නිළධාරින්/සෙසුනිළයින් විශාල සංඛ්‍යාවක් මේ සදහා සහභාගිවන ලදි. මෙම බක්මහ සැණකෙළිය යුධ හමුද කඳවුරු භූමියක් තුල සොල්දදුවන්ගේ සහභාගිත්වයෙන් යුතුව පමණක් පැවැත්වූවත් ගම්බද පරිසරයක ගැමි ජනයාගේ සහභාගිත්වයෙන් යුතුව පැවැත්වෙන අවුරුදු උළෙලක දක්නට ලැබෙන සිරිය දක්නට ලැබීම මෙහිලා විශේෂයෙන් සදහන් කළ යුතුය. එදින මෙවැනි විශේෂාංග සහ තරග අතර බනිස් කෑම, අලියට ඇස තැබීම, නිළධාරින්ගේ කොට්ට පොර තරගය, කඹ ඇදීම, සැගවුන අමුත්තා සෙවීම, විකට ඇඳුම් තරගය සිවිල් සේවක මහතුන්ගේ බාධක දිවීමේ තරගය, අවුරුදු කුමරිය තේරීමේ තරගය, හොදම ඇඩීම, ලොකුම බොරුව, සංගීත පුටු තරගය ආදී සියලුම ඉසව් සදහා සෑම කණ්ඩායමකින්ම නියෝජනය වන පරිදි භට පිරිස් සහභාගි විය. මෙම කටයුතු සාර්ථක කර ගැනීම සදහා සියලුම භට පිරිස් විසින් ලබාදුන් සහයෝගය කැපවීම උනන්දුව මෙහිලා විශේෂයෙන් සදහන් කළ යුතුය.



අලියාට ඇස තැබීමේ තරගයට ඉදිරිපත් වී සිටින තරග කරුවන්




අයෝම පුරුෂයා තරගයට ඉදිරිපත් වී සිටින තරග කරුවන්



ලිස්සන ගසේ නැගීමේ තරගයට ඉදිරිපත් වී සිටින තරග කරුවන්



ගෝනි රේස් තරගයට ඉදිරිපත් වී සිටින තරග කරුවන්



කඹ ඇදීමේ අවසන් මහ තරගයට සුදුසුකම් ලබා ඇති "ආධාරක" සහ "ඩී" කණ්ඩායම් තරග කරුවන්



හොඳම කුටිය තේරීමේ තරගය සඳහා "පාලන" කණ්ඩායම වෙතින් ඉදිරිපත් කරන ලද "සිංහයකුගේ" හැඩය ගත් ජයග්‍රාහී කුටිය සමග පාලන කණ්ඩායමේ තරග කරුවන්

සැණකෙළි භූමියේ එක් පසෙකින් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අපරදිග සංගීත කණ්ඩායම වෙතින් නැගෙන සංගීත සත්සර රාවයෙන් මුළු සැණකෙළි භූමියම ප්‍රබෝධමත් කල අතරතුරේ දී විවිධ තරගයන්ට සහභාගි වී ඉන් ජයලැබූ ජයග්‍රාහකයන් සඳහා 56 සේනාංකාධිපතිතුමා ඇතුලූ අනෙකුත් ආරාධිත අමුත්තන්ගේ සුරතින් තෑගි ප්‍රධානය කිරීම සිදු කරන ලදි. ත්‍යාග ප්‍රධානයෙන් අනතුරුව සේනාංකාධිපති තුමා විසින් බලැඇණි යේ සියලූම භට පිරිස් අමතා යුධ කදවුරක් තුල මෙවැනි සැණකෙළි පැවැත්වීමේ ඇති වැදගත්කම අතර විශේෂයෙන්ම හා ආරක්‍ෂක හමුද සාමාජිකයින් වන අප බොහෝ දෙනෙකුට තම දෙමව්පියන්, බිරින්දෑවරුන්, දූදරුවන් ඇතුලූව අනෙකුත් ඥාතීන් සමග එක්වී තම ගම්බිම් බලාගොස් මෙවැනි සැණකෙළි සඳහා සහභාගි වීමට ඇති ඉඩ ප්‍රස්ථා නොමැති මෙවන් අවස්ථාවක මෙවැනි උත්සව පැවැත්වීමේ ඇති වැදගත්කම වටහා දෙන ලදි. ඉන් අනතුරුව අණදෙන නිළධාරීතුමා ඇතුලූ ඒකකයේ අනෙකුත් නිළධාරීන් සහ සියලූම සෙසුනිළයින්ටත් 56 සේනාංකාධිපති තුමා විසින් උදවන සිංහල අලූත් අවුරුද්ද වෙනුවෙන් පැතුම් එක්කර 1800 පැයට පමණ රෙජිමේන්තු ගීතය හා ජාතික ගය ගායනා කොට සංගීත සැදෑවේ කටයුතු නිමාකර 2002 බක්මහ සැණකෙළිය සමාප්ත කර සියලූ දෙනා සතුටින් විසිර යන ලදි.

සොල්දාදුවන් වශයෙන් අප සියලූදෙනා තම ඥාතීන්ගෙන් දුරස් වී සිටින මෙවන් අවස්ථාවක සිතෙහි ඇති වන්නාවූ පීඩාකාරී සිතුවිලි අකාමකා දැමීම සඳහා 10 ශ්‍රීලපාහ අණදෙන නිළධාරී තුමාගේ ප්‍රධාන උපදේශකත්වයෙන් යුතුව මෙවැනි සාර්ථක බක්මහ උළෙලක් පැවැත්වීම තුලින් ලැබූ සතුට අප්‍රමාණය. බලඇණියේ භට පිරිස් එක්වී සාමූහිකව මේ ලැබූ සතුට ඒකකයේ ඉදිරි ගමන් මග සරසාලනු තවත් එක් සුභ ලකුණකි. 2002 වසර වෙනුවෙන් සියලූම භට පිරිස් හි සමගිය සතුට සමාදනය සහ චිත්ත පීඩාව මග හැරලීම සඳහා මෙවැනි බක්මහ සැණකෙළියක් පැවැත්වීමට ප්‍රධානත්වය ගෙන කටයුතු කල අණදෙන නිළධාරී තුමා හට බලඇණියේ සියලූම භට පිරිස් වෙනුවෙන් කෘතඥතාවය පිරි නැමීම ඉතාම කාලෝචිතය. එදින පැවැත්වූ බක්මහ සැණකෙළිය යලිත් දිනක දකින්නට සියලූම භට පිරිස් ඊලග වසර උදවනතෙක් බලා හිදින්නේ නොඉවසිල්ලෙනි.



නිලධාරී කොට්ටා පොර තරගයේ ජයග්‍රාහී තරුගකරුවා අණදෙන නිලධාරී අතින් ත්‍යාග ලබා ගන්නා අවස්ථාව



කඹ ඇදීමේ අනු ශූරතාවය දිනූ "ඩී" කණ්ඩායම ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිනි 56 සේනාංකාධිපති තුමා අතින් ත්‍යාග ලබාගන්නා අවස්ථාව

ලූතිතන් ආර්ජ්එල්ජ් රංජන ශ්‍රීලපාහ
ති/62294
10 ශ්‍රීලපාහ

# ආබාධිත රණවිරුවන්ට පරිත්‍යාග

3 ශ්‍රීලපාහ ඒකකය සමගින් ක්‍රියාත්විත රාජකාරියේ යෙදී සිටිය දී ත්‍රස්ථවාදී ප්‍රහාරයකට ලක්ව පූර්ණ ආබාධිත තත්ත්වයට පත් සෙ/303558 සාසෙ ප්‍රියන්තලාල් ආර්ඩී හට රෝද පුටුවක් සහ අත්වාරු යුවලක් නො: 490/12 තලංගම උතුර, බත්තරමුල්ල යන ලිපිනයේ පදිංචි මොහොමඩ් මහතා සහ රංජනී ෆොන්සේකා මහත්මිය විසින් 2002 අප්‍රේල් මස 26 වන දින ඉහත ලිපිනයේ දී පරිත්‍යාග කරන ලදී.



*එම පරිත්‍යාගයෙන් පසු සෙ/303558 සාසෙ ප්‍රියන්ත ලාල් ආර්ඩී සහ රෙජිමුබ ශ්‍රීලපාහ ලුතිතන් ආර්පීජේ පුෂ්පකුමාර ශ්‍රීලපාහ මොහොමඩ් මහතා සහ රංජනී ෆොන්සේකා මහත්මිය සමග ඡායාරූපයකට පෙනී සිටි අයුරු.*

යුද්ධයේ දී ආබාධිත තත්ත්යට පත් රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ත්‍රිරෝදය රථයක් එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලාංකික දනපතියෙකු වන මහින්ද පෙරේරා මහතා විසින් 2002 අප්‍රේල් මස 10 වන දින රෙජිමුබ ශ්‍රීලපාහ ඒකකය වෙත පරිත්‍යාග කරනලදී.

රෙජිමුබ ශ්‍රීලපාහ අණදෙන නිලධාරී මේජර් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් මහින්ද පෙරේරා මහතාගෙන් පරිත්‍යාග කරන ලද ත්‍රිරෝද රථය රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ ඉදිරිපිට දී භාරගන්නා ලද අතර, එම අවස්ථාවේ ලබාගත් ඡායාරූප පහත පලකර ඇත.



*අණදෙන නිලධාරී මේජර් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ත්‍රිරෝද රථය මහින්ද පෙරේරා මහතා ගෙන් භාර ගැනීම*



*ත්‍රිරෝද රථය භාර ගැනීමෙන් අනතුරුව රෙජිමුබ අනි මහින්ද පෙරේරා මහතා සමග ත්‍රිරෝද රථයේ නැගී ගමන් ගන්නා අයුරු.....*

# ශ්‍රීලපාහ කාන්තා සංගමයෙන් පනාගොඩ යුහ මූලික රෝහලට මුදල් පරිත්‍යාගයක්....

පනාගොඩ පිහිටි යුධ හමුදා මූලික රෝහලෙහි වාට්ටු අංක 01 සහ 02 හි නේවාසික රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකර තිබූ වැසිකිළි පාවිච්චියට නුසුදුසු තත්ත්වයේ තිබූ බැවින් එය ප්‍රතිසංස්කරණය කර යථාතත්වයට පත්කිරීම සඳහා වැය වන මුදල ශ්‍රී ලංකා පාබල හමුදා කාන්තා සංගමයේ සභාපතිනි සෝනියා කෝට්ටේගොඩ මැතිණිය ඇතුළු ශ්‍රීලපාහ කාන්තා සංගමය මගින් පරිත්‍යාග කරන ලදී.

එම පරිත්‍යාගය වෙනුවෙන් යුහමුරෝ(පනා)වෙතින් ස්තුති කර එවන ලද ලිපිය පහත පළකර ඇත.

**ARMY BASE HOSPITAL**
ARMY CANTONMENT
PANAGODA,
HOMAGAMA,
SRI LANKA.
Tel: 855178 / 855356-60 EXT. 4485

යුදහමුදා මූලික රෝහල
යුදහමුදා පෙපදය
පනාගොඩ,
හෝමාගම

යුහමුරෝ/පනා/පා/09/2002(෧ )

රෙජිම ශ්‍රීලපාහ

2002 මැයි මස 28 දින.

<u>පරිත්‍යාග මුදලින් රෝහලේ අළුත් වැඩියාවන් ඉටුකිරීම යුහමුරෝ(පනා).</u>
<u>වාට්ටු අංක 01 සහ 02 හි වැසිකිළි අළුත් වැඩියා කිරීම.</u>

යොමුව:

අ. අංක: ශ්‍රීලපාහ/රෙජි/රෙඅස/34( – ) හා 2002.11.09 දිනැති ඔබ රෙජිමේන්තු මධ්‍යස්ථාන ලිපිය.

01. යොමුකළ 'අ' ලිපිය මගින් මෙම මූලික රෝහල වෙත පරිත්‍යාග කරන ලද මුදලින් වාට්ටු අංක 01 සහ 02 හි රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකර තිබූ පාවිච්චියට ගැනීමට අපහසු තත්ත්වයේ පැවති වැසිකිළි අළුත් වැඩියා කිරීමෙන් පසු එය රෝගීන්ගේ ප්‍රයෝජනයට ගැනීම සුදුසු පරිදි පිළියෙල කරන ලදී.

02. හුදෙක්ම එම වාට්ටුවල නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන්නේ ක්‍රියාන්විත රාජකාරියේදී තුවාල ලබා එන අයවලුන් බැවින්, එම අයට වාට්ටුවේ ඇති වැසිකිළි පාවිච්චියට ගැනීමට අපහසු තත්ත්වයක පැවති නිසා එම අය මහත් අපහසු භාවයන්ට මුහුණ පෑමට සිදුවේ. එමෙන්ම මෙම අළුත් වැඩියාවන් හමුදාමය පිළිවෙතට අනුව කර ගැනීමට ප්‍රමාද වන හෙයින්, මෙවැනි පරිත්‍යාග කරනු ලබන මුදල් වලින් එය කඩිනමින් ඉටුකර රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදීම එම අයගේ චිත්ත දෛර්‍ය වර්ධනය වීමට මහත් පිටුවහලක් වේ.

03. කරුණු එසේ හෙයින් ඔබ රෙජිමේන්තුවේ කාන්තා සංගමය විසින් පරිත්‍යාග කරන ලද මුදලින් වාට්ටු අංක 01 සහ 02 හි වැසිකිළි වල සියළු අළුත් වැඩියාවන් ඉටුකර එය රෝගීන්ගේ ප්‍රයෝජන ගැනීමට සුදුසු පරිදි පිළියෙලකර භාරදුන් බවත්, ඒ පිලිබඳව පනාගොඩ යුද හමුදා මූලික රෝහලේ අණදෙන නිළධාරි සහිත ඇතුළු කාර්ය මණ්ඩලයේ ස්තුතිය පලකර එවනු ලබන බව මින් දන්වා සිටිනු ලැබේ.

ඩබ්ඩබ්ඩබ්ඩී ප්‍රනාන්දු ආර්එස්පී
මේජර් – ගරු
අණදෙන නිළධාරි යුහමුරෝ(පනා)
වෙනුවට.

පිටපත:
ශ්‍රී ලංකා පාබල හමුදා කාන්තා සංගමය.

රෙජිමේන්තු මධ්‍යස්ථානය - ශ්‍රීලපාහ

# වෙහෙරහේන පූර්වාරාම රාජ මහා විහාරය

# Weherahena Poorvarama Raja Maha Viharaya

වෙහෙරහේන - මාතර - ශ්‍රී ලංකා
ටෙලිෆෝන්:- 041-22121 හෝ 30453
ෆැක්ස් - 041-23700

Weherahena Matara - Sri Lanka
Email :- daulasun@sltnet.lk

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම
මහා සංඝ සභාවේ දක්ෂිණ පාර්ශවයේ
ප්‍රධාන සංඝනායක පූර්වාරාම රාජමහා
විහාරාධිපති සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල සිරිරේවත
මහෝපාධ්‍යාය දවුලගල සංඝරතන මහා ස්ථවිර

Saddharma Kirti Sri
DAULAGALA SANGHARATANA
Nayaka Thero
Chief Incumbent of Southern Province
Date :-


ගරු යුද හමුදා පතිතුමා
යුද හමුදා මූලස්ථානය
කොළඹ

**<u>දකුණු පළාතේ මියගිය / අතුරුදන් රණවිරුවන් අනුස්මරණය කිරීමේ පුණ්‍යෝත්සවය</u>**

ගරු හමුදා පතිතුමනි

2002 අප්‍රේල් මස 05 වෙනි දින හා 06 වෙනි දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකා පාබල හමුදාව රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස් එච් එස් කොට්ටේගොඩ මැතිතුමාගේ හා කර්නල් ආර් ඇම් බී රත්නායක මැතිතුමාගේ මූලිකත්වයෙන් ද මේජර් ඇහැලමල්පේ මැතිතුමාගේ හා කපිතාන් තිලක් සේනානායක මැතිතුමාගේ උපදේශකත්වයෙන් දකුණු පළාතේ මියගිය හා අතුරුදන් රණවිරුවන් අනුස්මරණය කිරීමේ මහා පිංකම අප විහාර ස්ථානයේ දී සිදු කරන ලදී.

2002 අප්‍රේල් මස 05 වෙනි දින සවස 07 00 ට බෝධි පූජාවක් හා අනුශාසනාවක් ද රාත්‍රී 9 00 සිට පසු දා (06) පහන් වන තුරු සර්වරාත්‍රික පරිත්‍රාණ දේශනාවක් පවත්වා රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන්ට ස්වාමි දියණිවරුන්ට හා දූ දරුවන්ට ද දැනට සටනෙහි යෙදී සිටින රණවිරුවන්ට සෙත්පතන ලදී. දහවල් 50 නමකට අධික ගරුතර මහා සංඝයා වහන්සේ වශයෙහි අටපිරිකර අතිරේක සහිත සඟසතු දානයක් පිරිනමා මියගිය හා අතුරුදන් වූ රණ විරුවන්ට පින් අනුමෝදන් කරන ලදී.

මෙම පින්කම් මාලාව ඉතාමත් අලංකාරවත්ව මනා සංවිධානාත්මකව සිදු කිරීම රණවිරුන් වෙනුවෙන් පැමිණි ඥාතීන්ට මෙන්ම පළාත්වාසී බෞද්ධ ජනතාවගේ ගෞරවයට හා ප්‍රසාදයට හේතු විය. දවස් කීපයක් හමුදාවේ විරුවන් විහාරස්ථානයට පැමිණ විහාරස්ථානයේ සෑම ස්ථානයක්ම පිරිසිදු කළා පමණක් නොව විහාරස්ථානයට පැමිණෙන සියලුම මාර්ගයන් එළි පෙහෙළි කර ඉතාමත් දර්ශණීයාකාරයෙන් සරසා විදුලි බුබුලු වලින් ඒකාලෝක කරන ලදි. මෙම දින කීපයේදී විහාරස්ථානයේ ගැවසුණු එම රණවිරු පිරිස හැසුරුණු ආකාරයෙන් මා ඉතා ප්‍රසාදයට පත් විමි. ඔවුන් තුළ තිබුණ හික්මීම විනීතභාවය ගරුසරුව නායකත්වයට දැක්වූ අවනතභාවය හා අණට කීකරුවීම ආදිය දැකීම මෙම පින්කමෙන් මා දක්නා ලද අනඝි ආදර්ශයන්ය.

ලංකාවේ වෙසෙන අවුරුදු 18 න් ඉහළ සියලුම තරුණ තරුණියන් තාවකාලිකව හමුදාවට බඳවා ගෙන ඔවුනට එම පුහුණුව ලබා දීමෙන් දැනට රටේ පවතින දරුණු අපරාධ අඩු කර ගැනීමටත් ගුණ ගරුක පිරිසක් සකස් කර ගැනීමටත් සංවර ශීලී සමාජයක් ගොඩනැගීමට හැකිවනවා ඇත. පාසල් හා දහම් පාසල් මගින්ම් එවැනි පිරිසක් මෙතෙක් ගොඩනැගීමට නො හැකිවීම ජාතියේ අවාසනාවකි. මෙය ක්‍රියාත්මක කිරීමට රජයේ හා නීතියේ පිහිටද අවශ්‍ය වේ මෙම කරුණ ඔබ තුමාගේ අවධානයට යොමු වේවා

පින්කම් මාලාවෙන් ජනිත සියලු පින් ඔබතුමා ඇතුලු ත්‍රිවිධ හමුදාවේ සියලු දෙනාටද පොලිසියේ සියලු දෙනාටද හිමිවීමෙන් රටේ ඒකීය භාවය සාමය සමගිය සම්බන්ධය ඇති කිරීමට සියලු ශක්තිය හා ධෛර්‍යය ලැබේවායි පතමි

මෙයට,
සංඝරතන.

දවුලගල සංඝරතන නායක ස්ථවිර
දිනය :- 2002. 04. 18

# රෙජිම - ශ්‍රීලපාහ රෙ.සැ.මේ තනතුර භාරදීම් / භාරගැනීම්

ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් කටයුතු කළ සෙ/11488 බනි 1 ආර්එම් කරුණාරත්න එම තනතුර හා රාජකාරිය සෙ/11533 බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්ඩබ්පී ආර්එස්පී හට 2002 මැයි මස 17 දින භාර දෙන ලදී.

නව තනතුරෙහි වැඩ භාරගත් සෙ/11533 බනි 1 ඩබ් වික්‍රමසිංහ ආර්ඩබ්පී ආර්එස්පී 1980 සැප්තැම්බර් මස 18 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බළසේනාවට බැඳී සිය මූලික පුහුණු කටයුතු නිමාවෙන් පසු 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබලහමුදාව වෙත ඇතුළත් කර එහි 'ඒ' කණ්ඩායම සමගින් ක්ෂේත්‍ර රාජකාරියේ නිරතවන ලදී. පසුව ශ්‍රී ලංකා යුධ හමුදාවේ ව්‍යාප්තියත් සමගින් ස්ථාපනය වූ 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාලහමුදාව වෙත ඇතුළත් කරන ලදී. එම ඒකකයේ රයිෆල් කණ්ඩායම් සමගින් කළුපාවසැ සහ කණ්ඩායම් සැරයන් මේජර් තනතුර හොබවන ලදී. 1993 වසරේ දී ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අලිමංකඩ ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ 'යාල් දේවි' ක්‍රියාන්විතයට සහභාගී වී සිටි මෙම බලලත් නිලධාරී ත්‍රස්ථවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාරයකට ලක්ව තුවාල වී ප්‍රතිකාර ලැබීමෙන් පසුව ජාතික ශිෂ්‍ය භට බලකායේ උපදේශකයෙකු වශයෙන් කටයුතු කරන ලදී. ඉන් අණතුරුව රෙජිමේන්තු ජ්‍යෙෂ්ඨතාවය අනුව 2 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ රෙ.සැ.මේ (උපදේශක) තනතුරෙහි රාජකාරි කිරීමෙන් අනතුරුව 6 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙ.සැ.මේ වශයෙන් පත්ව වසර 04 කට ආසන්න කාලයක් එම ඒකකය සමගින් රාජකාරියේ නිරතව සිට, ඉන් අනතුරුව 2000 මැයි මස සිට 213 බළසේනා මූලයෙහි රෙ. සැ. මේ. වශයෙන් කටයුතු කරමින් සිටිය දී රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙ. සැ. මේ. වශයෙන් පත්කරන ලදී. 'දීර්ඝ කාලයක් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිට ක්‍රියාන්විතයේ දී කළ දස්කම් වෙනුවෙන් 'රණවික්‍රම පදක්කම' සහ 'රණශූර පදක්කම්' වලින් පිදුම් ලද මෙම බලලත් නිලධාරී නිත්‍ය සහ ස්වේච්ඡා ඒකකයන්හිත්, 213 බළසේනා මූලයෙහිත් රෙ. සැ. මේ. තනතුරෙහි දීර්ඝ කාලයක් අත්දැකීම් ලත් බැවින් රෙජිමේන්තු මූලස්ථානයේ ද එම තනතුරෙහි රාජකාරිය ඉතා පහසුවෙන් ඉටු කර ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ උන්නතිය සඳහා කටයුතු කිරීමට හැකිවන බැව් අපගේ විශ්වාසයයි.

2002 මැයි මස 17 දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ හි රෙ. සැ. මේ. තනතුරෙහි සිය රාජකාරිය භාරගත් අවස්ථාවේ ලබාගත් ඡායාරූප 10 වන පිටුවේ දක්වා ඇත.

බනි 11 ගොඩකන්ද කේඑස් - 7 ශ්‍රීලපාහ

# දුම් වැටිය

එක වසරකට ලොව වසන ජනගහනයෙන් දසලක්ෂ 4.2 කට මරු කැඳවන සෑම තත්පර 08 කට එක් අයෙකු මිය යන වසර 2030 වන විට සෑම තත්පර 03 කට එක් අයෙකු මිය යතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අගවන සෞඛ්‍යට අහිතකර බලපෑම් ඇති කරන මුදල් පසුම්බිය හිස් කරන දුම් වැටිය ගැන ඔබ මොහොතක් සිතුවාද.?

ලෝක සෞඛ්‍ය සංවිධානය ඉහත අනතුරු ඇඟවීම කළත් ලොව දුම් වැටියට ඇබ්බැහි වීමේ ප්‍රවනතාවය සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. දුම්වැටිය තුළ සිරුරට අහිතකර විෂ බීජ ද්‍රව්‍ය 4000ක් පමණ ඇති බව ඔබ දන්නවාද .? එම විෂ කාරක අතුරින් ඇබ්බැහි වීමේ කාරක 599 ක් තිබෙන අතර මිනිස් සිරුරට උග්‍ර විෂ සහිත රසායන ද්‍රව්‍ය වන ඇමෝනියම්, ෂිලැක්, පොස්පරස්, කැඩ්මියම්, ක්සයි ලේනා, ආසර්නික් ලෙඩ් (ඊයම්), ප්‍රෝපලීන්, ඇසිටෝන්, බුතේන් මිස්මැක්, වැනි උග්‍ර විෂකාරක අඩංගු වන බව ඇමරිකානු විශේෂඥ වෛද්‍ය පිරිසක් අනතුරු අගවා ඇත.

මෙම ප්‍රශ්ණය දෙස ශ්‍රී ලංකාවාසී අප විමසා බැලූවහොත් පිළිකා ආශ්‍රිත රෝග වලින් එක් වසරකට අප රට තුළ 9000 ක් පමණ මිය යන බවත් එයින් වැඩි දෙනා දුම්පානය නිසා රෝගාතුර වූ අය බවත් වෛද්‍ය විද්‍යාඥයින් තරයේ ප්‍රකාශ කරන අතර පිළිකා ආශ්‍රිත රෝග වලින් එක් වසරකට 12000 ක් පමණ පිරිසක් මිය යන බවත් ඔවුන් පවසන අතර එයටද ප්‍රධාන හේතුව දුම්පානය බව වෛද්‍යවරුන්ගේ මතයයි.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක දුම්වැටි සඳහා වැය කරන මුදල එක් දිනකට දළ වශයෙන් කෝටි 5 ක් පමන වන බවත් ඒ ආශ්‍රිත රෝග සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවන බවත් යම් පුද්ගලයකු ගැටවර වියේ දී දුම් පානයට ඇබ්බැහි වුවහොත් ඔහුගේ ජීවිත කාලය වසර විස්සකින් පමණ වර්ධනය අඩුවන බවත් විද්වතුන්ගේ මතයයි.

මෙම දුම්වැටි ඉරීම නිසා කැඳවන පිළිකා පමණක් නොව ඊට වඩා දරුණු රෝග වලට ලක් වෙති. විශේෂයෙන් දුම්පානය නිසා රෝග වලට ඔරොත්තු දීමේ ශක්තිය හීන වන අතර, මෙම හේතුව නිසා ලූපස්, එරිනමැටොටස්, ආදී රෝග ඇතිවන අතර මුඛයේ වන පිළිකා, හිස් කබලේ සහ අත් පා වල දද කුෂ්ඨ අතිවීම සිදු විය හැක. දිනකට දුම්වැටි 20 ක් පමණ පානය කරන අයවළුන්ගේ ඇස් දුර්වර්ණවීම, ඇස් පෙනීම අඩුවීම හා නිරන්තර දුම්පානය නිසා වර්ධනය ට අවශ්‍ය විටමින් ඒ ප්‍රමාණය විනාශ කරන අතර ඒ තුලින් රුධිර ගමනාගමනය අවහිර කරයි. එම හේතුව නිසාම තොල් සහ අත් වල ඉරි තැලීම් හා කන් ඇසීම දුර්වල විය හැක. පෙර සඳහන් කල විෂ බීජ කාරක 4000 ක ප්‍රමාණය දුම් උරන පුද්ගලයාට පමනක් නොව ලඟපාත සිටින අයටත් පොදුවේ පරිසරයටත් වහනය වෙති. කෙසේ වෙනත් ඉහත කරුණු සෑම දුම්පානය කරන පුද්ගලයෙකුටම බලපා නොතිබුනත් එම රෝගවලට ලක් වන අවාසනාවන්ත පුද්ගලයා ඔබ නම් ඔබේ අනාගතය කෙසේ විය හැකිද.

තරුණ කඩවසම් පෙනුමට ආශීර්වාදයක් සේ වෙස්වලා ගෙන එන දුම් වැටිය ඔබ බිලි ගන්නා රකුසෙකි. එයට අසු නොවීමට ඔබේ බුද්ධිය මෙහෙයවන්න. ඔබව ඔබ විසින්ම පාලනය කරගන්න.

(මැයි 31 වන දිනට යෙදෙන ලෝක දුම්වැටි දිනය වෙනුවෙන්. පොසපන අනුපිහි.)

සාසෙ සුගතපාල වයිපී
පරිගණක අංශය
රෙම ශ්‍රීලපාහ




*හිතවත් පාඨකය!*

උතුරේ හා නැගෙනහිර බංකරයේ රාජකාරියේ යෙදී සිටින ඔබ වෙත නිරතුරුවම ගලාඑන කවි සිතිවිලි හා සංකල්පනා සඳහා මෙම පිටු කිහිපය වෙන්ව ඇත.

ඔබගේ උසස් නිර්මාණයන් "තල් අරඹේ සිට" අප වෙත ලැබීමට පහත සඳහන් ලිපිනයට තැපැල් කරන්න

සංස්කාරක, "තල් අරඹේ සිට", වයිට් හැකල් සඟරාව, රෙම ශ්‍රීලපාහ, හමුදා ජනපදය, පනාගොඩ

# සතුටු සාම පැතුම්

සාමය පතන්නේ යුද්ධය — දුටු අයලු
බිහින අයට මේ වචනය — අරහන්ලු
හේතුව නැතත් මුත් දෙඩමලු — වෙනවාලු
සත්‍ය දන කලොත් තිර සරු ඇති — වේලු

යුධ බිම දකපු ජපනුන් ජර්මන් — ඇත්තන්
කිසිද නොවේවා පතමින් හැම — ගැටුමන්
යන යන සෑම තැනදී කියමින් දුටු — දුටුවන්
වෙන්නට එපා ලොව තුල කිසි යම් — ගැටුමන්

යුදයට යන්නෙ අවිගත් ජාතික — තරුණන්
සෑම දයටම සටන අවැසිය යන — උතුමන්
න්‍යායාය ආචාරින් යන — විකුමන්
කිසිද නොයයි යුදයට තැබ සිය — අගනන්

රජයක් තනන්නේ යුද්ධය — වලකන්න
අය වැය පරතරය හොද පැත්තට — ගන්න
බැංකුව ලෝක අප හට සම්පත් — දෙන්න
බල ගතු අයද පැහැදිලි ලෙස අණ — දෙන්න

ලස්සන ලොවේ ලස්සන රට මෙය — වේවා !
මෙහි ඇති ප්‍රශ්න විසඳී මල්පල — වේවා !
පින් ඇති දූ පුතුන් වැඩියෙන් — බිහිවේවා !
සිරි ලංකාව කිරි පැතියෙන් — ඉතිරේවා !

බ්‍රිගේඩියර් ටී ටී ආර් ද සිල්වා
ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී
සේනාංකාධිපති
51 සේනාංකය යාපනය

# පිය සෙනෙහසට කවි ගී ලියවුනා මදී


සිනා පිරි මුවින් ගිලිහුනු වදන් රන් රුවන් පරද — වටින්නේ
මහ මෙරක් ලෙස දරා දිවි බර පියෙකු වුයේ පා — සෙනේ
රුවන් මාවත දිවි මගේ නිති පෙන්වමින් ඔබ හැම — දිනේ
සවන් යොමුකර අසනු මැන මා ගයන මේ ගුණ — ගායනේ

මුදු මෙතේ කරුණා සිතින් නිති ඔවා දුන් දරුවන් — වෙනේ
දුක් තැවුල් දිවි මාවතේ හැම දරා ගෙන ඔබෙ — හදවතේ
නොසැලෙමින් අටලෝ දමින් පින් පිරූ බැව් පින් — කෙතේ
පියාණෙනි හිස නමා වදිනෙමි පිස දමා කඳුළැල් — නෙතේ

ඔබේ ගුණකඳ තවම සුවදයි සිල් සුවඳ සේ දස — අතේ
මුවේ පිපි මුදු සිනා කැන් සිත නිවාලයි දුක් හද — වතේ
ලබා මොක් සුව නිවෙන්නට පෙර උපත ලැබ මේ — මිහිකතේ
පියාණෙනි, මා පිය නගන්නෙමි ඔබ පියනැගූ දම් — මාවතේ

දහම් මග වෙත යොමා ඔබෙ නෙත මෙත් වඩා ඔබ — සැනසුනේ
දහම් ඇසුමට එද මෙන් ඔබ නොඑන්නද මේ පොහෝ — දිනේ
යොමා දෙසවන් අසනු ඇති මුණි වදන් ඉද දෙව් — විමානේ
දිවැස් ඔබෙ අප වෙත යොමා නිති රකිනු මැන මතු හැම — දිනේ

ඔබේ සෙනෙහෙබර දියණිය.
එස් කෝට්ටෙගොඩ විසින්



# SACRIFICE

The golden moon shines in the sky
in the cold night
You come to my mind so I am in a
,sad plight
I've toiled and suffered so long for
your love
I don't know whether my sensitive
mind will improve

May all your dreams come true! can
make yourself happy
I'll never come again so as not to
make you unhappy
Being a daughter you gave up my
love for your parents to gain
Being a soldier I give up my today
for the country to gain

LT THARINDU WEERASINGHE - 2 SLLI
21 SLNG
216 BDE
GAJASINHAPURA
CHEDDIKULAMA

# ආදරියේ ඔබෙ නමට

දෙනෝ දහසක් නිදන රාත්‍රියේ
උතුරු කරේ තල් වැට මායිමේ
මගේ සිත අවදියෙන්
සුදු ඔබ ගැන
මැවී ඒ සොදුරු සිහිනය...
අඩවන් පායා ඇති
ඒ සද එලියේ...
උපකාරයෙන් නැවත නැවතත්
මම කියවමි...
ඔබගෙන් ලද හසුන් පත...
ලගදි ලැබෙන කෙටි
නිවාඩුවට පැමිණිලා...
ඔබත් දියනියත්
දකින තුරු මගේ
සිත නොවසිල්ලෙන්
පාළුවෙන් රජ කරයි....

සෙ/301912 සා සෙ. සනත් ජ
7 ශ්‍රී ල පා හ බ් සන්ධායම
තනන්කිලප්පු - යාපනය.

# ඔයා දැන් ලස්සනයි

ඔයා ඉපදුන දවස මට අද වගේ මතකයි....................
ඔයයි තවත් මගෙ යාලුවො කට්ටියකුයි ඔයාගේ
තුන්වෙනි සහෝදරය ලග ඉදල ආවේ..................................
ඒ එනකොට ඔයාගේ අනික් සහෝදර, සහෝදරිය ලග ඉදලා
තවත් ගොඩක් දෙනෙක් ඇවිත් හිටියා
අපි ඔක්කොම එකට එකතු වෙලා ගොඩක් සතුටින් ඉන්න මොහොතක තමයි
ඔයා ඉපදුනේ.......................
ඒ දවස මට අද වාගේ මතකයි....................
හරියටම 1987 මැයි මාසෙ 05 වෙනිද හරියටම
අදවගේ දවසක ......................... හිතාගන්නවත් බෑ
අවුරුදු පහලොවක් ගෙවුනද කියලා
ඔයා පුංචිම  කාලෙත් දැන් වගේමයි..........................
පුංචි කමට නෙවෙයි වැඩ කලේ ..................... මතකද
ඔයාට අවුරුද්දක්වත් නෑ එතකොට   අපි ඔක්කොම
වඩමාරච්චි ගියා. එදා පටන් අද දක්වාම
ඔයාට උතුර, දකුණ කියලා වෙනසක් තිබුනේ නෑ......................
ඔයාගේ අනික් වැඩි මහලු සහෝදර, සහෝදරියෝ  සමග
කරට ..................... කර හිටියා

"ඇත්තමයි ඔයාගේ මවුටත් ඔයා ආඩම්බරයක් "
හැබැයි කවදාවත් අමතක කරන්න එපා..........................
ඔයා මේ තරම් ලස්සන නව යොවුන් තරුණියක් වෙනකල් ඔයාව
ඇති දැඩි කරන්න ගොඩක් අය දුක් වින්ද ........... ඔයා හොදටෝම දන්නවනේ.........
ඔයාගෙ නම රැකගන්න කියලා කී දෙනෙක්  ජීවිත පූජා කෙරුවද................
කී දෙනෙක් ආබාධිත උනාද ................ ඉතින්
ඒ අය වෙනුවෙන් අපි ඒ වෙනුවෙන්ම කතරගම ගිහින්
කතරගම දෙවියන් ඉදිරියේ පූජාවක් තියලා.................. පහන් පත්තු කරලා
ඒ අයට පින් පෙත් අනුමෝදනා කරනවා .............. ඒ වගේම ...............
තවත් ඔයා වෙනුවෙන් ඉදිරියටත් මේ විදියමට කැප වෙන්ඩ
අපි හැමෝම බලාගෙන ඉන්නවා
ඉතිං ..................... 4 වන ශ්‍රී ලංකා පාබල හමුදා කුමරියේ....................
ඔයා දැන් ලස්සනයි
........................ සත්තයි  ඉස්සරටත් වැඩිය ඔයා දැන්
ගොඩක් ලස්සනයි.......................
"ඔයාට සුභ උපන් දිනයක් "

සෙ/ 13583
ව/ සැ බංඩාර ජ්එම්ජ්
4/15 ශ්‍රීලපාහ. කිලාලි - යාපනය

# ආත්මීය සෙනෙහසක උරුම නොවූ මතක සුවඳ

ආත්ම සියයක්වත් මම පින් කරන්නට ඇත... ඔබ වන් කෙනෙකු නොව ඔබවම ලබන්නට සිතා මම පින් කරන්නට ඇත... සමහර ආත්මවල මට ඔබව නොලැබී යන්නට ඇත.. එවැනි ආත්මයකදී මගේ ආත්මයද ඉක්මනින්ම කෙලවර වන්නට ඇත්තේ අවාසනාවන්ත මරණයකින් වන්නට ඇත...අනේ ඔබ නොලැබී ගිය ආත්මයක් කොතරම් දුක් ආත්මයක් වන්නට ඇත්ද? මතු මතු ආත්මභවයකදී ඔබවම හිමිවේවායි... පතමින් මම මිය යන්නට ඇත...මගේ සොහොනට පවා ඔබ නැතුව තනිකමක් දනෙන්නට ඇත...මේ ආත්මයේදී මා උපන්නේ පෙර ආත්මයේ ප්‍රාර්ථනාව මත ඔබම පතාගෙන නොවේද ?... පූර්ව ආත්මයක කොහේ කොතනකදී හෝ විද ඔබේ සුවඳ පමණක්ම මේ ආත්මයේ උරුමය... වන්නට ඇත. ඔබ දුටු වනම ඔබටත් කලින් මගේ සිතේ ඒ සුවද විදගත්තේ ඒ නිසාවෙනි... ආත්ම ගණනක් පුරා විදි දුක මේ ආත්ම භවයේදීම දිය කර හැරියෙමියි මම සිතුවෙමි... ඒ ඔබ මට හමුවූ නිසාවෙනි... රත්තරං ඔබේම පපුවේ අනන්ත වූ සුවදට දැහැන්ගතව මම මගේ ආත්මීය සෙනෙහසේ සුවද ... ඒ උරුමය විද ගත්තේ කොපමණ සුළු කාලයක්ද...? නැවතත් පෙර ආත්මවල වගේම... ඔබව මගෙන් මේ කුරිරු යුද්ධය උදුරගත්තේ මොන තරම් අවාසනාවන්ත ලෙසද... ඔබේම දයාබර විරු සොහොයුරන් කර මතින් සිංහ කොඩියෙ සෙවනෙ සැතපිලා පාවඩ රතු මල් පලස් උඩින්...ආචාර වෙඩි මුර මැද ඔබ අවසන් ගමන් ගියේ මට ගාම්භීරත්වය පෙන්වා හිත සනසවා උවත්... මගෙ සුදු අයියේ ගිය ආත්ම ගණනකදීම මම මේ ගාම්භීරත්වයම විදගෙන ඔබ අහිමි කරගත්තා නොවේදැයි මට සිතේ... වරද කොතනද ?... ශාප කල යුත්තේ කාටද මම නොදනිමි... ඔබව මගෙන් උදුරාගත්ත කුරිරු ත්‍රස්තවාදයට වෛර කර මමත් ඔබ ගිය පාරෙම රණ බිමට එන්නද නැතිනම් ඔබවම පතාගෙන මේ භවයෙන් ඔබේ මතකයෙන් සමුගන්නද? අසරණ මම නොදනිමි... එහෙම කලත් නැවතත් ආත්මයක ඔබව නැති කරගන්න නම් අපි සදකාලිකව නොඉපදී ඉමු.. කියන්න රත්තරං එකපාරක් මගෙ ආත්මය නිදහස් කරගන්න හීනෙන් වත් මා ලගට එන්න සුදු අයියේ...

හිත් අහස් කුස බිම්බරක් දුක්
විඳව විඳවා බලා උන්නට
ඔබේ ඇස් දුටු ඉසුඹුවේදී
කඳුළු වල බර ඇස් අගට
දැනුණා
මගේ ප්‍රේමය වන්දනාවකි
ඔබට විතරක් පිදුම් කල හැකි
කල්පයක් මග බලා ඉන්නෙමි
ඔබෙ සුවඳ පිරි වසන්තය එන
තුරා....

(වයිට් හැකල් සගරාවට දිගු ගමනකට ආසිරි පතමි.)

ලිව මා
ශ්‍යාමිකා නිමාති වීරසේකර
නො 105.ඉහලවැටියාව
නොච්චියාගම .අ/පුර...

# යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා ශූරතාවය 2002 වසර

2002 වසරේ අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙල 2002 අප්‍රේල් මස 05 සහ 06 යන දෙදින තුළ කොළඹ යුධහමුද ක්‍රීඩා පිටියේ දී ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් රාජ්‍ය ආරක්‍ෂක, සිවිල් ගුවන් සේවා, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා සහභාගී වන ලදි. මෙම තරගාවලියේ දී සියළුම රෙජිමේන්තු පරාජය කරමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් ශ්‍රී ලංකා පාබල හමුදවේ ආබාධිත රණවිරුවන් විසින් ලබා ගන්නා ලදී.

පසුගිය වසර වල දී පවත්වන ලද මෙම ක්‍රීඩා උළෙලේ 2000 වසරේ අනුශූරතාවය ද, 2001 වසරේ දී ජයග්‍රාහී කුසලානය ද, ශ්‍රීලපාහ ආබාධිත රණවිරුවන් හිමි කර ගත් අතර, 2002 වසරේ ශූරතාවය ද හිමි කර ගනිමින් නොමැකෙන මතක සටහනනක් තැබීමට ශ්‍රී ලංකා පාබල හමුදවේ ආබාධිත රණවිරුවන්ට හැකි වීම සුවිශේෂ සිදුවීමකි. යුධ හමුද ඉතිහාසය තුළ ක්‍රීඩා ඉසව් මගින් නොමැකෙන මතක සටහන් තැබීමට සමත් වූ පාබල හමුද සෙබළුන් හට මෑත කාලයේ පැවැති යුධ වාතාවරණය මත ක්‍රීඩා දස්කම් දැක්වීමට නොහැකි වුවත්, යුද්ධයේ දී ආබාධිත තත්ත්වයට පත් රණ විරුවන් විසින් එම ගෞරවය සහ කීර්තිය ශ්‍රී ලංකා පාබල හමුදවට ලබාදීම සඳහා දයක වීමට හැකි වීම ආඩම්බරයට කරුණක් බැව් මෙහිලා සිහිපත් කළ යුතුව ඇත. මෙම ක්‍රීඩා කුසලතා මගින් දස්කම් පා ශ්‍රී ලංකා පාබල හමුදවට ගෞරවයක් සහ කීර්තියක් ලබා දුන් ආබාධිත රණ විරුවන් හට ශ්‍රීලපාහ නිලධාරීන් සහ සෙසු නිළයින්ගේ ආශිර්වාදය නොඅඩුවම ම ලැබෙන අතර, ඉදිරි ක්‍රීඩා කටයුතු ඉතා සාර්ථකව දියුණු කර ගැනීමට අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ඔවුන් වෙත ලැබේවා යි ප්‍රාර්ථනා කරමු.

බුද්ධි අංශය - රෙජ්මූඛ ශ්‍රීලපාහ

# ආබාධිත ක්‍රීඩා උළෙල - 2002





ආබාධිත ක්‍රීඩා උළෙලේදී දැස් අහිමි දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය ලබා ගත් සෙ/15962 සැරයන් ජයරත්න ඒඩීඒ පදක්කම ලබා ගත් අයුරු.



අත්පන්දු අනුශූරතාවය ලබා ගත් ආබාධිත ශ්‍රීලපාහ රණවිරුවන් දිරිමත් කරන අණදෙන නිලධාරීතුමා



වසරේ දක්ෂතම රෝද පුටු ක්‍රීඩකයා ලෙස තේරුනු සෙ/302135 ලාකෝ වීරසිංහ කේඑන් ජාතික ආරක්ෂක ඇමතිතුමන් අතින් තම ජය සංකේත ලබා ගනිමින්.



එක් පාදයක් අහිමි බයිසිකල් ධාවන තරගයේ දෙවන ස්ථානය දිනාගත් සෙ/70809 සාසෙ නිශාන්ත කේපීඩීඒ



මීටර් 100 සහය රෝද පුටු තරගයට සහභාගී වූ ආබාධිත රණවිරුවන් සමග ඒකක අණදෙන නිලධාරී.


රෙජිමුබ ශ්‍රීලපාහ හිටපු අණදෙන නිලධාරී මේජර් ජේ ආර් අම්පෙමොහොට්ටි ආර්එස්පී ශ්‍රීලපාහ වායු රයිෆල් වෙඩි තැබීමේ තරගයට සහභාගී වෙමින්





සමස්ත ශූරතාවය දිනාගත් මොහොතේ පැමිණි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එස්එච්එස් කෝට්ටේගොඩ ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහ ලුතිතන් කර්නල් ඒයූසී සුරවීර ශ්‍රීලපාහ අණදෙක නිලධාරී සමගින්

ක්‍රීඩාවලියේ ශූරතාවය දිනාගැනීමෙන් අනතුරුව රෙසැමේ - රෙජිමුබ ශ්‍රීලපාහ ඇතුලූ ක්‍රීඩකයින් ජයග්‍රහනයේ සතුට බුක්ති විඳිමින්




# "සෙනෙහස් බිරිද හා සුදු පුතු ගෙදර තියා මා යුධ වදිමි තුන් සිංහල රටක් කියා"

සැමදින පහන් වී රෑ බෝවීගෙන — යනවා
ගිනි අවි තුරුලු කර ගෙන සැම වෙහෙ — සෙනවා
මුර කුටි ඉදිරි පෙදෙසට ඇස් යොමු — වෙනවා
කාලය ගෙවී දින දින වේගෙන් — යනවා

මව් පිය සහෝදර ඔබ සැම — සිහිවිලා
එනමුත් කෙසේ සිටිමුද එක් තැන් — වීලා
නිතරම සිහිය හා සිතුවිලි එක් — කරලා
වෙහෙසෙමු රටට මෙහෙයක් කරනව — සිතලා

සෙනෙහස් බිරිද හා සුදු පුතු ගෙදර — තියා
මම යුධ වදිමි තුන් සිංහල රටක් — කියා
සැමද සිතෙහි ඒ එඩිතර පැතුම — දයා
නිති ලෙස ගමන් අරඹමු එඩි පාද — තියා

කොපමන කම්කටලු තිබුනත් හද — පතුලේ
සිහිකර ලියමි ඔබ ගැන මගෙ සිත — පතුලේ
සන්සුන් සිතින් වෛර දුරමින් ඉව — සිල්ලේ
එක්සත් කර තබමු අපගේ තුන් — සිහලේ

සෙ/305744 සාසෙ සිල්වා ජ්කෝඑම්සි
4 ශ්‍රීලපාහ. සී කන්ඩායම.කිලාලි
යාපනය

# මවකගෙ සිතුවිලි

යාපා පටුනෙ තල් අරබේ සිටින — පුතේ
සමනල වියේදී අවියක් තුරුලේ — ඇතේ
දකුණු දෙසේ පුංචි පැලේ ඉදෙන — බතේ
සුවද දැනෙනවද තවමත් නුඹගෙ — සිතේ

නිදි නොලබමින් ගිනි අවියක් තුරුළු — කල
උතුරට ගොසින් පෙන් වන ඔබෙ වීර — බල
එඩිතර බලය පෙන් වන සිය පුතුන් — කැල
ඔබ සැම නමින් මල් පුදියි දෙරණ — තුල

සැනසුම් සුසුම් ජන හදවත — පුරවන්න
පතනා පැතුම් පොදි මල් පල — ගන්වන්න
සොවින් නිදන ලක් මැණිව — පුබු දන්න
යලිත් නිදන්නට කිසිවිට නොම — දෙන්න

ගිනි ගත් දේශයක අරුණළු — පැතිරේවා
කලට වැසි ලැබී රට තොට — සරුවේවා
යල මහ කන්න දෙක අටු කොටු — පිරවේවා
යුධ ගිනි නිවී සාමය මල් — පිබිදේවා


සුදු පරෙවියන් නිල් අහසේ පිය — ඔන්න
ජාතික ධජය උඩු ගුවනේ දිදු — ලන්න
සැමගේ දෙතොල් අග හසරැල් පිබි — දෙන්න
දෙවිදුනි අපේ හෙළ විරුවන් රැක — දෙන්න

මියගිය ලා/කෝ කරුණාගොඩ එල්ජිආර්
ගේ සොයුරිය
අරුණි ශ්‍රියානි කරුණාගොඩ .
ගල්ලමුල්ල .
යක්කලමුල්ල.

# සෙබල සොහොයුරානනි....

උතුරේ බෝම්බ හඩ
දසත පැතිරුනා බියකරු ලෙස
කියා රට රකින්නට
අයියන්ඩි ඔබ ගියේ හමුද සේවයට
දිවා රෑ නොබලා උතුරුකරේ සිට
සිහලුන් වෙනුවෙන් සටන් කලා ඔබ
දිනපතා ගොස් පුදසුන අභියසට
ආයාචනා කළා රැක දෙන ලෙස ඔබව
එහෙත් අපටත් රහසේම
හෙලා තිබුණා ඔබ අවසන් හුස්ම
අහෝ !'... ඒ අමිහිරි දිනය
උදකලා අප පවුලටම අන්ධකාරය
සිංහ දදයක සෙවනයට සැතපිලා නිහඩව
එනවිට අප බලන්නට
සොයුර ඔබේ සිනහව, රැදී තිබුනා මුවේ එලෙස
ඒ තුලින් මම, හැදින්නා ඔබ නියම විරුවකු බව.
ඔබටම අහිමි වූ මුත්
නොහඩමි යලිත් කිසිදින
ඔබ වීර සෙබලෙක් හැමෝටම සැමවිට
සොයුර ඔබේ නාමය,
රැදේ සද ලක් මව්ගේ සිතතුල
සොයුර ඔබට නිවන් සුව ! නොපතමි මා
කිසිවිට
මේ මිහිතලයේ ඉපද යලි වීර සෙබලෙකු ලෙස
මගේම සොයුරා වේවා !
පතමි මම සැමවිට.

ජ් එන් දමයන්ති
ලයනල්වාස .රබ්නෙල්ගෙ වත්ත
III අඩියර.වල්ලිවල.වැලිගම



# නිදහස

මතුකර යළිත් හද තුළ සැගවුණ එඩිය
ලෙළ දෙන අතර නිදහස ජාතික කොඩිය
පෙර මග බලා යන විට අඩියෙන් අඩිය
අපි වෙමු උතුම් රට වෙන කාටත් වැඩිය

අදිරවාදී කදවුරු බල මුලූව බිද
ලක්බිම පුරා සාමයෙ ජය කෙහෙළි බැද
ලැබගත් නිදහසෙහි පිවිතුරු සුවද විද
සමරමු හෙළ පුතුන් අපි අත් ඇගිලි බැද

සිංහල දෙමළ මුස්ලිම් යන සියලූ දෙන
එකමුතු නැමැති මුතුහර ගෙල පැළද ගෙන
සමගිව එකා මෙන් යන විට පෙරට පැන
මගෙ රට දෙවැනි වන්නේ රටකට ද මොන

සපිරෙන පනස් තෙවසර නිදහසට අපේ
හෙළ බිම පුරා සුවදින් මල් කැකුළු පිපේ
හෙල පර පුරට සලසන්නට අමිල සැපේ
වීරු දූ පුතුන් බිහි වේවා රටට අපේ

අයියේ මෙම කවි පංතිය ලියා එවන මා
**සෙ/305976 සා.සෙ ධර්මපාලගේ**
**නංගි සාගරිකා ශ්‍රියා කුමාරි**

# කඳුල

"ජීවිතයට නව දවසක්
උදාවෙන්නේ නුඹ ආ විටයි
සතුට සමරන්නේ මා
නුඹ ආ විටයි
නව යොවුනේ සිටින මා
හිනැහෙන්නේ නුඹ ආ විටයි
කඳුල රජයන්නේ
නුඹ මා දමා යන විටයි"

7 ශ්‍රී.ල.පා.හ සෙ 15805
ලා/ කෝ. ද සිල්වා ඩීඑච්ආර්යූ ගේ ආදරණීය
බිරිද නයනා කේ කාරියවසම්
දෙඩන්දූව.

# සාමයේ පරවියා දැන්වත් ඉගිලියන්

රට දැය රැකගන්නට යුධ පෙරමුණට ගිහින්
සෙබලුන් විලස ඇත ඔබ ගිනි අවිය අරන්
සතුරන් සමග කරනා විට දරුණු සටන්
ඔබ සැම රැක දේව් දෙවිදුන් සුමන සමන්

තැබූපය පෙරට මිස පස්සට ගන්නට එපා
හොර කොටි ගෙරවිවට ඔබ බිය වන්න එපා
විනයට පටහැනිව කිසිවිට යන්ට එපා
ජයගෙන මිසක් පස්සට නම් එන්න එපා

යුධ නාවික ගුවන් හමුදා බල ඇණියේ
සෙබලුන් සමග සහයට එන පොලිසි යේ
ග්‍රාමය රකින අනෙකුත් භට පිරිස් දැයේ
උරුමය ඔබට සිරිලක් මව රකින පැයේ

සෙබලුනි සෙබලියනි සිරිලක් මව රකින
ඔබකල මෙහෙය ඇති මහමෙර උසට පැන
දුක්කම් කටොලු බිද සේවය කරන දින
ලැබේවා ඔබට නිති සම්බුදු සරණ

ඇළදොළ වැව් පොකුණු ගංගා පිරී යන්
හැම ගහකොළ කම සරුවට පල බරව් යන්
රන්වන් ගොයම් කරලින් කෙත් සරුවී යන්
" සාමයේ පරවියා" දැන්වත් ඉගිලි යන්

එල් පී සුරංග චාමර,
"ප්‍රියංගා",
උණුපැන්දෙනිය, උරුගමුව.

2002 . 03 .28 දින පලෙයි ප්‍රදේශයේදී ක්‍රියාත්විතයේ යෙදී
සිටියදී අතුරුදහන් වූ සෙ/309972 ලා. කෝ. නිශාන්ත කුමාර
එල් පී වෙනුවෙන්

# යුධ බිමේ සිටින සැමියාට


නිවසේ අද මා පාළුවෙන් සිටින්නෙමි
ඔබේ හඬ ඔබේ රුව මැවෙන්නෙමි
මා සිතට දැනෙනා සිතුම් පැතුම්
අද මා මෙලෙසින් ලියන්නෙමි

බොන්න ගියත් දිය උගුරේ පැටලෙනවා
කන්න ගියත් බත් උගුරේ හිරවෙනවා
නිදන්න ගියත් නිදි පැදුරේ ලත වෙනවා
සුදූ සිහිවෙලා නෙතු කඳුලැල් ගලනවා

මට ඔබේ පණ මෙන් සෙනෙහස පුදලා
කිසි දින නැහැ මගේ හදවත රිද්දලා
සුදු සුදූ කියා නිතරම මා අමතලා
නොදනිම ගියා නිවාඩුවක් දින දහයේ ගෙවිලා

දෙවියෙක් වැනි සැමියකු ලබන්නට
මා පෙර පිංකර ඇති බව දැනෙයි මට
නැහැ කිසි දින අඩුවක් කරලා මෙමට
ඔබෙ ගුණ ලියන්නට කොළයක් මදි ඔබේ බිරිදට

වැලිඔය ඇතාවැටුණුවැව කඳවුරේ සේවය කරන සෙ 5ඩී 02391 සාසෙ හේරත් එච්එම් ගේ බිරඳ
එස්ජ් රේණුකා දමයන්ති




# මට අහිමි ඔබ............

පහන් සිලක් සේ මා ලද ඔබෙ එළිය....
තිවී යාද ඇගෙ ලොව රජ වුන දට ....
අමාවක මැදියමේ ගනදුර නිවාලන සඳ මඩළ ....
මගේ ලොව එකලූ කල දේවතා එළිය ඔබ ....

සල් සපු නා දසමන් මල් සුවද ඔබම ගන්න....
ඔබේ සුසුම් පොදක් පමණක් මට අරන් එන්න....
ගනදුරු රෑ අහස පුරා දිදුලන සඳ ඔබම වෙන්න....
ඔබේ දෙනෙත් තරු කැල්මන් පමණක් මා වෙත යොමන්න....

එකලූ කළ මුලූ ලොවම දුර ඈත ඔබ හිනැහුනේ....
දේත පා මගේ යැයි කියන්න ඈයි මට බැරිවුනේ....
අහිමි වු ද පටන් මට උරුම වූ ඒ සෙනේ....
ජීවිතය ගනදුරුයි මට ඔබ ඈය වෙත ගිය දිනේ....

කුසුමන් රැගෙන බුදු හිමි වෙත පිය නගන්න....
පැතු පැතුමන් බොල් පුළගේ පාව යන්න....
නැත මසිතේ අහිතක් ඔබ ඒ ගැන දුක් නොවන්න....
ඔබෙන් ලැබූ දයාදය සිහි කරනෙමි හද තිවෙන්න....

නෙත් කඳුළු මුතු අමුණා ගෙලවට මාලය බදින්න....
මගේ සුසුම් අරන් ඇගේ විඩාවන් නිවන්න....
හිතේ පිපුනු මල් අරගෙන වරල ගසා සරසන්න....
නැතේ කිසිම අහිතක් ඔබ ඇගේ ලොවේ රජකු වෙන්න....

මුළු ලොවෙන් සගවා ගත් ඒ මල් සුවද ඇදෙන්නම්
මම මගේ දුක හඩමින් සුළං පොදට කියන්නම්
ඔබ යන මග බලාන හිද මා ආපසු හැරෙන්නම්
අලූත් ලොවක කිරුළු දරා ඔබ එහි රජ කරවන්නම්....

ශානිකා තිල්මිනි විජේවීර

# "නොමියෙන සෙනෙහස"

රට ජාතිය සුරකින්නට යුධ පිටියට පිය නගද්දී
දසෙ රැදුනු ඇගෙ හසරැලි කඳුලැල්ලෙන් බොදව යද්දී
ඇයගෙන් ලත් සෙනෙහස් සුව මගේ දිවියට දිරිය දෙද්දී
සමුගත්තේ මම ඇයගෙන් සෙනෙහස උතුරා ගලද්දී

දිනූ බිම මගේ රැක ගන්නට උතුරුකරේ යුධ වදිද්දී
හදවත මගෙ යුධ වැදුනා ඇගෙ සෙනෙහස සිහිව එද්දී
අනාගතේ පැතුම් ඉසුරු අහස උසට ගොඩ නැගෙද්දී
ඇය වෙනතක සැගවිලා මගෙ සිත ඉකිබිද හඩද්දී

අද දින ඇය ඔහු සමගින් සෙනෙහසෙ සව්දිය පුරද්දී
සුහ පතනෙමි හද පත්ලෙන් මුව හසරැළි ගොළුව යද්දී
ඇය වෙනුවෙන් බැදි සෙනෙහස මගේ සිතින් මිය ඇදදේදී
ඒ සෙනෙහස පුදනෙමි මම රට වෙනුවෙන් යුධ වදිද්දී

මම රට වෙත, රට මා වෙත බැදි සෙනෙහස එක්ව එද්දී
සුන්වූ එඩි යලි ඇතිවෙයි හෙට දින හිරු නැග එද්දී
කරන සටන ජය ගන්නෙමු සාමයෙ හඩ රැව් දෙවද්දී
නිමව නොයේ ඒ සෙනෙහස මියයන තුරු මේ හවේදී.

සෙ/301642 ලාකෝ රංජිත් ටී එන්
රෙජිමුබ ශ්‍රීලපාහ (1 ශ්‍රීලපාහ)
පනාගොඩ කඳවුර - හෝමාගම

# අම්මේ සමු දෙන්න

ඇයි අම්මේ අඩන්නේ මේ කඳුළු සලා උණ්ඩය, බෝම්බය, ගිනි අවි යුගත දැරූ
තුඹ අඩනවා සිටිනට මට නොහැක බලා සුන්කර දමමි රුපුනගේ බල බිදෙන තුරු
දේතින් බද අදරින් මගෙ හිස සිඹලා අන්තිම සිහළ ලේ බිද මගේ සිදෙන තුරු
අවසර දෙන්න යන්නට මට උතුර බලා ඉන්නෙමි සටන් බිම කර ලක් මවට ගරු

අම්මෙ තුඹ පෙවූ කිරිවල සුවද දරා ළය දී උණ්ඩයට එඩි පා සිහළ කමේ
එඩිතර කම රැදෙයි මගෙ තුණු පපුව පුරා මා මියැදුනත් වගුරා ලේ සටන් බිමේ
මා දිනූ බිමේ සාමය කඩ කරන ඉරා වැදූ මව් නමට ගව්රවයකි ජනිත බිමේ
රුපුනට නොදෙමි ඉඩ මගෙ දිවි තිබෙන තුරා නාඩන් අම්මෙ පුරවා සෝ සුසුම් ලැමේ

අම්මේ තුඹේ අතින් ඉදෙනා බතෙ සුවද බලයට ලොබින් අවිමානා කොටි නටන
තල්වැට කොනේ සිටියත් දැනෙනව තිබද නැටුමට විරිදුවයි අපෙ නිදහස් සටන
මා එන තුරා මග බලමින් සිටින සද එඩිබල පපා ජයගත් යාපා පටුන
මව් ගුණ සිහිවෙලා තිති කකියයි මහද සපුමල් කුමරු සේ එමි අම්මේ තුටින

සාරා මලිනි යාපා
"ජයසිකුරු" ක්‍රියාන්විතයේ දී. රට ජාතිය වෙනුවෙන් දිවි පිදූ මේජර් මහන්තිලක සේපාල
දහනායක ආර්ඩබ්පී ආර්එස්පී රණවිරු මැණියන් විසිනි

# වයිට් හැකල් සඟරාවට සුභ පැතුම් !

වයිට් හැකල් සහරාව එදා සහ මෙද අතර තුර ඇති ප්‍රගතිය සහ ගුණාත්මක භාවය සබැඳිව උතුරු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර මේජර් ජෙනරාල් ඒකේ ජයවර්ධන ආර්ඩබ්පී, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, විසින් මධ්‍යස්ථාන සේනාවිධායක, ශ්‍රීලපාහ වෙත එවන ලද ලිපියකි.

**උතුරු නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා**
**வடக்கு – கிழக்கு மாகாண ஆளுநர்**
**Governor, Northern & Eastern Provinces**
***MAJ GEN. ASOKA K. JAYAWARDHANA, RWP, RSP,VSV,USP***

2002. 05. 30

රෙජිමේන්තු සේනාවිධායක,
රෙජිමේන්තු මධ්‍යස්ථානය – ශ්‍රීලපාහ,
පනාගොඩ.

''වයිට් හැකල්'' සඟරාව

ආරම්භයේදී තිබූ තත්ත්වයට වඩා වර්තමානයේදී මෙම සඟරාවෙහි තත්ත්වය හා ගුණාත්මක භාවය ඉතා උසස් මට්ටමකට දියුණුවී ඇති අතර, අප මුලදී බලාපොරොත්තු වූ පරිදි, ශ්‍රී ලංකා පාබල හමුදාවෙහි හා සමස්ථ යුධ හමුදාවෙහි උන්නතියට මෙමගින් ලබාදිය හැකි දායකත්වය, අනුග්‍රහය පිළිබඳ බලාපොරොත්තු හොඳින් ඉටුවී ඇති බවද සඳහන් කරමි.


යුධ හමුදාවෙහි දියුණුව නංවාලීමට මෙවැනි වැඩ පිළිවෙත් ඉතා අත්‍යවශ්‍ය හා වැදගත් වන අතර, මෙම සඟරාව තව තවත් දියුණුවට පත්වෙනු දැකීම මගේ සතුට වන අතර, ඊට සුභාශිංසනයද පුද කරමි.

ඔබ විසින් එවනලද ''වයිට් හැකල්'' සඟරාව මා වෙත ලැබුණු අතර, ඊට ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

මෙයට,
විශ්වාසී,

මේජර් ජෙනරාල් ඒ.කේ. ජයවර්ධන – ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී
උතුරු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර

## වයිට් හැකල් ප්‍රහේලිකාව- අංක 14




පහළට

1. පළමු දෙමළ දේශපාලන පක්‍ෂය
3. ලංකාවේ රජකල රජකුගේ බිසවකි
4. මද කිපුණු ඇතා මේ නමින් ද හඳුන්වයි.
5. දෙමළ දේශපාලන පක්‍ෂයක්
6. තණ අශ්වරකට කියන නමකි
8. නියරට කියන තවත් නමක්
10. කතෝලික ආගමේ එන ප්‍රධාන චරිත දෙකකි.
11. ලෙනයේ උඩ කුළුන
12. දිළිඳු කමට කියන නමකි
13. සෝවියට් රුසියාවේ රහස් ඔත්තු සේවය

හරහට

1. නාග රාජයෙක් ආරක්ෂගත් විලක්
2. යමක් කිරීමට ඉඩ නොදෙන බලය
3. නාගසක් මුල බුදුවුන බුදුවරයෙකි
5. ලංකාවේ තිරගත වු චිත්‍රපටයකි
7. බුදු හාමුදුරුවන්ගේ තුන්වන ලංකා ගමනයට හේතු වු අයෙකි
9. රෝදයට කියන නමක්
11. නොමද සන්තෝෂය
14. වැඩිවියට පැමිණීම මේ නමින් හැඳින්වේ.

ප්‍රහේලිකා අංක 9 හි නිවැරදි විසඳුම් 2001 ජුලි 15 දිනට පෙර එවිය යුතු යි.

තරග කූපනය සහ තරග කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

# ප්‍රහේලිකා අංක 11 නිවැරදි විසඳුම් හා ජයග්‍රාණය කළ අයවලුන්

## වයිට් හැකල් ප්‍රහේලිකාව
## අංක 11

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 ග | ජ | 2 බා | | 3 බු | | 4 ඇ |
| වි | | 5 දි | ය | ම | න් | ති |
| 6 ච | 7 න | ය | | ණ | | න් |
| | න් | | 8 කි | ය | 9 ම | න |
| 10 න | දි | ය | | | න් | |
| | මි | | 11 සො | මි | න | ය |
| 12 ප | ත්‍ර | | ලී | | ය | |

***1 වන ස්ථානය***

සෙ/301701 සාසෙ ජයසූරිය එම්ඩීඑස්ජී
රෙජිමුබ ශ්‍රීලපාහ, පනාගොඩ,
හෝමාගම.

***2 වන ස්ථානය***

සෙ/308996 සාසෙම තිලකරත්න ඩබ්එම්ඩී
රෙජිමුබ ශ්‍රීලපාහ
පනාගොඩ - හෝමාගම

***3 වන ස්ථානය***

නි/62604 කපිතන් අනුරුද්ධ පීරිස් ශ්‍රීලපාහ
533 බළේමු බාරේ
කිලාලි - යාපනය

## වයිට් හැකල් ප්‍රහේලිකාව
## අංක 9

තරග කොන්දේසි:

1. ප්‍රහේලිකාව පිටුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරගයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් වලට සාමාජිකයන් හට සහභාගී විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමි කර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙලින් රු. 1000/=, රු. 750/=, රු. 500/= වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ
5. ප්‍රහේලිකා අංක 02 හි නිවැරදි විසඳුම් 1999 දෙසැම්බර් මස 15 දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු එකකට වඩා ඇත්නම් කුසපත් ඇදීමෙන් තෝරාගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි ලබා දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ "වයිට් හැකල් ප්‍රහේලිකා" යන්න හා අංකය ද සඳහන් කරන්න.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
රෙම ශ්‍රීලපාහ
පනාගොඩ කඳවුර, හෝමාගම

## කූපනය

අංකය : ..............................

නිලය : ..............................

නම: ..............................


රාජකාරී ලිපිනය: ..............................

..............................

..............................

ඒකකය: ..............................

හැ.පත් අංකය: ..............................




# ආදර මගේ තාත්තී

නෙත ගලනා කඳුලු මැදින්

අප සැම දෙන නහවාලා

ගිනි අව්යක් දැතට ගෙන

උතුරු බිමේ තල්ගස් යට

රැය නොනිද රට රකිනා ආදර මගේ

තාත්ති

දින සති ගෙවී මාස ගණන්

ගෙදර නොයෙන තාත්තියේ

ඔබ එන මග දැස යොමන්

අම්මා උණු කඳුලලි පිහමින්

බුදු සාදු ළග උදේ හවාවැද වැටෙනවා

ඔබේ නමින් ආදර මගේ තාත්තියේ...

රුපුන් නසා තෙද බල බිඳ

විකුම් සිංහල රජකු වගේ

හෙට දිනයේ...

ගෙදර එන්න ආදර මගේ සුදු තාත්තියේ....

**සෙ/306377 කෝප්‍රල් පත්මසිරිගේ**
**(7 ශ්‍රීලපාහ) එකම දියණිය**
**දිල්කි සංගිත් තිසකුට්ටි**
**බෙලිඅත්ත - පට්ටියවෙල**

# මගේ සෙනෙහස

නිවාඩුවට එනතුරු මම ඇඟිලි ගණන් කර කර නුඹ
මග බලමින් දිවා රෑයේ ලතැවෙන බව මට පෙනුනා
ඊයේ සවස වන විට මම අඩමානෙට ලතැවි ලතැවි
ලා, අඳුරේ සඳ එළියේ දුකෙන් බලන් හිටියා...

ඈ අසලට ගිය විගසින් සතුටින් ඉපිලී දුවවිත්
දෑත් යවා තුරුල්කරන් හාදු දුන්නේ පිස්සී වගේ
හා හා දැන් ඇති කියලා නුඹේ ඔලුව අතගාලා
නුඹත් කැටුව ගෙතුලට ගියේ මගේ හිතත් පිරුන නිසා.

මා අසලම වාඩි වෙලා කකුලේ සපත්තුව ගලවා
කපටි කෙල්ල සැරසෙන්නේ මගේ පපුවේ හිස තියන්න
පපු තුරුලේ හිම හොවාන ආදර හැගුමින් මා දෙස
නෙත් හෙලමින් හනි හනිකට රහසක් කියනවා හෙමිහිට...

පැය කියක් දින කීයක් මාස කීපයක් ඇතුළ
නුඹ උහුලා හිඳි දුක් ගිනි හීන් ඉකිබිඳන් වගේ
පිට මං වෙනවා...
අඩන්නේ ඇයි මැණික මගේ
දැන් මම නුඹ ළඟනේ කියා
නිකට උස්සලා නළලත හාදුව දෙනතුරු ඉඳලා
කඳුළු පිරුණු නෙතින් බලා
පින් පාටට හිනා වෙලා හිතට මගේ
මහමෙර බඳු සෙනෙහස දෙනවා.....

මේ සසරේ නෙමෙයි ඈත භව කථරේ එගොඩේ සිට
අප හමු වී ඇති විලසට
මගේ සෙනෙහස ඔබ වෙනුවෙන්
දේරේ ගලනවා...

**සෙ/308361 සාසෙ දසනායක එම්**
**3 ශ්‍රීලපාහ ඒ කණ්ඩායම, වාවකච්චේරිය**
**යාපනය**

## සේවයේ යෙදී සිටියදී මියගිය අයට ගෞරව දැක්වීම සඳහායි

## IN HONOUR OF THOSE WHO DIED IN SERVICE

1983 වසරේ සිට මව්බිමේ ඒකියභාවය වෙනුවෙන් දිවි පුදකළ ශ්‍රීලපාහ විරෝධාර රණවිරුවන් හට ගෞරව දැක්වීමක් වශයෙන් මියගිය අයගේ නාම ලේඛණය 1999 ජනවාරි කලාපයේ සිට කොටස් වශයෙන් පහත සඳහන් පරිදි පළ කරනු ලැබේ.

| REGT. NO. | | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 1301 | S/301279 | Cpl | Dharmasena NHPK | 3 SLLI | VNA | 15/5/97 |
| 1302 | S/117292 | L/Cpl | Keerthiratne R | 3 SLLI | VNA | 16/5/97 |
| 1303 | S/302441 | Cpl | Lalith DG | 3 SLLI | VNA | 16/5/97 |
| 1304 | S/111675 | Pte | Thilak Kusumsiri | 3 SLLI | Nedunkern | 17/5/97 |
| 1305 | S/303491 | L/Cpl | Bandara KMT | 3 SLLI | VNA | 17/5/97 |
| 1306 | S/119111 | L/Cpl | Dayasiri Herath M | 3 SLLI | VNA | 17/5/97 |
| 1307 | S/303444 | L/Cpl | Bandara WWRR | 3 SLLI | VNA | 17/5/97 |
| 1308 | S/302471 | L/Cpl | Lalith DP | 3 SLLI | Nedunkern | 17/5/97 |
| 1309 | S/304259 | L/Cpl | Piyaratne NPS | 4 SLLI | VNA | 18/5/97 |
| 1310 | S/306608 | L/Cpl | Jayathissa RM | 4 SLLI | VNA | 18/5/97 |
| 1311 | S/300592 | Cpl | Nonis GKNS | 4 SLLI | VNA | 18/5/97 |
| 1312 | S/308318 | L/Cpl | Gurusinghe N | 4 SLLI | VNA | 25/5/97 |
| 1313 | S/303631 | Cpl | Ratnayake RMJ | 12 SLLI | Chavakaccheriya | 31/5/97 |
| 1314 | S/13328 | L/Cpl | Srilal HT | 10 SLLI | Hosp-CBO | 31/5/97 |
| 1315 | S/301153 | L/Cpl | Sumanapala HM | 10 SLLI | At Home on Leave | 3/6/97 |
| 1316 | S/307979 | L/Cpl | Balasooriya BMC | 10 SLLI | VNA | 6/6/97 |
| 1317 | S/13850 | Sgt | Thilakaratne M | 6 SLLI | VNA | 6/6/97 |
| 1318 | O/302523 | Lt | WRPK Rugrogo SLLI | 6 SLLI | VNA | 6/6/97 |
| 1319 | S/307755 | L/Cpl | Rajakaruna RWK | 10 SLLI | VAN | 6/6/97 |
| 1320 | S/304278 | L/Cpl | Perera WR | 10 SLLI | VNA | 6/6/97 |
| 1321 | S/123052 | L/Cpl | Perera KADP | 10 SLLI | VNA | 8/6/97 |
| 1322 | S/30655 | Cpl | Samaraasinghe YR | 10 SLLI | VNA | 8/6/97 |
| 1323 | S/306515 | Cpl | Samarasinghe YRSK | 10 SLLI | VNA | 8/6/97 |
| 1324 | S/304851 | Cpl | Ratnayake RMS | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1325 | S/14352 | C/Sgt | Pathmasiri DGA | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1326 | S/303596 | Cpl | Wijeysiri WM | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1327 | O/300942 | Lt | AM Wijeratne SLLI | 10 SLLI | VNA | 10/6/97 |
| 1328 | S/301990 | Sgt | Ekanayake WM | 7 SLLI | Thandikulam | 10/6/97 |
| 1329 | S/12083 | Cpl | Premalal TMB | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1330 | S/13870 | C/Sgt | Dolawatte D | 10 SLLI | VNA | 10/6/97 |
| 1331 | S/300362 | L/Cpl | Amarawansa HCJU | 6 SLLI | VNA | 10/6/97 |
| 1332 | S/303992 | Cpl | Priyantha LR | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1333 | S/15444 | Sgt | Guruge PD | 10 SLLI | VNA | 10/6/97 |
| 1334 | S/122065 | L/Cpl | Madanayake MKL | 10 SLLI | VNA | 10/6/97 |
| 1335 | S/306971 | L/Cpl | Mahindaratne RP | 10 SLLI | VAN | 10/6/97 |
| 1336 | S/306190 | Cpl | Dissanayake WMN | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1337 | S/306941 | L/Cpl | Wijesinghe KGG | 10 SLLI | VAN | 10/6/97 |
| 1338 | S/303028 | Sgt | Jayaratne BH | 10 SLLI | VNA | 10/6/97 |
| 1339 | S/306902 | L/Cpl | Nimal Indraratne NG | 10 SLLI | VAN | 10/6/97 |
| 1340 | S/308497 | L/Cpl | Anura Bandara WM | 10 SLLI | VNA | 10/6/97 |
| 1341 | S/306952 | L/Cpl | Manchanayake KWA | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1342 | S/302949 | Sgt | Karunathilake NG | 10 SLLI | VNA | 10/6/97 |
| 1343 | S/306953 | L/Cpl | Manchanayake KWA | 10 SLLI | VNA | 10/6/97 |
| 1344 | S/309570 | L/Cpl | Kumarasinghe HPJ | 4 SLLI | Thandikulam | 10/6/97 |
| 1345 | S/306500 | L/Cpl | Rashan SC | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1346 | S/300948 | Cpl | Ranjeewan | 10 SLLI | VNA | 10/6/97 |

| | REGT. NO. | RANK | NAME | UNIT | LOCATION | DATE |
|---|---|---|---|---|---|---|
| 1347 | S/305577 | L/Cpl | Kumarasinghe HPJ | 4 SLLI | VNA | 10/6/97 |
| 1348 | S/306503 | Cpl | Jayarathna MGJ | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1349 | S/304134 | Cpl | Jayasinghe IDM | 10 SLLI | VNA | 10/6/97 |
| 1350 | S/304704 | Cpl | Priyantha WDS | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1351 | S/306598 | L/Cpl | Disanayake RMUS | 4 SLLI | VNA | 10/6/97 |
| 1352 | S/300969 | Sgt | Herath HMSB | 10 SLLI | VNA | 10/6/97 |
| 1353 | S/302995 | L/Cpl | Gamini EHM | 10 SLLI | VNA | 10/6/97 |
| 1354 | S/306985 | Cpl | Piyadasa MGMK | 10 SLLI | VNA | 10/6/97 |
| 1355 | S/305916 | Cpl | Amarasena TWP | 10 SLLI | VNA | 10/6/97 |
| 1356 | S/305901 | Cpl | Ratnayake RKR | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1357 | S/306940 | L/Cpl | Bandara WPLSM | 10 SLLI | VNA | 10/6/97 |
| 1358 | S/23674 | L/Cpl | Premathilake HW | 4 SLLI | VNA | 10/6/97 |
| 1359 | S/303430 | Cpl | Bandara BMA | 10 SLLI | VNA | 10/6/97 |
| 1360 | S/119409 | L/Cpl | Sunil SKK | 10 SLLI | Thandikulam | 10/6/97 |
| 1361 | S/306646 | L/Cpl | Ratnayake RMP | 4 SLLI | Thandikulam | 10/6/97 |
| 1362 | S/306976 | L/Cpl | Premachandra MJA | 10 SLLI | VNA | 10/6/97 |
| 1363 | S/302930 | L/Cpl | Wijeysuriya TPP | 6 SLLI | VNA | 11/6/97 |
| 1364 | S/301110 | Sgt | Chandrasiri HM | 8 SLLI | Chava | 13/6/97 |
| 1365 | S/308303 | L/Cpl | Priyadharsana KDCK | 6 SLLI | VNA | 23/6/97 |
| 1366 | S/306217 | Cpl | Pushpakumara HL | 10 SLLI | VNA | 24/6/97 |
| 1367 | S/13794 | C/Sgt | Chandrasiri HH | 4 SLLI | VNA | 24/6/97 |
| 1368 | S/13449 | C/Sgt | Wasantha KLANK | 10 SLLI | Omanthai | 24/6/97 |
| 1369 | S/307015 | L/Cpl | Rajapaksha TPN | 10 SLLI | VNA | 24/6/97 |
| 1370 | S/305757 | L/Cpl | Uapananda VKS | 10 SLLI | VNA | 24/6/97 |
| 1371 | S/301869 | Sgt | Ranjith KY | 10 SLLI | Omanthai | 24/6/97 |
| 1372 | S/30757 | L/Cpl | Upananda VKS | 10 SLLI | Omanthai | 24/6/97 |
| 1373 | S/302365 | Sgt | Suraweera SAS | 10 SLLI | VNA | 24/6/97 |
| 1374 | S/301568 | L/Cpl | Ranasinghe AKK | 10 SLLI | VNA | 24/6/97 |
| 1375 | S/13622 | L/Cpl | Ratnayake DSK | 10 SLLI | VNA | 24/6/97 |
| 1376 | S/300105 | Sgt | Adikari AIA | 10 SLLI | VNA | 24/6/97 |
| 1377 | O/62951 | Lt | CD Kumarage SLLI | 4 SLLI | Omanthai | 25/6/97 |
| 1378 | S/11206 | WO I | H Wijeratne | 6 SLLI | VNA | 25/6/97 |
| 1379 | S/89690 | L/Cpl | Dilruck BHA | 4 SLLI | VNA | 25/6/97 |
| 1380 | S/301821 | Sgt | Anurathilake KM | 4 SLLI | VNA | 25/6/97 |
| 1381 | S/303302 | Cpl | Disanayake DM | 4 SLLI | VNA | 25/6/97 |
| 1382 | S/307353 | Pte | Premadasa BG | 4 SLLI | VNA | 25/6/97 |
| 1383 | S/302674 | Sgt | Udayakumara PGJ | 4 SLLI | Omanthai | 25/6/97 |
| 1384 | S/306416 | L/Cpl | Wimalasena N | 6 SLLI | VNA | 26/6/97 |
| 1385 | S/307275 | Pte | Gunaratne PWP | 7 SLLI | VNA | 26/6/97 |
| 1386 | S/119369 | Pte | Wasanta Kumara MA | 7 SLLI | VNA | 26/6/97 |
| 1387 | S/9v00055 | Sgt | Dharmapala E | 9(V) SLLI | Peduruthuduwa | 5/7/97 |
| 1388 | S/122507 | L/Cpl | Nimal JM | 1 SLLI | Nedunkarni | 6/7/97 |
| 1389 | S/308527 | L/Cpl | Navaratne AMN | 10 SLLI | VNA | 8/7/97 |
| 1390 | S/14317 | Sgt | Jayaratne SP | 1 SLLI | Welli-Oya | 16/7/97 |
| 1391 | S/116818 | L/Cpl | Jayasinghe MDC | 1 SLLI | Welli-Oya | 16/7/97 |
| 1392 | S/301218 | Cpl | De Silva WRS | 1 SLLI | Wellioya | 18/7/97 |
| 1393 | S/301218 | Sgt | SILVA WRC | 1 SLLI | Wellioya | 18/7/97 |
| 1394 | S/21553 | C/Sgt | Karunadasa A | 2(V) SLLI | HOSP-CBO | 19/7/97 |
| 1395 | S/306557 | L/Cpl | Wickramasinghe WAT | 1 SLLI | WELLI-OYA | 23/7/97 |
| 1396 | S/307159 | L/Cpl | Udugama UKDLH | 1 SLLI | VNA | 24/7/97 |
| 1397 | S/301564 | Cpl | Dayaratne Banda DM | 6 SLLI | BCO | 29/7/97 |
| 1398 | S/300854 | Sgt | Aluthgedara IAK | 1 SLLI | BCO | 1/8/97 |
| 1399 | S/15791 | L/Cpl | Lionel KG | 7 SLLI | EPS | 2/8/97 |

# බක් මහ අසිරිය 7 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව

සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට සංක්‍රමණය වීම හේතු කොට ගෙන වර්ෂ 2002 ක් වූ බක්මස 14 වන දින සිංහල හා හින්දු අලුත් අවුරුදු අසිරිය ශ්‍රී ලංකාව පුරා දසත විහිදෙද්දී 7 වන බළඇණිය , ශ්‍රී ලංකා පාබල හමුදව විසින් 2002 බක් මස 09 වන දින ඉතා උත්කර්ශවත් අන්දමින් බක් මහේ අලුත් අවුරුදු අසිරිය මෙසේ පවත්වන්නට යෙදුණි.

බළඇණිය දනට තනන්කිලප්පු ප්‍රදේශයේ ස්ථානගතව ඇති බැවින් නාවක්කුලිය විදුහල් ක්‍රීඩාංගනයයෙහි පුරා මසකට වඩා අධික කාලයක් තිස්සේ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය පැවැත්වීමට අවැසි කටයුතු, සියලුම නිලධාරීන් හා සෙබලුන් විසින් දිවා රාත්‍රී නොබලා කැපවීමෙන් ලහි ලහියේ සූදනම් කරන ලදි. මෙවර යාපනයේ ස්ථානගතව ඇති බළඇණි වල මෙන්ම ශ්‍රී ලංකාව පුරා විහිදී ඇති කඳවුරු වල පවත්වන්නට යෙදුණු අලුත් අවුරුදු උත්සව වලට වඩා අප බළඇණියේ අලුත් අවුරුදු උත්සවය වෙනස් මගක් ගන්නට යෙදුණි. ඒ ඒ කණ්ඩායම් සඳහා සහ නිවස්නයන් සඳහා වෙනමම විවිධාකාරවූ අලංකාර ගොඩනැගිලි ඉදිකරණ ලදි. අණ සහ පාලන කණ්ඩායම වෙනුවෙන් " ඉටිපන්දමක " හැඩයක් ගන්නා ලද ගොඩනැ ගිල්ලක්ද ඒ කණ්ඩායම සඳහා ප්‍රංශයේ අයිපල් කුලුණෙහි අනුරුවක්ද, "බී " කණ්ඩායම සඳහා අඩි 60 ක් පමණ උසින් යුත් ලන්තෑරුමක හැඩයකින් යුත් ගොඩනැගිල්ලක්ද "සී " කණ්ඩායම විසින් ලොව පුදුම 7න් එකක් වන උත්තරීතර ප්‍රේමයක සිහිවටනයක් ලෙස ඓතිහාසික ටජ් මහළ ද "ඩී" කණ්ඩායම විසින් අඩි 100 ක් පමණ දිගින් යුත් මකරෙකුගේ හැඩය ගත් ගොඩනැගිල්ලක්ද ආධාරක කණ්ඩායම විසින් ලංකාව නිර්මාණය වන පරිදි ගොඩනැගිල්ලක්ද ආරාධිත අමුත්තන්ගේ කුටිය සඳහා නිදහස් චතුරස්‍රයේ හැඩය ගත් ගොඩනැගිල්ලක්ද ඉදිකරණ ලදි.

මෙම ගොඩනැගිලි ඉතා උසස් වර්ගයේ සුපිරි හෝටලයක ඇති පහසුකම් වලින් සමන්විතව නිර්මාණය කරන ලදි. පරිසරයට මුල්තැන දෙමින් ඇදහැලෙන දියඇල්ලක් පොකුණට ගලායන සේ ස්වාභාවික අයුරින් කරන ලද අපූර්වතම නිර්මාණයන් පිටුපස ජාතියට මුල්තැන දෙමින් ජාතික ධජයද , රෙජිමේන්තු වලට මුල්තැන දෙමින් බළඇණි ධජයන්ද, සියළු කණ්ඩායම් නියෝජනය වන පරිදි කණ්ඩායම් ධජයන්ද , එක්තැන් කොට ඉතා දැකුම්කළු මෙන්ම අලංකාර නිර්මාණයන්ද මෙම උත්සවයේ විශේෂ ස්ථානයක් ගෙන එන ලදි. මෙවන් නිර්මාණශීලී බවෙන් යුත් සියලුම ඉදිකිරීම් කටයුතු නිමකොට බක් මස 09 වන දින පෙරවරු වන විට නාවක්කුලිය ක්‍රීඩාංගනය සුවිශේෂ වූ නිර්මාණ රැසකින් සමන්විත විය. අලුත් අවුරුදු උත්සවයක අසිරිය විදහා පාන නාවක්කුලිය ක්‍රීඩාංගනය ඉදිරිපසින් ඒ අසිරිමත් සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයේ පළමු ඉසව්ව වන මැරතන් ධාවන තරගය ඒකකයේ අණදෙන නිලධාරි මේජර් ඊජීපී දූජීව ආර්එස්පී ශ්‍රීලපාහ ගේ ආරම්භක සංඥාවෙන් 0630 පැයට ආරම්භ කරන ලදි. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 52 වන සේනාංකාධිපති මේජර් ජනරාල් ඩීවීඑස්වයි කුලතුංග ආර්එස්පී, යූඑස්පී පීඑස්සී සහ 51 වන සේනාධිපති බ්‍රිගේඩියර් ටීටී ආර් ද සිල්වා ආර්ඩබ්පී, ආර්එස්පී , යූඑස් , පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ක්‍රීඩාංගනය වෙත පැමිණීමෙන් පසු 0930 පැයට ධජ විවෘත කර ක්‍රීඩා උත්සවයේ වැඩ කටයුතු නිළ වශයෙන් ආරම්භ කරන ලදි.

සිංහල චාරිත්‍ර වලට හා සම්ප්‍රදායික ක්‍රීඩාවට මුල්තැන දෙමින් ග්‍රීස් ගහේ නැගීම, කොට්ටා පොර ගැසීම, කණා මුට්ටි බිඳීම, අලියාට ඇස තැබීම, කඹ ඇදීම, පොල්අතු විවීම, පොල්ගැම, මැරතන් ධාවන තරගය, බයිසිකල් ධාවන තරගය, සෙමින් බයිසිකල් ධාවන තරගය, විකට ඇදුම් තරගය බ්‍රේක් ඩාන්ස් තරගය, සැගවුණු අමුත්තා සෙවීම, සිවිල් සේවකයන්ගේ මීටර් 100 දිවීමේ තරගය, බාධක දිවීමේ තරගය, අවුරුදු කුමාරිය තේරීමේ තරගය වැනි තරග රාශියකින් සමන්විත සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය විචිත්‍ර වත් විය. එහිලා ජයග්‍රාහී තරගකරුවන් වෙනුවෙන් සුවිශේෂ වටිනාකමින් යුත් ත්‍යාග පිරිනැමීම ආසේවු (යා) යටතේ පාලනය වන සේනාංකාධිපති වරුන්, බල සේනාධිපති වරුන්, අණදෙන නිලධාරි වරුන් හා පැමිණ සිටි අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතරින් සිදුවිය. කණ්ඩායම් වෙතින් ඉදිකර තිබූ නිර්මාණශීලී බවින් යුත් ගොඩනැගිලි අතරින් හොඳම නිර්මාණශීලී ඉදිකිරීම් තේරීම බලසේනාධිපතිවරුන් අතින් සිදුවූ අතර හොඳම නිර්මාණය වශයෙන් බී කණ්ඩායම විසින් ඉදිකල මහල් 04 කින් සමන්විත වූ ලන්තෑරුම නිර්මාණය තේරුණි. මෙදින දවස පුරාම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ යාපනය පලාලි සේවයේ නිවේදක මහතෙකු වන "ප්‍රදීප්" විසින් නිවේදන කටයුතු මෙහෙයවා ඒ සඳහා මහගු දයකත්වයක් දැක්වීම අවුරුදු උත්සවය සාර්ථක කර ගැනීමට හේතුවක් විය.

පාබල රෙජිමේන්තු 4 වන බළඇණියේ "චතුරංග" අඩි රිද්ම සංගීත කණ්ඩායම විසින් 2000 පැයට පමණ ආරම්භ කරන ලද සංගීත සන්ධ්‍යාව සියලුම නිළයින් නැටුමට හා ගැයුමට යොමුකර මසකට පමණ අධික විඩාබර කාලසීමාවක් තුළදී වෙහෙසට පත්වී සිටි භට පිරිස් සප්ත ස්වර නාද රටා සමගින් සංගීතයෙන් පිනවන්නට සමත් විය.

මෙම අති සාර්ථක බක්මහ උළෙලෙහි දේශීය ස්වභාවික ද බොහෝ දුරට උපයෝගී කරගෙන ඉදිකර තිබූ දැවැන්ත නිර්මාණශීලී හැකියාවන් යාපනය අර්ධද්වීපයේ සිවිල් ජනතාවගේ හා විවිධ ඒකකයන්හි සියලු නිළයින්ගේ ප්‍රසංසනීය මතවාදයට බඳුන් වී ඇති බැව් පැවසීම අතිශයෝක්තියක් නොවේ. තවද මෙහිදී පළමු ස්ථානය හිමි කර ගන්නා ලද "ලන්තෑරුමේ" ආකෘතිය හා දෙවන ස්ථානය හිමිකරගන්නා ලද "ටජ්මහල" තල්ගස් සහ වෙනත් වන දැව වර්ග වැනි ද උපයෝගී කරගනිමින් මහල් කිහිපයකින් යුක්තව නිර්මාණය කිරීම එය නැරඹූ සියල්ලන්ම විශ්මයට පත්කරවන සුළු විය. මෙම බක් මහ උළෙල සඳහා අති විශාල සිවිල් ජනතාවකගේ සහභාගිත්වයක් දක්නට ලැබීම විශේෂයෙන් කැපී පෙනෙන සිදුවීමකි. සිංහල ගතානුගතික චාරිත්‍ර අනුව සියලුම සිවිල් අයවලුන් හට උද දිවා රත්‍රී ආහාරයන්ද සැපයීමට කටයුතු කරන ලදි . මේ තුලින් විවිධ ජාතීන් හි අන්‍යෝන්‍ය අවබෝධය සම්බන්ධතාවය ගොඩ නැගීමට ඉවහල් විය.

සාමයේ අරුණළු වැටී ඇති මෙවන් කාල වකවානුවක් තුලදී දීර්ඝ කාලීන ක්‍රියාන්විතයේ යෙදී සිටි සෙබළුන්ගේ මානසික ඒකාග්‍රතාවය වෙනත් අතකට යොමු කොට ඒකකයේ කණ්ඩායම්වල සිටි සියලු නිළධාරි /සෙසු නිළයින්ගේ සහෝදරත්වය හා සාමූහිකත්වය වර්ධනය කරලීම සඳහා හුදෙක්ම මෙම උත්සවය සංවිධානය කරන ලද අතර, ඉදිරියේදී ද ජාතිකත්වයට මුල් තැන දෙමින් මෙවැනි උත්සව පැවැත්වීම කාලෝචිත යැයි සියලුම භට පිරිස් වල හැඟීම වේ.

"ලැබූ නව වසර සාමය සතුට පිරි නව වසරක් වේවා."

විධායක අධිකාරී
මූලස්ථනය 7 ශ්‍රීලපාහ



52 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩීවයිඑස්වයි කුලතුංග ආර්එස්පී යූඑස්පී පීඑස්සී ආරාධිත අමුත්තන් සඳහා වූ කුටිය වෙත පැමිණීම.අණදෙන නිලධාරි මේජර් ඊඒපී සුජීව ආර්එස්පී ශ්‍රීලපාහ පසෙකින් ගමන් ගනියි.

# 7 ශ්‍රීලපාහ බක්මහ අසිරිය...



කොටු පවුර ඉදිරි පස ශ්‍රීලපාහ ලාංඡනය අලංකාර ලෙස දිස්වූ අයුරු



"ඒ" - කාණ්ඩායම විසින් නිර්මාණය කරන ලද අයිෆල් කුළුනේ ආකෘතිය.



"බී" - කාණ්ඩායම විසින් නිර්මාණය කරන ලද ලන්තෑරුමේ ආකෘතිය.



"සී" - කාණ්ඩායම විසින් නිර්මාණය කරන ලද ටජ් මහල් ආකෘතිය.



"ඩී" - කාණ්ඩායම විසින් නිර්මාණය කරන ලද මකරාගේ ආකෘතිය.

